# සිසිල

සිනුවර සිංහල සාර සංග්‍රහය

බලන්නට නොව කියවන්නට ය!

Sisila Sinhala eMagazine

සිව්වෙනි වෙළුම – සිව්වෙනි කලාපය – දෙසැම්බර් 2024 :: Volume 4 – Issue 4 – December 2024




දිගු හොටක් සහ ඒ සමග ඇති මසුන් ඇල්ලීම සඳහා උපකාරීවන විශාල පැසක් ද හිමි පෙලිකන් ලෝකයේ බොහෝ ප්‍රදේශවල දක්නට ලැබෙන අපූරු පක්ෂීන් විශේෂයකි.  මේ තේජාන්විත පක්ෂීන් අතර, ඕස්ට්‍රේලියානු පෙලිකන් කැපී පෙනෙන්නේ ඔවුන් පියාපත් මීටර් 2.5 ක් පමණ දිගැති ලෝකයේ විශාලතමයන් වන නිසා ය.

ප්‍රමාණයෙන් විශාල වුවත් මිනිසාට උවදුරක් නැති පෙලිකන් පක්ෂීන් බොහෝ විට වෙරළබඩ ජලය මත අලංකාර ලෙස පාවෙමින් සිටිනු දැකිය හැක. මේ ඡායාරූපය ලබාගත්තේ ඕස්ට්‍රේලියාවේ, නිව් සවුත් වේල්ස ප්‍රාන්තයේ මධ්‍යම වෙරළ ප්‍රදේශයේ දී ය.

ඡායාරූපය: රසික සූරියආරච්චි


නිව් සවුත් වේල්ස් හි සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ ප්‍රකාශනයකි

Sisila electronic magazine is published and distributed by the Writers Guild of Sinhalese Cultural Forum of NSW, Australia.

sisila.sangarawa@gmail.com sisilamagazine.blogspot.com ISSN: 2653-2182

# සිසිල - සිනුවර සිංහල සාර සංග්‍රහය

**සිව්වෙනි වෙළුම – සිව්වෙනි කලාපය – දෙසැම්බර් 2024 :: Volume 4 – Issue 4 – December 2024**

## සිසිල පෙළ ගැස්ම


එක් දවසක්, එක් මොහොතක් (කෙටිකතාව) - ඉන්දිකා තිලකුමාර

සූරියවච්චසා (කවි) - චන්ද්‍රවංශ ඥාණසේකර

"හයිරංකාර - බලු ගැත්තර" සංස්කෘතියක ලක්ෂණයක්!

- රසික සූරියආරච්චි

නව රජය මුහුණ දෙන දේශපාලන අභියෝගයක්

- පාලිත ගනේවත්ත

බලාපොරොත්තුවේ අරුණලු (කවි) - නිරන්ජන් සෙල්වදුරේ

අරගලය (කවි) - ලලිත් මල්ලවාරච්චි

අජියාගේ මළගෙදර (කෙටිකතාව) - අනුරුද්ධ වැලිගමගේ

දිරා ගිය මගෙ දෑත සිඹ සිඹ - කරුණාසේන කහටපිටිය

ඔබේ කටහඬ (කවි) - රූපිකා ද සිල්වා

විටමින් නාමකරණය - දයාරත්න වීරසේකර

පළමුවෙනි තැපැල් මුද්දරය (කවි) - නිමල් සේදර

අතීත සුන්බුන් (කවි) - තිමාලි ද සිල්වා

ඇට කෝටු බාස් - ප්‍රියන්ත ෆොන්සේකා

සිසිල ප්‍රහේලිකාව - මලී දිසානායක

සෙනෙහස (නවකතාව) - දීපිකා ශ්‍රියානි සුන්ද්‍රා වඩුගේ

භාවනාව (කවි) - සමන් සහසූරිය

කිඹුලන්ගෙන් ප්‍රවේශම් වෙනු! - අසංක ඉරාජ් ලක්නාථ

මහාරාජා සහ රැජින (පරිවර්තිත කෙටිකතාව)

- හෙල්මලී ගුණතිලක

ජේසු උපතේ අරුත සමරමු (කවි) - ආනන්ද ගුණතිලක

සමිඳුනි (කවි) - ඩී. අමරසිරි ගුණවර්ධන

තැක්න්ස් හරිනී - නිහාල් රූපසිංහ

බණ්ඩා මාමා (කෙටිකතාව) - ශ්‍රීමතී ගනේවත්ත

සිසිල ප්‍රහේලිකාව නොවැම්බර් විසඳුම

හීනයෙන් යථාර්ථයට (කවි) - චන්ද්‍රවංශ ඥාණසේකර

කලාකරුවා යනු? (කවි) - රංජිත් කිරිඇල්ල

සරතයේ පිපුණු මල (කවි) - අසංක ඉරාජ් ලක්නාථ

හුදකලා මහ ගෙදර (කවි) - අමිතා පද්මකුමාරි

ඔබේ කවියේ මා (කවි) - ඉන්දිකා තිලකුමාර

කවුද "මම"? (කවි) - කළණ දිසානායක

නැවතෙමු එක මොහොතක්? (කවි) - අනුරුද්ධ වැලිගමගේ

මා හිරු, මා සඳු (කවි) - ඉන්දිකා තිලකුමාර

ලෝ කට් බ්ලවුස් හෙවත් පෙන්නීම සහ හැංගීම - විදූෂක


## සිසිල සකසුගෙන්

මේ "සිසිල" සඟරාවේ සිව්වෙනි වසරේ සිව්වෙනි කලාපය යි. හුදෙක් සිංහල සාහිත්‍යයේ උන්නතිය සළකා ලේඛකයින්ට තම නිර්මාණ සහ ලේඛන එළිදක්වන්නට මාධ්‍යයක් ලබාදීම මෙන්ම, පාඨකයින්ට හරවත් යමක් කියවීමේ අත්දැකීම ලබාදීමත් පිණිස කිසිදු මූල්‍යමය අරමුණකින් තොරව පවත්වාගෙන යන "සිසිල" සඟරාවට අප තබන හැම පියවරක් ම දිනුමකි.

"සිසිල" සඟරාව කියවන්න. ඔබේ සහෘදයින් අතර බෙදා හරින්න. සඟරාවේ පිටපත් කෙළින්ම ලබා ගැනීමට අවශ්‍ය අයට sisila.sangarawa@gmail.com ලිපිනයට විද්‍යුත් පණිවිඩයක් එවන්නැයි දැනුම් දෙන්න.

සඟරාව ගැන පොදුවේ ඔබේ අදහස් ද, සඟරාවේ අන්තර්ගතව ඇති ලිපි සහ නිර්මාණ පිළිබඳ ඔබේ සුවිශේෂී අදහස් ද, ඔබේ ලිපි, කෙටිකතා සහ කාව්‍ය නිර්මාණ ද එම ලිපිනයට ම අප වෙත එවිය හැක.

ඒ ඒ ලේඛකයින්ගේ ලිපි සහ නිර්මාණ පිළිබඳව පාඨක ඔබේ අදහස් ඔවුන්ට කෙළින් ම ඊ-මේල් මගින් දැනුම් දීමට ද හැක.

වෙබ් අඩවිය:
[sisilamagazine.blogspot.com]

ෆේස්බුක් පිටුව:
[www.facebook.com/SisilaMagazine]

ෆේස්බුක් කණ්ඩායම:
[www.facebook.com/groups/sisila]

ස්තූතියි.

**- රසික සූරියආරච්චි,**
**සංස්කාරක, සිසිල මාසික සඟරාව**

සිසිල කෙටිකතාව

# එක් දවසක්, එක් මොහොතක්

ඉන්දිකා තිලකුමාර



මං ලංකාවෙන් පිටවෙලා ඕස්ට්‍රේලියාවට ඇවිත් මේ වෙන කොට අවුරුදු තිස් පහකට ආසන්නයි. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ අපේ කණ්ඩායමේ සුහද හමුව සඳහා මෙවර තෝරාගෙන තිබුණේ මහනුවර බෙල්වුඩ් ගම්මානය ආශ්‍රිත හෝටලයක් සහ ඉන්පසු රජරට ප්‍රදේශයේ දින තුනක් සංචාරයක්. විශ්වවිද්‍යාලයේ එකම කණ්ඩායමක සිටි සහෘදයන් සමඟ පුරා සතියක් දිවයිනේ විවිධ ප්‍රදේශවල විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙමින් ගතකරන මේ සුහද හමුවට මා සැලසුම් පිඹුරු පත් සකස් කළේ වසරේ මුල දී ම යි. වෙනදාට ඉතා උද්යෝගයෙන් මේ ගමනට මා හා එක්වන මගේ බිරිඳ, ගීතානිට මෙවර ඒ ගැන සිතන්නටවත් ඉඩක් නොලැබුණේ අපේ දියණිය, උදාරි, ඇගේ ප්‍රථම දරු ප්‍රසූතිය සඳහා සූදානම් වෙමින් සිටි නිසයි. ඔවුන් එකිනෙකාව බලා ගනිමින් ප්‍රවේශමට මා එනතුරු සිටිනා බව සක්සුදක් සේ දන්නා නිසා මා මේ ගමනට හිත හදා ගත්තේ හිතේ බරක් නැතිව හරිම සැහැල්ලුවෙන්.

දියණිය, ඇගේ සැමියා සහ ගීතානි මෙල්බර්න් ගුවන් තොටුපොළට මට සමුදීමට පැමිණියා.

“තාත්තිට යන ගමන් කියවන්න,” මැතිව් රයිලිගේ අලුත්ම නවකතා පොත මා අත තබමින් දු උදාරි මා වැළඳ ගනිමින් මට සමු දුන්නා.

“ගිය ගමන් කෝල් කරන්න. බෙහෙත් ටික බොන්න අමතක කරන්න එපා,” සුපුරුදු ලෙස ඇගේ මව්වත් ගුණ විදහාපාමින් ගීතානි පැවසුවා.

ගුවන් යානයට ගොඩවීමට පෙර මගීන් රඳවා තබන පොරොත්තු ශාලාවට මා ඇතුළු වන විටත් විශේෂ අවශ්‍යතා සහිත මගීන් සහ කුඩා දරුවන් සහිත පවුල් යානයට ඇතුළු කරමින් තිබුණා. කළු පාට අඳුරු උපැස් යුවලක් පැළඳ, රෝස පැහැති සැහැල්ලු කුර්තා කබායකින් සහ සුදු කලිසමකින් සැරසුන මගේ වයසේ කාන්තාවක් රෝද පුටුවක හිඳුවා මුලින්ම වාගේ ගුවන් යානය තුළට ඇතුළු කලේ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ විශේෂ සේවා සපයන නිලධාරින් විසින්. ඇය අත රැඳි සුදු සැරයටිය මේ මධ්‍යම රාත්‍රියේත් ඇය අඳුරු උපැස් යුවලක් පැළඳ සිටීමට හේතුව පැහැදිලි කළා.

මා ගුවන් යානයට ඇතුල් වන විටත් ඇය අසුන් ගෙන සිටියා. මට නියමිතව තිබුණේ ඇගේ අසුනට සමීපතම අසුන.

“ලංකාවෙන් ද?”

මා අසුන් ගත් පසු ඇය මා දෙසට හැරී ඇසුවේ සිනාවකින් මුව පුරවා ගෙන. ඇය සිනහ වෙන විට දෙකොපුල් යාන්තමට වල ගැහුණා. ඒ හිනාවේ මොකක්දෝ හුරු පුරුදු කමක් දැනුනත් ඇය කව්රුදැයි එච්චරටම මට නිච්චියක් තිබ්බෙ නෑ.

සිංහල කතා කරන මගියෙකු ළඟ අසුනේ සිටිම ගැන මගේ හිතට ලොකු සතුටක් දැනුණත්, දූ මා අත තැබූ නවකතා පොත මතක් වෙලා ඒ එක්කම පොඩි නොරිස්සුමකුත් හිතට නැඟුණා.

“ඔව්, ඔව්” මං ඒ හැඟීම යටපත් කරගෙන උත්තර දුන්නා.

“මීනා සෙනෙවිරත්න,” ඇය මට ඇගේ සුරත පෑවා.

ඒ නම කන වැකුණු හැටපස් වියැති මගේ හදවත දහඅට හැවිරිදි නව යොවුන් තරුණයෙකුගේ මෙන් ගැහෙන්නට පටන් ගත්තා.

අදටත් අමතක කරන්නට බැරි මීන නෙතු යුගලක් මගේ මනසේ විදුලි කොටමින් පෙරළි කරද්දී, මා ඈ දිගු කළ සුරතේ ඒ දිගු ඇඟිලි මගේ සුරතින් ග්‍රහණය කර ගත්තා. පේන නොපෙනෙන ලා රෝස පැහැ නිය ආලේපනයක් ගැල්වූ ඇගේ ඇඟිලි මනාව නඩත්තු කර තිබුණා.

“ඉස්සර මීනා ටී ද?” මං හිනා වෙලා ඇගෙන් ඇහුවේ ඇය කව්රුදැයි හරියටම අඳුනා ගෙන.

“ටී?” ඇය පෙරළා විමසුවේ දෙබැමත් ඉහළ නංවමින්.

“ටී කියන්නේ ඉතින් තිම්බරු” මං ගානක් නැතිව කිව්වා.

“තිම්බරු... තිම්බරු...” ඇය මුමුණන්නට ගත්තා. “තිම්බරු දියණි...! ඒත් ඔයා කොහොමද ඒක දන්නේ?” ඇගේ මුවෙත් විස්මයක සේයා සටහන් වුණා.

“මීන නයන මට සිත්තම වෙච්චදා
 නෑන ශිව කුලේ සුරියවච්චසා”

“මේ ළඟ දී මට ඔහොම සින්දුවක් ඇහුණා,” මං ඇගේ කණට මුමුණා සිනාවුණා.

මගේ සිනාව ඇයටත් බෝ වෙද්දී ඇය අතින් මුව වසා ගෙන හඬගා සැහැල්ලු ලෙස සිනාසුනා.

“මාව මතකද?” ඒ පාර මම ඇහුවා.

“ඉන්න ටිකක් ම්... ම්... පන්සිළු, නේද? ඇයි මට අමතක? ඒ කාලෙත් ඔයාට ලස්සනට සින්දු කියන්න පුළුවන්නේ?” ඇගේ මුව මඬල පුන්සඳ සේ දිලුණා. උපැස් යුවලෙන් වැසුන මීන නෙතු යුගල මතක් වී මගේ දෑස තෙත්වුණා.

මගේ හිත විදුලි සරක් සේ අතීතයට ඇදී ගියේ ලුම්බිණි රඟහලට. ඔව් තක්ෂිලාවේ අපි සමස්ත ලංකා නාට්‍ය තරගාවලිය ජයග්‍රහණය කළ ඒ විස්මිත රැයට.

එය ගීත නාටකයක්. නමින් “තිම්බරු දියණි”. මීනා වගේ නටන්න පුළුවන් කෙල්ලෙක් තක්ෂිලාවේ, කළුතර දිස්ත්‍රික්කයේ විතරක් නෙමේ මුළු ලංකාවෙම හිටියෙ නෑ කියලයි ඒ දවස්වල හැමෝම කිව්වේ. ඇය වේදිකාවට ගොඩ වුනාම විදුලි සරක් වගේ. ඇයට තිබුණෙ නමට ම ගැලපෙන නෙතු යුගලක්. නැටුමෙන් ම හැඩවුණු මිනිරන් පැහැ සිරුරක්. දණහිසෙන් පහළට ඇල්ලක් වගේ රූරා වැටෙන දිගු වරලසක්. සිනාවෙන විට දෙපැත්තම වල ගැසෙන දෙකොපුලක්.

මීනා කළේ සුරියවච්චසා ගේ චරිතය. හොඳින් ගීත ගායනයට වගේම වෙණ වැයීමේ හැකියාවත් තිබූ නිසා මට ගීත නාටකයේ පංචශිඛ වෙන්න පුළුවන් වුණා.

මගේ නම පන්සිළු නිසා කොල්ලෝ කින්ඩියට කිව්වෙ මට චරිතෙ ලැබුණේ ඒ නිසා කියලා.

චිත්‍රසේන සර් අපේ නැටුම් ගුරුතුමා. සංගීතය ඉගැන්නුවේ කුරුප්පු මිස්. ඒ දෙන්නා නැති වෙලාවට කොල්ලෝ කෙල්ලෝ අපි දෙන්නාට උසුළු විසුළු කළා. මගේ නම් ඒ ගැන කිසිම අකමැත්තක් තිබුණෙ නැහැ. ඇත්තට ම කිව්වොත් මං ඒ විහිළු වලට මාර ආසයි. ඒත් ඉතින් මීනා වෙනස්.

මීනා සුවිනීත විශාඛාවක් වගේ කිසි දෙයක් නොතේරෙන ළඳැරියකගේ චරිතය අපූරුවටම කළා. ඒ “බබා පාර්ටි එක” හැට හතරට දාන්න බැරිවුණු තවත් එක ගෑනු මායමක් කියලා ඒ දවස්වල මට එච්චර වැටහීමක් තිබුණෙ නෑ. කොල්ලන්ව සත පහකට මායිම් නොකරන ඒ ආඩම්බරකාර අංගනාව ඉදිරියේ වචනයක් කතා කර ගන්න බැරිව මං හුඟාක් වෙලාවට ගොළු වෙලා ගියා.

“ඉතින්...” ඇය කතාවට මුල පිරුවා. “ඔයා මෙහේද පදිංචිය?”

ඇගේ කතා බහේ ඉස්සර වාගේ සබකෝලයක් තිබුණෙ නෑ. වයසත් එක්කම අර ඉස්සර තිබුණ සන්නාහ සන්නද්ධ ඇගලුම් පවා බිම තබා ඇති සෙයක් මට දැනුණා.

“අපි ඕස්ට්‍රේලියාවට ඇවිත් අවුරුදු තිස් පහක් වගේ ඇති. අපේ දුවට බබා ලැබෙන්න දවස් හරි නිසා ගීතානිට එන්න විදිහක් නෑ. මං ලඟදීම සීයා කෙනෙක් වෙන්නයි යන්නේ,” මං කිව්වා.

“ඔව් නේ පන්සිළු. මං නම් ඉතින් දැනට ම ආච්චියෙක්. අපේ පුතාට ඉන්නේ නිවුන්නෝ දෙන්නෙක්. අපි හිටියේ නිව්සීලන්ඩ්වල. උපාලි නැති වුනාට පස්සේ මට තනියම ඉන්න අමාරු නිසා මෙල්බර්න් ඉන්න පුතා ළඟට ආවා,” ඇයත් සුහදව විස්තර කිව්වා.

“අනේ මීනා මට හරිම කණගාටුයි. මං ඒ බවක් දැනගෙන හිටියෙ නැහැ.”

“ඉතින් ඔයා මේ හදිසියේ තනිවම ලංකාවට යන්න හිතුවෙ ඇයි?” ඇය ඇහැව්වා.

“හැම අවුරුද්දෙම තියෙනවා අපේ විශ්වවිද්‍යාල කණ්ඩායමේ සුහද හමුවක්. ඒකටත් ඉඳලා, නෑයොත් බලලා, ඉස්කෝලේ පැත්තෙත් රවුමක් ගහලා එන්න හිතාගෙන මමත් යන්නේ මීනා. මං මාසයක් විතර ලංකාවෙ ඉන්නවා. එතකොට ඔයා?”

“නංගි ඒවි මාව ගන්න. අම්මගෙයි තාත්තාගෙයි දානෙටත් සහභාගි වෙලා, දවස් දහයක භාවනා වැඩ සටහනකටත් ඉඳලා, නෑයෝ ටිකත් හම්බු වෙලා යන්නයි මං මේ පාර ලංකාවට යන්නේ පන්සිළු,” ඇය කිව්වා.

ගුවන් සේවිකාව කෑම බෙදා හැරීම ඇරඹුවා. ලොකු බඩගින්නක් නැතිවුණාට උණුවට මොනවා හරි බොන්න තිබුණා නම් හොඳයි කියලා මටත් හිතුනා.

මුහුදු කොළ පාට, මොණර පිල් ඔසරියකින් සැරසුන තරුණිය මීනා ඉල්ලූ පරිදි කෝප්පයකට තේ වත්කර දී ඉන්පසු සීනි කිරි දමා එය සෑදීමට සැරසුනා.

“මට පුළුවන් ඇයට උදව් කරන්න,” මං ගුවන් සේවිකාවට කිව්වා.

“ඔව් දුව. මේ මහත්තයා මගෙන් එක්ක එකම පන්තියෙ හිටි යාළුවෙක්. එයා මට තේ එක හදලා දේවි,” මීනා කිව්වා.

“සීනි?“ මං මීනා ගෙන් ඇසුවා.

"එකයි."

මං තේ කෝප්පේ පිළියෙල කර ඇය අත තැබුවා.

මගේ තේ එක හදන විට, ඇගේ බන්දේසිය මත මා පිළියෙළ කළ දුම් දමන ඇගේ තේ කෝප්පය මට නෙතඟින් පෙනුණා. ඇයට පෙර ඒ කෝප්පය ඉඳුල්කර ඇය අත තබන්නට හැකි නම් යැයි නරුම ආසාවක් එක පාරටම මගේ හිතේ විදුලි කෙටුවා. මං එහෙම කළා කියලා ඇයටවත්, වෙන කාටවත් පෙනෙන එකක් යෑ?

මගෙ හිත අතීතයට දිව ගියා.

දවසක් නාට්‍ය පුහුණුවීම් අතරේ අපිට පොඩි විවේකයක් ලැබුණා. ඒ කාලේ කා අතත් එහෙමකට සල්ලිය බාගෙ ගැවසුණේ නෑ නේ. ඔක්කොම ළඟ තිබුණු සල්ලි එකතු කරලා අපි කිරි පැකට් ගෙනාවා. සල්ලි තිබුණ විදිහට අපට ගන්න ලැබුණේ දෙන්නාට එක පැකට් එකක් වගේ. මම ඔක්කොට ම කිරි පැකට් ටික බෙදලා අන්තිම කිරි පැකට් එකත් අරන් මීනා ලඟට කිට්ටු වුණා.

"ආ... ඔයා බීල දෙන්න," මං කිරි පැකට් එක ඇය වෙත පෑවා.

මීනා පුංචි රෝස පාට බටේ එයාගේ තොල් දෙක අතරට මැදි කර ගෙන උගුරක් දෙකක් බීවා. බිමට නැඹුරුවුණු ඇගේ ඇහි පියන් පත් අග කළුපාට ඇස් පිහාටු දිගට දිගේ දිලුණා.

මගේ හිත කුල්මත් කරමින් ඊළඟ මොහොතේ ඇය කිරි පැකට් එක මගේ අත තිබ්බා.

"ඔයාත් බොන්න ඉතින්, සින්දු කියලා මහන්සි නැතෑ," අර ඇගේ දිදුලන හිනාවත් සමඟම ඇය පැවසුවා.

මං කිරි පැකට් එක අතට ගත්තේ අමෘතේ වගේ. ඇගේ තොල් අතර හිරවෙලා තිබුණ ඒ බටෙන් ම මාත් කිරි උගුරු දෙක තුනක් බිව්වා.

"ආ... ඔයත් තව ටිකක් බොන්න මීනා," මං නැවතත් කිරි පැකට් එක ඇයට දිගු කළා. එකම බටෙන් ඒ විදිහට මාරුවෙන් මාරුවට බොන එක, එක පාරටම අපි දෙන්නා හුගාක් ළංකළා වගේ හැඟීමක් මට ඇති කළා. ඒත් ඒ මිහිරියාවට වැඩි ආයුෂ තිබුණේ නැහැ.

ඊළඟ මොහොතේ දී ඒ ආඩම්බරකාර මොණරි පිට අල්ලෙන් ඇගේ තොල්පට පිහිදා, කොණ්ඩ කරල පිටිපස්සට තල්ලු කරලා, "මට ඇති පන්සිළු ඔයා ඕක බොන්න," කියා පවසමින් ඇගේ යෙහෙළියන් වෙත දිව ගියා.

ඒ වෙලාවෙ කා ගෙන හිටියට මට ඇඩුණේ ගෙදර ගිහිල්ලා නාන්න වත්ත පහළ ළිඳට ගිහින් ළිං පඩියේ ඉඳගත්තා ම යි.

"කෝ ඔයත් ඉතින් කන්න පන්සිළු," මීනා පවසනු මට හීනෙන් වගේ ඇසුනේ යළිත් මා වර්තමානයට ගෙනෙමින්.

කාලය ගෙවිලා ගියා. ඇය නීති විද්‍යාලයටත්, මං ඉංජිනේරු පීඨයටත් ඇතුළු වුණා. ඉඳහිට දවසක මොනවා හරි වැඩකට කොළඹ විශ්වවිද්‍යාලය පැත්තේ ගිහින් ආපහු ගෙදර යන විට එකසිය විස්ස බස් එකක දී මට ඇයව දැක ගන්නට ලැබුණා. ගිනි ගහන මද්දහනෙත් ඒ මීන නෙතු යුග මගේ දෑසේ පැටලෙන විට සීතල දිය දහරකට හසුවෙනවා වගේ මා නිවී සැනහී ගියා. ඒත් බැල්මකට, හිනාවකට වැඩි දෙයක් කවදාවත්ම මට ඇගෙන් ලැබුණෙ නැහැ. ඇය ඇගේ ආරක්ෂක පළිහ හැම විටම පැළඳ ගෙන වගෙයි හිටියේ. ඒ හින්දා වෙලාව අහනවාට වඩා දෙයක් අහන්න මට කවදාවත් ඉඩක් ලැබුණේ නැහැ.

ඇය නීති විද්‍යාලයෙන් පිටවෙලා නීතිඥවරියක් විදිහට රජයේ ආයතනයක සේවයට බැඳුණා. ඉංජිනේරු උපාධිය අවසන් කර මං මහවැලි ව්‍යාපෘතියේ සේවයට ගියා. ඉඳහිට මුණ ගැහුණු මිතුරන්ගෙන් දැන ගන්නට ලැබුණේ ඇය වෛද්‍යවරයෙකු සමඟ විවාහ වන්නට යන බව. මට පුදුමත් හිතුණා. නීති විද්‍යාලයේ අවසන් වසර වන විට වත් ඇයට පෙම්වතෙකු හිටි බවට මට දැන ගන්නට ලැබුණේ නැහැ.

අපිට තමයි ඉතින් ඔක්කොම ආඩම්බරකම්. නාඩි වැටෙනවා නම් ඉතින් කෙල්ලන්ටයි උන්ගේ අම්මලා තාත්තලටයි ඕන දොස්තර කෙනෙක් ඔට්ටුයි. මට හිතුණා. වජිරයාට නම් මඟුලට ආරාධනාවක් ලැබිලා තිබුණා. එදා මීනාගේ මඟුල් දවසේ හැන්දෑවේ "වාසනා" එකේ දී මං වජිර එක්ක වැටෙන්නම බිව්වා.

හදිසි වැඩකට කොළඹ ආපු දවසක එදා උදේ මධ්‍යම තැපල් හුවමාරුවේ පුපුරා ගිය බෝම්බය ගැන අහන්න ලැබුණා.

මීනා නීතිඥවරියක් විදිහට වැඩ කළේ එතැන බව මං දැන සිටියා. කරන්න ආව සියළුම වැඩ දමා ගහලා දාලා මං පිටකොටුවට යනකොටත් එතැන ගොඩනැගිල්ල දුම් දානවා. ආමි එකෙනුයි, පොලිසියෙනුයි හැමතැනම. කැලි බැලි සුන්බුන් අතරේ මොනවා බලන්නද මොනවා හොයන්නද කියලා මට හිතා ගන්න බැරිව ගියා.

කන්තෝරු බෑගයත් අරන් තුන්මුල්ල පැත්තට ඇවිද ගෙන යන සුබේ මාමාව මම දැක්කෙ අහම්බෙන්. සුබේ මාමා වැඩ කළේ මධ්‍යම තැපල් හුවමාරුවෙ කියලා මට ලාවට මතක තිබුණා. එයාගෙන් ඇහුවොත් මීනා ගැන තොරතුරක් දැන ගන්න පුළුවන් වෙයි කියලා මගේ හිත කිව්වා.

මම සුබේ මාමගේ පස්සෙන් දුවලා දුවලා ගිහින් ඔහුගේ අතින් අල්ලා ගත්තා.

"සුබේ මාමා කරදරයක් නෑ නේද?" මං හති හල හලා ඔහුගෙන් විමසුවා.

"පන්සිළු පුතා අද නම් අනූ නමයෙන් බේරුණේ. අපිට හතයි කාලේ බස් එක මග ඇරුණා. එක සීට් එකයි තිබුණේ. අපි දෙන්නා හතයි තිස්පහේ ආවේ. නැන්දා තුම්මුල්ලෙන් බැස්සා, දැන් හොඳටම බය වෙලා ඇති. මං නැන්දාගේ

කන්තෝරුවට යන්න බැලුවෙ පුතා” ඔහු කලිසම් සාක්කුවෙන් ගත්ත අත් ලේන්සුවකින් මුණේ දාඩිය පිහිදාන ගමන් කිව්වා.

“මගෙත් යාලුවෙක් මෙතන වැඩ කළා, අර වැලිවිට තැපල් මහත්තයාගේ දුව මාමට මතක ද?”

“මොකෝ මම නොදන්නේ මීනා දුවව? ඒත් හරියටම නිච්චියක් නෑ දරුවෝ අද හිටිය ද කියලා. මං බස් එකෙන් බහින කොටත් බෝම්බෙ පුපුරලා. කාටවත් ඇතුළට යන්න දෙන්නෑ. තුවාල කාරයෝ ඔක්කොම මහ ඉස්පිරිතාලෙට ගෙනියන්න ඇති,” සුබේ මාමා කිව්වා.

ඒ ගමන මං ඉස්පිරිතාලෙට දිව්වා. තොරතුරක් හොයා ගන්න ලේසි වුණේ නැහැ. කොරිඩෝවල ගාල් කරපු ට්‍රොලිවල, මුහුණ වහපු රෙදි කඩවල් උස්ස උස්සා, ඒ මුහුණ හොය හොයා ගිය හැටි මතක් වෙන කොට අදටත් මට ඉවසුම් නැහැ. හැන්දෑ වෙන කොට දැන ගන්න ලැබුණේ එයා මැරිලා නෑ කියලා විතරයි.

රෝහල් අධ්‍යක්ෂක රාත්‍රී ප්‍රවෘත්ති ප්‍රචාරයේ දී ගණන් හිලවු ඉදිරිපත් කළා. මැරුණු ගාන, රෝහල් ගතකළ ගාන, ශල්‍යකර්මවලට ලක් කරපු ගාන වගේ දත්ත.

දවස් දෙකකට පස්සේ දවාලේ මම ලෙඩුන් බලන වෙලාවට යනකොට උපාලි දොස්තර මහත්තයා මීනාට සුප් පොව පොවා ඉන්නවා දැක්කා. ඇගේ මීන නෙතු යුගල සුදු පාට වෙළුම් පටි වලින් ඔතා තිබුණා. මං එතැනට නොගිහින් ආපසු හැරුණා.

ඊට අවුරුදු දෙකකට විතර පස්සේ වජිරව හදිසියේ හමුවුණු වෙලාවක දැන් මීනාගේ ඇස් දෙකම නොපෙනෙන ආරංචිය ඇහුවාම මට ඇති වුණේ පුදුම වේදනාවක්.

ඒ වෙනකොට මං රැල්ලට වගේ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය කරන්න අයැදුම් කරලයි තිබුණේ. තවත් අවුරුද්දකට විතර පස්සේ මං ඕස්ට්‍රේලියාවට ආවේ රැකියාව කරන කාලේ හඳුණාගත් ගීතානිව කසාඳ බැඳලා මාසයක් යන්නත් කලින්.

“පන්සිළු ඔයා නිදි ද?” ඇගේ සුරත යාබද අසුනේ සිටි මා සොයනු මට දැනුණා. ඒ සුළඟිල්ලකවත් ස්පර්ශයක් ලබන්නට හීන මැවූ යුගය මට මතක් වුණා.

එදා ඇය ගැල්වූ ගෝයා ජැස්මින් පුයර සුවඳ අදත් ඇගෙන් වහනය වෙනවා වගෙයි මට දැනුනේ.

“මගේ නංගී පදිංචිවෙලා ඉන්නේ අපේ මහගෙදර ම යි. දොළොස් වෙනිදා දානෙට වෙලාවක් තිබුණොත් එන්න පන්සිළු,” ඇය මට ආරාධනා කළා.

“ඔයා කැමති නම් භාවනා වැඩ සටහනට යනවාද නැද්ද කියලා එදාට හමුවුණාම කතා කර ගමුකෝ,” ඇය වැඩි දුරටත් පැවසුවා.

තව විනාඩි පහකින් යානය කටුනායක ගුවන් තොටුපොළට ගොඩ බෑමට සූදානම් බව කියවෙන නිවේදනය අපට ඇසුණා.

“ඔයා හමුවුණු එක ලොකු දෙයක් පන්සිළු. මට ඉස්කෝලේ යාලුවෙක් හමු වුනේ අවුරුදු ගානකට පස්සෙ. අද මං හරි සතුටු වුණා.”

අනිත් මගීන් යානයෙන් බැස යන තුරු මා ඇයත් සමගම යානයේ රැඳී හිටියා. මේ එකම එක සුන්දර මොහොත සදා නොමැකෙන ලෙස මතක තබා ගැනීමට මට අපූරු අදහසක් හිතට ආවා.

“මං කියන්නද ඔයාට ඇවිදින්න බැරි අමාරුවක් නෑ නේ. මා එක්ක ඇවිදගෙන යමු. මං උදව් කරන්නම්.”

“ඇත්තටම ද? ඒක හරි ෂෝක්.” ඇගේ මුහුණ සතුටින් දිලුණා.

විශේෂ සේවා සපයන නිලධාරිනිය දැනුවත් කරලා මං මීනා දිහාට හැරුණා.

“හෝව්, හෝව්... පෝඩ්ඩක් ඉන්න,” මං ඇගේ කොණ්ඩ කටුව ගලවලා කෙහෙරැල්ල මුදා හැරියා. ඉස්සර වගේ ලකයක් නොතිබුනාට ඉණ හරියට විතර තිබුණු මුදා හළ කෙස් වැටිය ඇය අතින් සකස් කර ගත්තා.

ඇයගේ වතේ පිළිබිඹුවුණේ හරිම නිදහසක්. ඒ වගේම සාමයක්. හරියටම අර හිර කරලා තියලා මුදා හළ ඇගේ කෙහෙරැල්ල වගේ. අනතුරුව ඇය සුදු සැරයටිය හතරට නැව්වා. ඊළඟට කොණ්ඩ කට්ටයි, සුදු සැරයටියයි දෙකම අත් බෑගයට දාගත්තා.

මගේ ළඟ තිබුණේ පිටේ එල්ලගෙන යන මල්ල විතරයි. මං දකුණතෙන් ඇගේ අත අල්ලා ගත්තා. ඈ මගේ අතේ එල්ලුනේ හරියට ළදැරියක් වගේ.

“අනේ පන්සිළු මං කාලෙකින් මෙහෙම ගිහින් නෑ ඔයාට ගොඩාක් පින්.”

ඇගේ මුහුණේ ලස්සන හිනාවක් ඇඳී තිබුණා. මට ඕන වුනේ ඒ මොහොත පුළුවන් තරම් දීර්ඝ කර ගන්න.

අපි ඩියුටි ෆ්‍රී හරියට එනකොට මං ඉන්ටර්නෙට් එක හරහා ඇණවුම් කළ ජැස්මින් සුවඳ පිරි විළවුන්, ක්‍රීම් සහිත තෑගි පාර්සලය මගේ අතටම ලැබුණා.

“මැඩම්ගේ බෑග් ටික ගත්තාට පස්සෙ අපි මැඩම්ව රෝද පුටුවෙ ඉන්දව ගමු,” මං කිව්වා.

“බලාගෙන පරිස්සමින්” ඇයව රෝද පුටුවෙ ඉන්දවන්න මමත් උදව් වුණා.

ඒ සොඳුරු මොහොත ටිකෙන් ටික අවසාන වෙමින් තිබ්බා.

ඉන් පස්සේ මං තෑගි පාර්සලය ඇය අත තිබ්බා. ඇය එය නැහැයට අල්ලා සුවඳ විඳ බැලුවා.

“පන්සිළු! අනේ ඔයා දන්නෙ කොහොමද මම පිච්ච මල්වලට ආසයි කියලා?” ඈය නැවතත් ඒ සුවඳ විඳ ගත්තා.

“හරිම සුවඳයි! පන්සිළු, අනේ මං හරිම ආසයි මේකට. ගොඩාක් ස්තුතියි,” ඇගේ මුව ප්‍රීතියෙන් දිලුණා.

මටත් නොදැනිම මගේ දෙතොල් ඒ කොපුල මත නැවතුණා. තානය අහිමි වූ වැඩිහිටි කොපුලක මල් පෙත්තක් වන් මෙලෙක මගේ දෙතොලට දැනුණා. ඈය ළඟින් ද මුදු මිහිරි විලවුන් සුවඳක් හැමුවා.

“ඔව් මීනා! හරිම සුවඳයි!” මට කියවුණා.

අත්කරගත නොහැකිවුණු පිච්ච මලක සීමා මායිම් නැතිව විහිදෙන අපූරු සුවඳ මගේ නාස් පුඩු වලටත් දැනුණා.

පංචශිඛට වගේ එකම එක දවසකට විතරක් ලැබුණු මලක ඇසුරත්, එමලේ සිහිල් සුවයෙනුත් මගේ වියපත් හද නිවී සැනහී ගියා.

- **ඉන්දිකා තිලකුමාර** [ithilakumara@yahoo.com]

**පසු සටහන:**

මේ කෙටිකතාවේ අන්තර්ගතයට දීඝ නිකායේ, මහා වග්ගයේ එන සක්කපඤ්හ සූත්‍රයේ සඳහන් “තිම්බරු” දිව්‍යරාජයාගේ “සූරියවච්චසා” නම් දියණිය සහ ඇයට පෙම් බැඳි “පංචශිඛ” පිළිබඳ කථාවේ ඇති සාම්‍යය සලකා ඒ නම් මෙම නිර්මාණය සඳහා යොදා ඇත.

සක්කපඤ්හ සූත්‍රයට අනුව, සක්දෙව්ට බුදුන් දැකීමට සිතක් පහල වී ඒ ගැන කල්තියා දැනුවත් කිරීමට පංචශිඛ එවයි. පංචශිඛ බේළුව පණ්ඩ වීණාව වයමින් තුණුරුවන් ගුණ පිළිබඳව මෙන්ම කාමගුණ පිළිබඳව ද වූ ගාථා ගායනා කළ විට මේ ගාථා කවර කළෙක ගොතා ගත්තේහි දැයි බුදුන් විමසයි. තිම්බරු දිව්‍යරාජයාට දූ වූ සියොලඟ ප්‍රභා විහිදුන හෙයින් සූර්යවච්චසා යයි නම් ලද දිව්‍යාංගනාවක් ගැන ඇති වූ කැමත්තෙන් බේළුව පණ්ඩ වීණාව වයමින් මේ ගාථා ගැයූ බවත්, ඒ අසා ප්‍රීතියට පත් ඇය තමන්ට ඇගේ සමාගමය එක් දවසකට පමණක් ලබාදුන්, ඉන් පසු ඈ හා සමාගමක් නොවූ බවත් පංචශිඛ පවසයි.

---

# සූරියවච්චසා

හරිම් මම ශක්‍ර භවනා
සක් භවනෙ හෝ
නුඹ නොදකිනා
සැනසෙමි ද මම් කෙලෙසා

වයා බේළුවපාණ්ඩු වීණා
මේ ගයන්නේ
ප්‍රේමයයි ම'හද දවනා
මන මෝහිනිය මාගේ
සූරියවච්චසා

සිතුම් ගිජිඳුන් පිපාසිත වී
වියරු දාහෙන් දැවෙනා
මේ ගිම්හාන කාලේ
සියොලඟ ම මා දවනා
රාග ගිනි දැල් නිවනා
සුනිල් දිය වෙන් මාගේ
ප්‍රිය දේහිනී නොපමා

ඉතින් යන්නට බෑ
මනු ලොවින් බෝ එපිටා
නෙක ලන්දු වේ ශක්‍ර භවනා
නුඹ නොමැති සුර ලෝකේ
ඒ සුර සැපත් මට කුමටා?



- **චන්ද්‍රවංශ ඥාණසේකර** [cguoc.gnana@yahoo.co.uk]

# මයිම්මනායේ

**රසික සූරියආරච්චි**

## “හයිරංකාර - බලු ගැත්තර” සංස්කෘතියක ලක්‍ෂණයක්!

මට ලැබුණු ෆේස්බුක් පණිවිඩයක පරිවර්තනය මෙසේය.

රසික අයියේ,
අයියාට මාව මතකද?
මං පේරාදෙණියේ අහවල් බැච් එකේ හිටියේ.
මට නම් අයියාව මතකයි.
අයියාගේ තොරතුරු දන්වන්න.
- මීට අහවලා



මා මේ මා නොදන්නා මගේ “මල්ලී” ගැන විස්තර ෆේස්බුක් ජාලයෙන් ම සොයා බැලූ විට ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උගත් මැව්සුරුවෙක් බව පෙනුණි. නමුත් අවාසනාවකට මෙන් ඔහු ගේ නම සහ ඡායාරූප දුටු මට මා දන්නා කියන කිසිවෙකු සිහි නොවුණි.

ඒ මගේ ප්‍රශ්නයක් නිසා නොව කාලය මැවූ අරුමය නිසා ය. කාලයත් සමග මතකය අමතක වී යයි. නළල පුළුල් වෙයි. කෙස් තුනී වෙයි. හරහට උස යයි.

ඒ කෙසේ වෙතත්, මේ කියන අහවලා එදා අපේ කාලයේ පේරාදෙණියේ සිටියෙකු දැයි මට ඇතිවුණේ සැකයකි. ඒ සැකයට හේතුව නම් අහවලා මා අමතා තිබුණේ මගේ නමින් නොව "අයියේ" කියා වීමයි!

අයියා-මල්ලී (හෝ අක්කා-නංගී) කියා එකිනෙකා ඇමතීමේ විහිළුව අපේ කාලයේ විශ්වවිද්‍යාලයේ නොතිබුණු එකකි. එය පසු කාලයක සිදුවුණු පරිහානියේ ලක්ෂණයක් බව මම පසුව දැන ගත්තෙමි.

අපේ කාලයේ නම් ජ්‍යෙෂ්ඨයින් සහ කණිෂ්ඨයින් වෙනසක් නොමැතිව එකිනෙකා ඇමතුවේ බොහෝ විට මුල් නමිනි. සමහර විට වාසගමෙනි. නැතිනම් ඒ නම්වල කෙටි යෙදුමකිනි. විශ්වවිද්‍යාලයේ වසර දෙක තුනක් අඩු වැඩිව ගතකර තිබීම යමෙකු අයියෙකු හෝ මල්ලියෙකු කරවන හේතුවක් නොවීය.

මා පේරාදෙණියේ කල් ගත කළ වසර හතරයි මාස දෙක තුළ කිසිවෙකුට අයියා හෝ මල්ලී කියා අමතා නැත. ඒ සමගම මා කිසිම සහෝදර ශිෂ්‍යාවකට අක්කා හෝ නංගී කියා අමතා ද නැත. අද ද එසේ ය.

විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨත්වය මත අයියා හෝ මල්ලී කීමේ විහිළුව තවත් රසවත් කරන කාරණයක් නම් උසස් පෙළ තුන්වනවරට සමත් වී එහි එන්නන් ද එහි සිටින නිසා ය.

මගේ සගයෙකුගේ වැඩිමහල් සොහොයුරා විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණේ අපට වසරකට පසුව ය. තවකෙකුගේ වැඩිමහල් සොහොයුරා පැමිණියේ අපට වසර හතරකට පසුව ය.

ඒ අපේ මල්ලිලා ද? අප ඔවුන් ගේ අයියලා ද?

මා සිතන්නේ විශ්ව විද්‍යාලයක හෝ එවැනි උසස් අධ්‍යාපන ආයතනයක ඉගෙන ගන්නා සිසුන් මේ ආකාරයට අයියා-මල්ලී-අක්කා-නංගී සමාජයක් බිහිකරගෙන ජීවත් වීම සමාජ පරිහානියේ ලක්ෂණයක් බවයි.

ඒ සමගම මට පොදුවේ, එනම්, විශ්වවිද්‍යාල සමාජයෙන් පරිබාහිරව, මෙලෙස ද සිතේ.

- ඔබට වඩා වයසෙන් බාල අය ඔබට ඔබේ නමෙන් නොව, අයියා/අක්කා කියා ඔබ ඇමතිය යුතු යැයි ඔබ සිතන්නේ නම් එය හයිරංකාර මානසිකත්වයකි.
- ඔබට වඩා වයසෙන් බාල අයට ඔවුන්ගේ නමෙන් නොව, මල්ලී/නංගී කියා ඔබ අමතන්නේ නම් එය හයිරංකාර මානසිකත්වයකි.
- ඔබට වඩා වයසෙන් වැඩි අයෙකුට ඔහුගේ නමින් නොව අයියා/අක්කා යැයි අමතන්නට ඔබට සිතේ නම්, ඔවුන්ගේ නමෙන් ඇමතිය නොහැකි නම් එය බලු ගැත්තර මානසිකත්වයකි.

ඒ සියලු විකාර හැර දා අවුලකින් තොරව අපට එකිනෙකා නම කියා ඇමතිය හැකි වේ නම්, සමාජයක් ලෙස අද ලංකාව මුහුණ දෙන සමහර ප්‍රශ්න විසඳෙනු ඇතැයි සිතමි.

ඒ මක් නිසා ද යත්, සමානයින් ගේ සමාජයක අන්ධ භක්තිය, ලොක්කන් ඇදහීම, පුද්ගල වන්දනාව, ලොකුකම, දීනකම නැති බැවිනි!

**- රසික සූරියආරච්චි**
[rasika.suriyaarachchi@gmail.com]




# නව රජය මුහුණ දෙන දේශපාලන අභියෝගයක්



ශ්‍රී ලංකාවේ පමණක් නොව විදේශගත ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙකු පවා මේ දිනවල කතාබස් කරන්නේ පසුගිය නොවැම්බර් දාහතරවෙනි දින පැවති මහා මැතිවරණයෙන් ජාතික ජන බලවේගය ලබාගත් ඓතිහාසික ජයග්‍රහණය ගැන ය.

ඕනෑම මහා මැතිවරණයක ජයග්‍රහණයකින් පසුව මෙවන් කතාබහ සුපුරුදු සිදුවීම් වුවත් මෙවර ජයග්‍රහණය ගැන ඇතිවෙන කතාබහේ විශේෂතා කිහිපයක් දක්නට ලැබේ. ලාංකික ජනතාවට 1931 දී ඩොනොමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සර්වජන ඡන්දබලය හිමිවුණු තැන් පටන් මේ දක්වා පැවති මහාමැතිවරණ වලින් තනි පක්ෂයකට මෙතරම් ඉහළ ඡන්ද ප්‍රතිඵලයක් ලබාගැනීමට හැකිවීම වාර්තාගත සිදුවීමකි. සමානුපාතික මැතිවරණ ක්‍රමය හඳුන්වාදීමෙන් පසුව අපේක්ෂකයකු වැඩිම මනාප සංඛ්‍යාවක් ලබාගැනීම ද මෙවර වාර්තා වී තිබේ. මේ සියල්ලටම වඩා ඓතිහාසික ජයග්‍රහණයක් ලෙස සැලකිය යුත්තේ උතුරේ යාපනයේත්, නැගෙනහිර පළාතේත්, කඳුකරයේත් මෙතෙක් දෙමළ දේශපාලනඥයන් නියෝජනය කළ ආසනවල ඡන්දය ලබාගැනීමට ජාතික ජනබලවේගය සමත් වීමයි.

මහ මැතිවරණයකින් ජය ගැනීමේ දී මෙතෙක් කිසිම දේශපාලන පක්ෂයක් ලබා නොගත් ජයග්‍රහණ රැසක් හිමිකරගත් ජාතික ජන බලවේගයේ නැත්නම් මාලිමාවේ නව රජය අභියෝග රාශියකට මුහුණ පා ඇත. ඔවුන් ලබාගත් අති විශාල ජයග්‍රහණය මෙන්ම ඒ ජයග්‍රහණය තුළින් මතු වූ අභියෝග ද අති විශාල ය. නව රජයේ පැවැත්ම හා සාර්ථකභාවය රඳා පවතින්නේ ජනතාව තමන් කෙරෙහි තැබූ විශ්වාසය පළුදු නොකර එම අභියෝගවලට මුහුණ දෙමින් සාර්ථකව එම අභියෝග ජයගැනීම තුළින් ය.

රට වැටී ඇති ආර්ථික අගාධයෙන් මුදා ගැනීමත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග පසුගිය රජය ඇති කරගත් ගිවිසුම් විමසා බලා අදාළ ප්‍රතිව්‍යුහගත පියවර ගැනීමත් , කෘෂිකර්මාන්තය, අධිකරණ පද්ධතිය, රාජ්‍ය ආරක්ෂක සංවිධාන, සෞඛ්‍ය සේවාව, පාසල් හා උසස් අධ්‍යාපන ආයතන ඇතුළු රටේ සියළුම සමාජ සංස්කෘතික ආයතන මුහුණ පා ඇති අසතුටුදායක තත්වයෙන් මුදවා ගැනීමත් එක වසරකින් හෝ දෙකකින් කළ හැකි කාර්යයන් නොවේ. මේ අභියෝග ජයගෙන හොර බොරුවෙන්, දූෂණයෙන්, වංචාවෙන් තොර රාජ්‍ය දේපළ සුරක්ෂිත කරන සමාජයක් යළි ගොඩනැගීම සඳහා මහජන ආකල්පවල ද සාධනීය වෙනසක් ඇතිවිය යුතුය.

උතුරු නැගෙනහිය හා කඳුකරයේ දෙමළ ජනතාව ජාතික ජන බලවේගය කෙරෙහි තැබූ විශ්වාසය නිසා නව රජය දැවැන්ත අභියෝගයකට මුහුණ දී ඇති බව අපේ විශ්වාසයයි.

ජාතික ජන බලවේගය ගොඩනැගුනේ ජනතා විමුක්ති පෙරමුණේ මූලිකත්වයෙන් විවිධ දේශපාලන සංවිධාන හා වෘත්තීය සමිති විසි එකක් සන්ධානගත වීමෙනි. ජනතා විමුක්ති පෙරමුණේ පෙර ක්‍රියාකාරකම් යාපනයේ හා නැගෙනහිර දෙමළ දේශපාලකයන්ගේ දැඩි අප්‍රසාදයට හේතුවිය. ජාතික ජන බලවේගය ලෙස සන්ධානගතවීමට පෙර ජනතා විමුක්ති පෙරමුණ උතුර නැගෙණහිර ඒකාබද්ධ කිරීමටත්, 1987 ඉන්දු-ලංකා ගිවිසුමටත්, පළාත් සභා පිහිටුවීමටත් තරයේ විරුද්ධ විය. ජනතා විමුක්ති පෙරමුණ ප්‍රකට වූයේ සිංහල බහුතරයකින් සමන්විත දේශපාලන පක්ෂයක් ලෙස ය. එහෙත් ජාතික ජන බලවේගයට මෙවර මහා මැතිවරණයෙන් දෙමළ හා මුස්ලිම් ජනතාවගෙන් විශාල ජන වරමක් ලබා ගැනීමට හැකි විය. යාපනය මැතිවරණ දිස්ත්‍රික්කයේ මන්ත්‍රී ආසන හයෙන් තුනක් ම හිමිවූයේ ජාතික ජන බලවේගයට ය.

දශක ගණනාවක් ම දෙමළ දේශපාලන නායකයන් කෙරෙහි විශ්වාසය තබා ක්‍රියාකළ දෙමළ ජනකාය මෙවර ජාතික ජන බලවේගය කෙරෙහි දැවැන්ත විශ්වාසයක් තැබුවේ කුමක් නිසා ද? දශක ගණනාවක් තිස්සේ තමන්ගේ බලාපොරොත්තු හා අපේක්ෂාවන් ඉටුකිරීමට තම නායකයන් අසමත් වුයේ යැයි දෙමළ ජනකාය සිතන්නේ

ද? තවමත් කතාබහට ලක්වන ශ්‍රී ලංකාවේ සුළු ජාතික ප්‍රශ්නය හා ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම සඳහා දෙමළ නායකයන් අසමත් වී ඇතැයි දෙමළ ජනකාය සිතන්නේ ද? දෙමළ නායකයන් අසමත් වූ දේශපාලන ගැටළු විසඳීමට ජාතික ජන බලවේගයට හැකිවනු ඇතැයි දෙමළ ජනකාය විශ්වාස කරන්නේ ද?

මහා මැතිවරණයටත්, ජනාධිපතිවරණයත් පෙර වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක යාපනයේ සංචාරය කර දෙමළ නායකයන් සමග විවිධ සාකච්චා පැවැත්වූ බව අපි දනිමු. ජනපතිවරණයට මාස කිහිපයකට පෙර වත්මන් ජනාධිපතිවරයා ඉන්දියාවේ සංචාරයකට ගොස් ඉන්දීය නායකයන් සමග සාකච්චා පැවැත්වූ බව ද නොරහසකි. මේ ගමන්වල දී දෙමළ ජනතා අපේක්ෂාවන් ඉටුකිරීමේ අරමුණෙන් කිසියම් සම්මුතිවලට එළඹුනේදැයි අපි නොදනිමු.

මේ වසර අවසාන වීමට පෙර නව ජනාධිපතිවරයා ඉන්දීය සංචාරයක නිරතවන බව කැබිනට් ප්‍රකාශක විජිත හේරත් ඇමතිවරයා පසුගියදා හෙළිදරව් කළේය.

යාපනයේත්, නැගෙනහිර බොහෝ ප්‍රදේශවලත් දෙමළ ජනකාය මෙතෙක් විශ්වාසය තැබූ දෙමල පක්ෂ හා දෙමළ නායකයන් අතහැර ජාතික ජන බලවේගය කෙරෙහි තැබූ දැඩි විශ්වාසය නව රජයට මුහුණ පෑමට සිදුවන විශාලතම දේශපාලන අභියෝගය විය නොහැකි ද?

- **පාලිත ගනේවත්ත** [pganewatta@gmail.com]

# බලාපොරොත්තුවේ අරුණලු



දුන් මුත් නිහඬ චන්දය
බලව එහි ආනිසංසය
සිව් දෙසින් ගලා ගිය
එකම සොඳුරු සංගීතය

මහ ජන හඬින් යාකර
උතුර, නැගනහිර
දකුණ සහ බටහිර
සමගින් සිසිල් කඳුකර

යහපත් වෙනසක් පතා ඉඳුරා
පුරවර ගම් දනව් සිසාරා
ජන හඬ, ජල කඳ ගලා උතුරා
එකමුතුවේ කිරි සයුර කරා

ලියලා පුනරුදයක ලා දලු
වලලා ජාතිවාදී ගිනි සිළු
ඒ කිරි සයුර පරතෙරෙන් දිස්වේ
බලාපොරොත්තුවේ අරුණලු!

- **නිරන්ජන් සෙල්වදුරේ**
[jn.selvadurai@gmail.com]

# අරගලය



නගරයේ හැම තැන කලබලයෙන්
මාර්ග බාධක හතර වටෙන්
පොලිසිය හමුදා වියරුවෙන්
ජන හඬ නැගුනේ සෑම දෙසින්

දශක හතක දුක් ගිනි නිමවා
සැවොම පැතුවේ වෙනසකිය එදා
අනාගතය දරුවනට සදා
රට දැය රැක ගැනුමට වෙරදා

ජාති භේද ආගම් දුරලා
යුක්තිය සාධාරණය පතා
රටට ම එක නීතියක් පතා
මුන් නැගු හඬ උන් මවිත කළා

- **ලලිත් මල්ලවාරච්චි** [lmallawa@gmail.com]



සිසිල කෙටිකතාව

# අජියාගේ මළගෙදර

**අනුරුද්ධ වැලිගමගේ**



“හංසි, මට හදිසියේ මාතර මලගෙදරක යන්න වෙලා. වැඩ ඇරිලා මං ඒ ගමන් ම යනවා. තව ටිකකින් මං රත්නායක ගෙදරට එවන්නම්. එයාගේ අතේ මට ඇඳුම් එවන්න පුළුවන් ද?” ශ්‍රීමන්ත නිවසට ඇමතුමක් දී බිරිඳට කිව්වා.

“කාගෙද අප්පේ ඔය මළගෙදර, ඔය තරම් හදිසියකින් යන්නේ?” කොහොමටත් නෝනලගෙ ප්‍රශ්න වල ඉවරයක් නැහැනෙ.

“අජියා ගේ” ශ්‍රීමන්ත කෙටියෙන් කිව්වේ සංවාදය නිමා කරන්න.

“අනේ මන්දා, මට නම් සමහර ඒවා තේරෙන්නෙත් නෑ. කාලයක් හොඳම යාළුවා ලු, දැන් තරහයි ලු. හ්ම්… එවන්නම්… එවන්නම්… ඕගොල්ල කාර් ඩ්‍රයිව් කරන්න එපා. රත්නායක හරි පෙරේරා එක්ක හරි යන්න.”

ශ්‍රීමන්තට හිතුණෙ ඒ අදහස නම් හොඳයි කියලා. “ගෑනුන්ගේ මොලේ හැඳි මිටේ තරමට දිගයි කිව්වට ප්‍රායෝගිකව සමහර වෙලාවට ඒගොල්ලො හිතන දේවල් හරි වටිනවා. එතකොට එනකොට අඩු ගානෙ පොඩ්ඩක් නිදා ගන්නවත් පුළුවන් නේද?” ශ්‍රීමන්තට හිතුණා.

ශ්‍රීමන්තට පණිවිඩය දුන්නේ ජනක. ක්‍රිෂාන් යනවද දන්නෙත් නෑ? ශ්‍රීමන්ත දෙන්නට කෝල් කළා.

“හරියට පහ වෙනකොට අපේ ඔෆිස් එක ගාවට වරෙන්. වාහන පාක් කරලා මගේ කාරෙකෙන් යන්න පුළුවන්. අපි අද රෑ ම ආපහු එනවා.”

අජිත් වසන්ත මුතුකුමාරණ. බාලංශේ ඉඳන් සාමාන්‍ය පෙළ වෙනකම් ශ්‍රීමන්තට හිටපු හොඳම යාළුවා අජිත්. දැන් අවුරුදු විසි හතක්ම දෙන්නගෙ ඇයි හොඳයියක් තිබ්බේ නෑ.

මීටින්, රිපෝට් මැද්දෙ පැය දෙකක් ගෙවිල ගියා. හරියට හතර හමාරට ෆෝන් එකේ එලාම් එක කිවුවෙ දැන් ලෑස්ති වෙන්න කියලා. රත්නායක ඇඳුම් අරගෙන එන ගමන් වාහනේට ෆුල් ටැන්ක් තෙල් ගහගෙන ඇවිල්ල තිබුණා. පහ වෙනකොට ජනකත් ක්‍රිෂානුත් ආවා. හෙට වැඩ දවසක් හින්දා උන්ටත් අද රෑම එන්න ඕනැ ලු. කට්ටිය ම ශ්‍රීමන්තගේ වාහනයට නැග්ගා. පොල් කටු අඟුරු පිටරට යවන ජාත්‍යන්තර සමාගමක ප්‍රධාන තිලයක් දරන ශ්‍රීමන්තට රියැදුරෙක් එක්කම සීමාරහිත ඉන්ධන දීමනාවක් සහිත වාහනයක් ලැබිලා තියෙනවා.

රත්නායක වාහනේ එළවනවා. කට්ටියම කතාවට වැටුණා.

“උඹ මළ ගෙදර යනවා කිව්වම මට නම් පුදුමත් හිතුණා. ඌ මැරුණත්… ඌව බලන්නේ නැහැ කියල නේ උඹ පහුගිය කාලෙ දිගටම කිව්වෙ” ඒ ජනක.

“අජියා ලිවර්පූල්වල ඉන්නවා කියල නේද උඹ කිව්වේ?” ක්‍රිෂාන් ඇහුවේ ජනකගෙන්.

“ලිවර්පූල්වලවල තමයි හිටියේ. නිරූපාගේ කොන්දේ අමාරුවකට බෙහෙත් කරන්න කියලා සිංහල වෙද මහත්තයෙක් ගාවට එක්කගෙන ඇවිත්. දුවයි පුතයි එහේ. උන් දෙන්න විතරයි ඇවිත් තියෙන්නේ.”

“එතකොට අජියා නැතිවෙලා තියෙන්නේ?” ශ්‍රීමන්ත ඇහුවා

“පඹුරන හන්දියේ දී කන්ටේනරයක හැපිලා තියෙනවා, මතකද අර අවුරුද්දකට සැරයක් බිල්ලක් ගන්න වංගුව?”

“වඩ්ඩට කරපු වැඩේට නං යාළුවො අජියට සමාව දෙන එකක් නෑ නේද?”

“ඒ මොකක්ද බං ඒ?”

“උඹ තොත්ත බබා, මුකුත් දන්නෙම නෑ,” එතකොට මැද්දට පැන්නෙ ජනක.

“අඩෝ ශ්‍රීමන්තයා ඒවා දන්නේ නෑ බං. ඌ අජියා ගැන ඩෝන්ට් කෙයාර් එකේ නෙ හිටියෙ. අනිත් එක ඔය ලොකු කොම්පැනිවල ලොක්කෝ ප්‍රාදේශීය ප්‍රශ්න හැන්ඩ්ල් කරන්නේ නෑ නේ. උන් කරන්නේ ඉන්ටනැෂනල් ඩීල්, ඉන්ටනැෂනල් ඩීල්.”

"ඇත්තටම මචං මං ඒ ගැන දන්නේ නෑ. මොකද්ද අජියා වඩ්ඩට කළේ?"

"ඔන්න හොඳට අහගනින් එහෙනම්."

"සර්, අපි වැලිපැන්නේ පොඩ්ඩක් නවත්තලා යනවද?" රත්නායක අහනකොට තමයි කට්ටියම දන්නෙ සෑහෙන දුරක් දක්ෂිණ අධිවේගේ ඇවිත් කියලා. කට්ටියම තේ එහෙම බීලා, ටොයිලට් ගිහිල්ලා ආයෙමත් වාහනයට නැග්ගා.

"උඹ දන්නවනේ අර සිගරට් ඩීලර්ෂිප් එකයි, ෂෙඩ් එකයි, මාතර කොළඹ ඉන්ටසිටි බස් ටිකයි කළේ වඩ්ඩ කියලා."

"ඔව්, ඌ ඒක තාත්තා වගේ ම හොඳට කළා නේ?"

"ඉතින් යාළුකමට අජියට තමයි බැංකු සල්ලි එවන්නේ."

"ඉතිං ඕක සාමාන්‍ය දෙයක් නේ."

"සාමාන්‍ය දෙයක් වෙන්නේ ඒවා හරියට එකවුන්ට් එකට ගියා නම් නෙ. හැබැයි වෙලා තියෙන්නේ කොටසක් අජියාගේ එකවුන්ට් එකට ගිය එකයි."

"යකෝ... එහෙම උනොත් මාසෙ අන්තිමට එන ස්ටේට්මන්ට් වලින් ඒවා පේනවනෙ. ඒ වගේම බැරිවෙලාවත් හෙම චෙක් රිටන් වුනොත්?"

"ඒවා ඔක්කොම බැංකුවෙ හැන්ඩ්ල් කරෙ අජියා නේ. ඌ ලස්සනට ගේම ගහල තියනව. උඹ දන්නවද දන්නෑ අජියට තිබුණා කමියුනිකේෂන් එකක්. එතන ටයිප්-සෙටින්, පෝස්ටර්, බැනර් එහෙමත් කරා. පැය විසිහතර ම ඇරලා. තුන් හතර දෙනෙකුත් වැඩකලා මයෙ හිතේ. රෑට මූ හොර ස්ටේට්මන්ට් හදලා ලස්සනට වඩ්ඩට යවලා. ඒ වගේ තිබුනෙ ඇත්ත බැලන්ස් නෙමෙයි."

"ඉතිං කොහොමද ඕක මාට්ටු උනේ?"

"අජියා එංගලන්තෙ ගියාට පස්සේ, මෙන්න වඩ්ඩට හරි ස්ටේට්මන්ට් එන්න ගත්ත ලු. එකවුන්ටන්ට් තමයි වඩ්ඩට පෙන්නල තියෙන්නෙ. වඩ්ඩට හොඳටම තරහ ගියා ලු. මොකද වඩ්ඩයි, දීලයි තමයි අජියාව එයාපෝට් ඇරලලා තියෙන්නෙත්."

බැංකුවේ හෙඩ් ඔෆිස් එකට ගිහින් කම්ප්ලේන් කරා ලු. බැංකුවට විරුද්ධව නඩු දානවා කිව්වම බැංකුව අජියාගේ අකුරැස්ස පාරේ තිබුන මෝගේජ් කරපු ඉඩමක් වඩ්ඩට දීල වැඩේ ගොඩින් බේරගත්ත ලු."

"අජියා කොච්චර හොඳට හිටපු එකෙක් ද, මතකද අසූහතේ දී ඌට පොලිසියෙන් ගහපු වෙලාවෙ අපි කොළඹ ආපු හැටි. අයුක්තියට අසාධාරණයට එරෙහිව හිටපු එකා."

"ජනක සර්, මලගෙදර යන්න කලින් වයින් ස්ටෝස් එකට යන්න ඕන කියල කිව්ව නේද?" රත්නායක ඇහුවේ හයිවේ එකෙන් ගොඩගම පැත්තට හරවන ගමන්.

"හ්ම්," ජනක හෙමිහිට කිව්වේ තමන් වරදක් කළා වගේ.

බෝතල් කීපයක් වාහනේට දාගත්ත කට්ටිය මලගෙදරට සේන්දුවුණා.

"දැන් ඉතින් ශ්‍රීමන්ත මහත්තය මූඩ් ගහනවා එහෙම නෙමෙයි," ක්‍රිෂාන් කිව්වේ අවවාදයක් දෙන වැඩිහිටියෙක් වගේ.

කට්ටිය මළ ගෙදරට එනකොට අටට විතර ඇති. මාතර ජීවත්වෙන යාළුවෝ කීප දෙනෙකුත් එතැන හිටියා.

කට්ටියම අජියගේ දේහය ගාවට ගියා. සෑහෙන්න වෙනස් වෙලා. ඉවරයක් නැතුව කථා කරන අජියා, කතා නැතුව ඔහේ ඈත බලාගෙන ඉන්නව දකිනකොට ශ්‍රීමන්තට ගොඩක් දේවල් හිතට ආවා. "අවුරුදු දහයකට වැඩි කාලයක් එකට දුක සැප බෙදාගත්ත අජිත්ට මැරෙන්න ඉස්සෙල්ල වචනයක් කතා කරන්න බැරි උනානෙ," ශ්‍රීමන්ත තමන්ටම කියා ගත්තා.

"නැන්දේ මේ අජිත් අංකල්ගේ යාළුවො වගයක් ඇවිත්."

සාරියෙන් කඳුළු පිහදමින් නිරූපා ගෙදර ඇතුළු කාමරයකින් එළියට එන හැටි ශ්‍රීමන්ත දුටුවා.

"අනේ නිරූපා හොඳටම ඇදිලා ගිහිල්ලා. කම්මුල් වල ගැහිලා. හරිම වෙහෙසකර බවක් තමයි මූණේ තියෙන්නෙ. ඉදිච්ච කෙස් ගස්, එදා උසට තිබුණු පියයුරුත් වැහැරිලා. වයසට ද, දුකට ද කියල හිතාගන්න බැහැ. වෙනදා හරි පිළිවෙලට ලස්සනට අඳින එයා අද සාරිය ඇඳල තියෙන්නෙත් හරිම කලබලෙන් වගේ. කොහොමට හිටපු කෙනෙක්ද?" ශ්‍රීමන්තට හිතුණා.

බිම බලාගෙන සාරියෙන් කඳුළු පිහදාමින් පැමිණි නිරූපා හිස ඔසවා අමුත්තන් දෙස බැලුවා. ඇගේ දෙනෙත් විශාලවුණේ හොල්මනක් දුටුවා වාගෙයි. බලාපොරොත්තු නොවූ පුද්ගලයෙක් උසට උසේ ඇය අබියස හිටගෙන හිටියා.

"ශ්‍රීමන්ත... ශ්‍රීමන්ත මෙහෙ...?"

"එදා වගේම ජෙල් ගාල පිළිවෙලට පීරූ හිසකෙස්, හිනාවෙන් පිරුණු මුහුණ, කඩවසම් පෙනුම පොඩ්ඩක්වත් අඩුවෙලා නැහැ. කළුපාට කෝට් එක. පිළිවෙලට මැද තිබෙන කමිසය, ටයි පටිය. එදාටත් වැඩිය ලස්සනද මන්දා," නිරූපා නැවතත් ඇස් පිසදා ශ්‍රීමන්ත දෙස ආයෙමත් බැලුවා.

"මම නම් හිතුවෙ ජීවිතේට කවදාවත් මට එයාව දකින්න බැරි වේවි කියල" නිරූපා තමන්ටම කියාගත්තා.

මොකක්දෝ කියාගන්න බැරි සියුම් වේදනාවක් ඇගේ සිත තුල නලියන්නට වුනා. ජීවිතේ හැටි!

ශ්‍රීමන්තත් ඇහිපිය නොහෙලා නිරූපා දෙස බලා සිටියා.

“උඹට මේක මළ ගෙදරක් කියලත් අමතකයි වගේ,” ඒ වෙනස දැකපු ක්‍රිෂාන් ශ්‍රීමන්තගේ අත මිරිකුවා.

නිරූපා ශ්‍රීමන්තලගෙ ගාවට ගියේ පාවෙලා වගේ. ක්‍රිෂාන්ට, ජනකට අත් එක්කර ආචාර කළා.

ශ්‍රීමන්තට ආයුබෝවන් කියන්න කලින් ආයෙමත් විනාඩියක් විතර මූණ දිහා බලාගෙන හිටියා. අමාරුවෙන් අත් එකතු කරලා ශ්‍රීමන්තට ආයුබෝවන් කිව්වා.

“ඉන්න බොන්න මුකුත් අරන් එන්නම්,” නිරූපට වචන ගැටගහ ගන්නත් ටික වෙලාවක් ගියා. අනතුරුව ආපසු හැරී ගෙතුලට ගමන් කලේ ඉක්මන් අඩි තබමින්.

කවුරුත් පසෙක තිබූ පුටුවල හරිබරි ගැහුනා.

“මේ උඹ මූඩ් ගහනවා එහෙම නෙවෙයි. මේක මළ ගෙදරක්,” ජනක ශ්‍රීමන්තගෙ කණට කරලා කිව්වෙ විහිළුවෙන් වගේ.

“උඹට මළ පැනල හිටපු විදිහට මං නම් හිතුවෙ උඹ තාමත් අජියත් එක්ක තරහයි කියලා. හොඳම යාළුවා වගේ ඉඳලා උඹේ කෙල්ල පැහැරගෙන ගියාම තරහ නොගියොත් තමයි පුදුමෙ,” ක්‍රිෂාන් කියවගෙන ගියා.

“දැන් අපි ඔක්කොම ලොකු ළමයි ඉන්න මිනිස්සුනේ මචං. මං හිතන් හිටියේ ඔය පරණ තරහ මරහ අතෑරලා ඌව හම්බවෙච්ච වෙලාවක කතා කරන්න කියලා,” ශ්‍රීමන්ත තැන්පත් විදිහට කිව්වා.

නිරූපගේ අයියා පළාත් සභා ඇමති නල්ලපෙරුම ශ්‍රීමන්තව පැත්තකට අඬගහගෙන ගියා.

“ඔබතුමන්ලා දැන් ඉතින් දකින්නවත් නෑ නේ මාතර පැත්තෙ. වතාවක් මම ඔෆිස් එකේ දී හම්බවෙන්නත් හැදුවා. සෙක්‍රටරි කිව්වා ඔබතුමා ඒ දවස්වල තායිලන්තෙ ෆැක්ටරි එකේ කියලා.”

ටිකකින් නිරූපා ඇවිත් “කෑම ටිකක් කාල යන්න,” කියලා කිව්වම ක්‍රිෂාන් ජනකගේ ඇඟට අනිනවා ශ්‍රීමන්තට පෙනුනේ පැත්තකින් හිටපු හින්දා. ඒ දෙන්න පැත්තකට ගියේ නිරූපා ට කතා කරන්න ඉඩ දීලා.

“අජී ඔයාව හම්බවෙන්නමයි හිටියේ. ඒත් කොහෙද හිතුවේ නැති වෙලාවක එයා අපිව දාලා ගියා..,” නිරූපා හැඟුම්බරවුණා.

“මමත් එහෙමම තමයි හිතන් හිටියේ දැන් අපි තරුණ ළමයි ඉන්න දෙමව්පියො නෙ,” ශ්‍රීමන්තට කියවුනේ ඉබේටම.

කෑම කාලා කට්ටියම මල ගෙදරින් ආපසු යන්න සූදානම්වුණා.

“ශ්‍රීමන්තට පුළුවන් නම් හත්දවසෙ දානෙටත් ඇවිත් යන්න,” නිරූපා කිව්වා.

එයා ගියපු ගමන්ම ජනක ළඟට ඇවිල්ල කිව්වේ “මේ පරණ යාළුකං අලුත් කර කර ඉන්න ඕන නෑ, පින් සිද්ධවෙයි උඹට පුළුවන් දෙයක් කරලා කොළඹට වෙලා හිටපන්,” කියලයි.

“දැන් වෙලාව නමය හමාරයි. යන්තම් හයිවේ එක හින්දා රෑ වෙනකොට ගෙවල්වලට යන්න පුළුවන්. ඉස්සර නං ඉතින් පැය කීයක් යනවද? ඒත් ඉතිං සමහරු විරුද්ධ උනා නේ රටේ සල්ලි කන වැඩ කියලා,” ජනක කිව්වෙ කතාව වෙන පැත්තකට හරවන්න වගේ.

“ශ්‍රීමන්ත දන්නවද? අද මට පොඩි නල්ලේ අමුතු කතාවක් කිව්වනේ.”

“ඒ මොකද්ද?”

“ඌ ඇහැව්වා මං දන්නවද උගේ අක්කව අජියට සෙට් වුණේ කොහොමද කියලා. මං නෑ කිව්වාම ඌ කියපි ඒක ඒක ජීවිත පරිත්‍යාගයක් ලු!”

“ජීවිත පරිත්‍යාගයක්” ශ්‍රීමන්ත පුදුමයෙන් ඇහුවා.

“ඔව් ඒක ජීවිත පරිත්‍යාගයක් ලු!”

“උඹලගෙ තාත්තලා උඹලා අරන් කොළඹට අභිනිෂ්ක්‍රමණය කළාට අසූඅටේ අසූනමයේ අපි කාපු කට්ට දන්නෙ අපි විතරයි නේ”

“අජියා තදේට දේශප්‍රේමී කණ්ඩායම එක්ක වැඩ කළා. ඌට සෑහෙන කනෙක්ෂනුත් තිබුනා. අපි බයෙන් හිටියේ ඔය ප්‍රා හරි, කළු බළල්ලු වගේ කවුරු හරි ඌව උස්සන් යයි කියලා. යන්තම් උන්ගේ තාත්තා බෙරගලට යවල තමයි උගෙ ජීවිතය බේරගත්තෙ.”

“එතකොට මොකක්ද අජියා කරපු ජීවිත පරිත්‍යාගය?”

“උඹ දන්නවනේ නිරූපගෙ තාත්තා තමයි නාගරික මන්ත්‍රී උපසේන නල්ලෙපෙරුම. දේශප්‍රේමී කණ්ඩායම එයාව මරන්නයි හිටියේ. ලියුම් කීපයක් එවල තිබුන ලු. දන්නවද, ඒක නවත්තල තියෙන්නේ අජිය ලු. දවසක් නිරූපා අජිත්ට වැඳලා කිව්වලු අජිත් ඔයාට විතරයි මේක කරන්න පුලුවන්, කොහොම හරි මට මේ උදව්ව කරන්න කියල.”

“ඉතින්?”

“ඉතින් කියන්නෙ. දේශප්‍රේමීන් උපසේන මන්ත්‍රීතුමාට වෙඩි තිබ්බේ නෑ!”


- අනුරුද්ධ වැලිගමගේ

[anuruddhawe@yahoo.com]



සිසිල ගැන ඔබේ අදහස් දැන්වීමට

ඔබේ නිර්මාණ එවීමට

sisila.sangarawa@gmail.com

සිසිල පිටපත් ලබා ගැනීමට

අනුග්‍රාහක දැන්වීම් සඳහා

## සුභාවිත ගී රස විඳීමට අත්වැලක්

කරුණාසේන කහටපිටිය

# දිරා ගිය මගෙ දෑත සිඹ සිඹ

ගීපද රචනය: ප්‍රීති රන්දෙණිය
සංගීතය: නවරත්න ගමගේ
ගායනය: සුනිල් ඉදිරිසිංහ

දිරා ගිය මගෙ දෑත සිඹ සිඹ
මාත් අරගෙන යන්න කිය කිය
ආදරෙයි මං ආදරෙයි,
ආදරෙයි මං ආදරෙයි
කියනු පුදුමය එදා විලස ම
වියෙන් වැහැරුණු උර තලාවේ
හිස හොවා ඔබ හෙළන කඳුළැල්
පිසින්නට මට වාරු නැත
සොඳුරේ
මතු බවේ හමුවෙන්න පැතුමින්
මිදෙනු ඔබ ලසොවින්
මිදෙමු අපි බැඳුමින්

යෞවනේ සුවඳින් එදා මට ලෝකයක් සැදූ
මගෙ ම වෙන්නට මා පතා ආ සසර සහකාරී
මට ම වෙන් කළ ඔබේ පිවිතුරු හදවතේ රාවේ
සමුගන්න පෙර මා සවන පුරවා නම්
මිදෙමි මා සිරුරෙන්
ලොව ම නවතින අඳුරු මොහොතේ
නිවෙමි ඔබෙ දෑතේ



මේ ගීතය සාමාන්‍ය සම්ප්‍රදායික ගීතයකට වඩා ආකෘතියෙන් වෙනස් ය. ගීතයේ මුල් පාදය, ඉතිරි පාද හැම එකක් ම ගායනය අවසානයේ නැවත නැවත ගායනා වීම, ගීතයක සාමාන්‍ය සම්ප්‍රදායික ආකෘතික ලක්ෂණයකි. එහෙත් මේ ගීතයේ මුල් පාදය ගායනා කරන්නේ එක් වරක් පමණකි.

ගීතය තුළින් විද්‍යමානවන සියලු ම ලක්ෂණ විමසිල්ලට ගෙන, පළමු කොටස හා දෙවන කොටස ලෙස බෙදා වෙන් කර දක්වා විග්‍රහ කිරීමට තීරණය කළේ පාඨක ඔබගේ තේරුම් ගැනීමේ පහසුව සඳහායි.

ගීතයේ පළමු කොටසින් කියවෙන පරිදි වියපත්ව, අබල දුබලව, මරණයේ දොරකඩ ලතැවිල්ලේ සිටින ආදරණීය ස්වාමියාගෙන්, ඔහුගේ දයාබර බිරිඳ අයැද සිටින්නේ කුමක් ද? "මා මෙහි තනි කර දමා, තනිව යන්න නම් හිතන්නවත් එපා මගේ රත්තරන් දෙයියෝ. මං ඔයාට ආදරෙයි, මගේ රත්තරනේ, මගෙ පනත් හරි, මට ඔයත් හරි. මා ද රැගෙන ම යන්න මගේ දෙයියෝ" යැයි වැහැරී ගිය ඔහුගේ දෑත සිඹ සිඹ අයැද සිටින්නීය.

ඇයගේ යැදීම ඉතා සාවධාන ව අසා සිටි ආදරණීය ස්වාමියා පුදුමයට පත් වූයේ ඇයි? එදා, අතීතයේ යොවුන් කල, දෙදෙනාගේ පළමු හමුවීමේ දී තමා ඇමතු ඇය විසින් ඇගේ හද පත්ලින් පැන නැගුණු ප්‍රේමණීය, සුන්දර හැඟීමෙන් ආදරය ප්‍රකාශ කළ කෝමල ලාලිත්‍යය ඔහුට මේ මොහොතේ දී සිහියට නැගේ. අදත් ඔහුට ආදරෙයි කියන්නේ ඒ භක්ති ප්‍රේමය පිරි, හද පත්ලින් එලෙස ම නැගෙනා ඒ ප්‍රේමණීය සොඳුරු හැඟීමෙන් ම බැව් ඔහුගේ හදවතට ප්‍රබලව දැනේ. "කියනු පුදුමය එදා විලස ම!" යැයි විස්මයට පත්වන්නේ ඇගේ ඒ ගුණ යහපත් පැවැත්මේ උත්තම භාවය ඔහුගේ හදවතට තදින් දැනෙන නිසා ය.

"ඔබ හෙළන කඳුළැල් පිසින්නට මට වාරු නැත සොඳුරේ" යැයි ඔහු පවසන්නේ ඇයි? වියපත් ඔහුගේ දෑතෙහි වාරු නැති වීම එක් හේතුවකි. එය මේ කාව්‍යෝක්තියේ වාච්‍ය අර්ථය වේ. "කඳුළු පිස දැමීම" සංකේතයකි. එතුළින් ධ්වනිත වන්නේ ඇගේ දුක්වීම, හඬා වැලපීම ඔහුට වැළැක්විය නොහැකි බවයි. ඔහු පසු වන්නේ තමාගේ මරණාසන්න මොහොත ආසන්නයේ බැව් ඔහුට දැනෙයි. ඒ අවස්ථාවට මුහුණ දීමට ඇය සූදානම් කළ යුතුව ඇත. ඉහත දැක්වෙන "මට වාරු නැත සොඳුරේ" යන මනෝභාවයන් පිරි ගීත පාදය මේ ගීතයේ දෙවරක් ගායනා වීම තුළින අවධාරණය වෙන්නේ මේ දුක්බර ඉරණම ය.
තම සොඳුරිය කෙරෙහි ඔහුගේ හද තුළ පිරී පවතින ආදරය කෙතරම් දැයි "මතු භවේ හමුවෙන්න පැතුමින් මිදෙනු ඔබ ලසොවින්, මිදෙමු අපි බැඳුමින්" යන ගීත පාදයෙන් ධ්වනිත වේ. තමාගේ වියෝව නිසා ඇයට ඇති විය හැකි ප්‍රභල දුක අඩු කිරීම සඳහා මේ මහලු සැමියා යොදන උපාය ද එයයි. එනම්, ඊළඟ භවයේ දී හමුවීම යන උතුම් ප්‍රේමනීය බලාපොරොත්තුව ඇගේ වේදනාවෙන් පිරි හදවතට

ලබාදීමයි. “මිදෙනු ඔබ ලසොවින්” යන කාව්‍යෝක්තියේ අර්ථය ”හදවත තුළ ඇති ශෝක ගින්නෙන් නිදහස් වන්න” යන ප්‍රේමනීය ඉල්ලීමයි. සිත සනසා ගැනීමේ සහනශීලී විසඳුමක් ඇගේ මනසට ඔහු ධ්වනිත කරයි.

යුග දිවියේ මෙතෙක් කල් වාසය කළේ, එකිනෙකා කෙරෙහි තදින් බැඳී ගිය භක්ති ප්‍රේමයකින් හා ආදරයකින් පිරී පැවති දෙහදකින් යුක්තව ය. ඊළඟ අත් භවයේ දී හමුවීමේ උතුම් බලාපොරොත්තුව පෙරදැරි කරගෙන, මේ තාක් කල් රකිනා ලද එම බැඳීමෙන් දෙදෙනාගේ ම හදවත් නිදහස් කර ගනිමු යැයි ඔහු “මිදෙමු අපි බැඳුමින්” කියා ඇගෙන් ආදරයෙන් ඉල්ලා සිටියි. බිරිඳ කෙරෙහි බැඳීමෙන් නිදහස් වූ හදවතින් මරණයට මුහුණ දීම සඳහා සූදානම් වීමේ ඔහුගේ හද තුළ සැඟවී පවතින හැඟීම් එලෙස ධ්වනිත වේ.

ගීතයෙහි දෙවන කොටසේ කියවෙන මේ ආදරණීය ස්වාමියා තම සොඳුරියගෙන් කරන අවසාන ඉල්ලීමවන්නේ කුමක් ද? ඔබේ පිවිතුරු හදවතේ රාවයෙන් මා මෙලොවින් සමුගන්නට පෙර මගේ සවන පුරවාලනු මැනවි කියා ය. එදා මගේ යොවුන් අවදියේ දී, ගුණ, නැණ බෙලෙන් හා යහපත් පැවැත්මෙන් ආලෝකමත් වූ සහකාරිය වූයේ ඔබයි. අපේ යොවුන් යුග දිවිය සැපෙන්, සතුටින්, සැනසීමෙන් ආලෝකමත් කිරීමට ඔබ සමත් වූවා ය. මගේ අවසාන සමු ගැනීමට පෙර මට ම වෙන්කර පවතිනා ඔබේ හදවතින් නැගෙන රාවයෙන් මගේ සවන් පුරවා ලනු මැන කියා ඔහු මහත් ආදරයෙන් තම සොඳුරියගෙන් ඉල්ලා සිටියි.

ඇගේ හදවතේ රාවයට සවන් දීම යන්නේ අදහස නම් ඇගේ සිතේ ඇති හැඟීම් මොනවා දැයි දැන ගැනීමයි. “හදවතේ රාවය” යනු සංකල්ප රූපයකි. එයින් ධ්වනිත වන්නේ තමන් මෙලොවෙන් සමු ගන්නා මොහොතේ දී තම බිරිඳ තුළ සැඟව ඇති හැඟීම් මොනවාදැයි දැනගැනීම සඳහා ස්වාමියාට ඇති ප්‍රභල අභිලාෂයයි, ආශාවයි. “මතු බවේ හමුවෙන්න” යනුවෙන් ඔහු විසින් දෙන ලද පොරොන්දුව පිළිබඳව ඇගේ හදවත තුළ ඇති හැඟීම් දැන ගැනීමේ ආශාව විශේෂ වේ.

සවන් වන් සැණින් ශ්‍රාවක මනස ආකර්ශනය කර ගන්නා උසස් ගුණයකින් මේ ගීතය සමන්විතය. එයින් හැඟෙන්නේ ගීත නිර්මාණය ගුණාත්මකබවෙන් උසස්බවයි. ගීතයට පාදක වන අත්දැකීම මුළු මනුෂ්‍ය වර්ගයා හා සියලු සත්ව සන්තතියට ම පොදු ධර්මතාවයක් වන මරණයයි.

ගීතයෙන් ධ්වනිත වන පරිදි මුළු ජීවිත කාලයම මල සහ බඹරා සේ දැඩි ප්‍රේමයෙන්, ආදරයෙන් පිරි හදවතින් බැඳී සිටි මේ දෙදෙනාගෙන් ස්වාමි පුරුෂයා අවසන් හුස්ම හෙලනා අවස්ථාව උදා වේ. මේ අවස්ථාවට මුහුණ දීමට නොහැකි බලවත් ගැටලුවකට ඔහු මෙහිදී මුහුණ පායි. ඒ තම ආදරණීය සොඳුරිය හුදකලා කර අවසන් ගමන යෑමට නොහැකි තරම් දැඩි බැඳීමක් මේ යුවළ අතර තිබීමයි.

ගීතයේ සන්දර්භය (ගීතයේ ඇතුලත් විවිධ අවස්ථා) ගොඩනැගීමේ දී විශ්මිත අවස්ථා නිර්මාණයෙන් ගීතය අලංකාර කර ඇත. උදාහරණයක් ලෙස ස්වාමියාගේ දුබල උරතල මත හිස හොවා ගෙන බිරිඳ හඬා වැටෙන අවස්ථාව කෙතරම් නිර්මාණශීලී ද?

වියෙන් වැහැරුණු උර තලාවේ
හිස හොවා ඔබ හෙළන කඳුළැල්
පිසින්නට මට වාරු නැත සොඳුරේ

ඒ පාදයෙන් මවනා චිත්ත රූපය මනසින් දකිමින් විමසිල්ලෙන් බලා රස විඳින්න. ගීතයෙහි රසය උපරිමයට ළඟා කරන රස පිරි අවස්ථාව එය බැව් මට හැඟේ.

**පද රචනය**

ගී පද රචනයේ දී ප්‍රතිභා සම්පන්න රචකයා කරන්නේ රස නිෂ්පත්තිය සඳහා තෝරා ගත් අවස්ථාව මනෝභාවයෙන් පිරි කාව්‍යෝක්ති යොදාගෙන මැවීමකි. එය කිසිසේත් ම අවස්ථාව විස්තර කිරීමක් නොවේ. මෙහි දී වදන් රටාවල වාච්‍ය අර්ථය සේ ම වාචික ශබ්දය පිළිබඳව ද විශේෂ සැලකිල්ල යොමුකර වචන මාලාව තෝරා ගත යුතුයි.

පද රචකයා මෙහි දී “වියෙන් වැහැරුණු උර තලාවේ”, “යෞවනේ සුවඳින්”, “මට ලෝකයක් සෑදූ”, “සමුගන්න පෙර මා”, “සවන පුරවා නම්”, “ලොව ම නවතින අඳුරු මොහොත” යනාදී මනෝභාව පිරි ව්‍යංගාර්ථ සහිත යෙදුම් හා කාව්‍යෝක්ති තෝරා ගෙන ඇත.

**තනුව සහ සංගීත නිර්මාණය**

වදන් මාලාව තුළින් නිර්මාණය වන අවස්ථාව ඉතා දුක්මුසු හැඟීම් ධ්වනිත කරයි. මේ අනුව, තනුව සහ සංගීත නිර්මාණය යොදා ඇත්තේ එම දුක්මුසුබව තවත් තීව්‍ර ලෙස වචන රහිතව ශ්‍රාවක සවනට රැගෙන එන අයුරිනි. ගීතය ආරම්භවන සංගීත කණ්ඩය ඉතා දුක්බර හැඟීම් ඇතිකරයි. විශේෂයෙන් සිතාරය සහ බටනලාව ගීතයෙන් ධ්වනිත වන හැඟීම් ඉතා දුක්බර බව ශ්‍රාවක මනසට හඟවයි.

“වියෙන් වැහැරුණු උර තලාවේ...” යන ගී පදය ශ්‍රාවක නෙත් කඳුලින් තෙත් වන තරම් දුක්බර ස්වරයකින් ගායනා වේ. එයට හේතුව තනු නිර්මාණයේ ඇති විශ්මිත කලාත්මකබව යි.

සමස්ත ගීතයේ ම සංගීත නිර්මාණය, පදමාලාවෙන් ධ්වනිතවන හද කම්පාකරන හැඟීම් තීව්‍ර ස්වරයකින් ශ්‍රාවක මනසට යොමු කිරීමට සමත් වේ. එය මේ ගීතයේ ඇති උසස් කලාත්මක ගුණයකි.

**ගායනය**

ගීත රචනය තුළින් නිර්මාණයවන චරිතවල චිත්ත අභ්‍යන්තරයේ සැඟවී ඇති සංකීර්ණ මනෝභාව ධ්වනිතවන අයුරින් කටහඬ උචිත පරිදි හැසිරවීමට සමත්වීම උසස් ගායන ශිල්පීය කුසලතාවකි. එසේ සිතන

විට සුනිල් එදිරිසිංහ ගේ ගායනය ගුණාත්මකබවෙන් ඉතා උසස් බව පෙනේ.

මරණය අභියස සිටින සැමියාගේ හදවතේ මනෝභාව කෙතරම් සංකීර්ණ විය හැකි ද? ඒ හැඟීම් ධ්වනිතවන පරිදි තම හඬ උචිත ලෙස පාලනය කරගනිමින් සුනිල් එදිරිසිංහ විසින් කරන ගායනය විචිත්‍ර ය. සෞන්දර්යාත්මකව ඉතා උසස් ය. උදාහරණයක් ලෙස මේ ගීතයෙහි මුල් පාදයේ “ආදරෙයි මං ආදරෙයි, ආදරෙයි මං ආදරෙයි” යන පදය උච්ච ස්වරයෙන් ගායනා කිරීමේ දී ප්‍රදර්ශනයවන විචිත්‍රත්වය ගීතයට හොඳින් සවන් දී වටහාගත හැකිය.

තම යොවුන් කාලයේ දී කළ පරිද්දෙන් ම අද මේ මොහොතේ දී ද බිරිඳ සැමියාට තම ආදරය ප්‍රකාශ කළා ය. එම ඇසිල්ලෙහි දුක්බර හැඟීම් පිරි තිබුණු ඔහුගේ හදවත සියුම් සොම්නස් සහගත ආශාවකින් ප්‍රබෝධමත් විය. දුක හා සතුට යන ප්‍රතිවිරුද්ධ සංකීර්ණ මනෝභාව දෙක සහිත සැමියාගේ හදවතේ රාවය ධ්වනිත කරන මේ දුක් ගීය ගායනය සඳහා හඬ හැසිරවීමේ විශේෂ චාතුර්යයක් ඇති ගායනා ශෛලියක් අත්‍යාවශ්‍ය වේ. මෙහිදී තම කටහඬ පද මාලාවෙන් ධ්වනිත කළ යුතු සියුම් හැඟීම් නැගෙනා පරිදි සුනිල් එදිරිසිංහ විසින් ගායන විලාශයේ ඇති විශ්මිත කලාත්මකබව ශ්‍රාවක සවනට සංවේදීව දැනෙයි. සුනිල් එදිරිසිංහ සැමියාගේ චරිතයට අව්‍යාජව ආරූඪ වී ගායනය කරන මොහොතේ දී හඬින් පමණක් නොව, ඔහුගේ දෑස හා මුහුණින් ද එම දුක්බර හැඟීම් ප්‍රකාශ වන අයුරු මේ ගීතයෙහි සුනිල් එදිරිසිංහ YouTube චැනලයේ දර්ශනය නැරඹීමෙන් දැකගත හැක. උසස් සෞන්දර්යාත්මක ගායනය ගීතයට අගනා ආලෝකයකි.

සංවේදී වස්තු විෂයයක් පාදකකර ලියා ඇති මේ ගීතයේ පද රචනය, රස ජනනයට පොහොසත් වේ. තනුව හා සංගීත නිර්මාණය මනෝභාව ධ්වනිත කරන උචිත නිර්මාණයකි. සංකීර්ණ හැඟීම් ධ්වනිත කර ශ්‍රාවක මනස ආකර්ෂණය කර ගන්නා ගායනය උසස් කලාත්මක ගුණයෙන් පොහොසත් වේ. ඒ අනුව මේ ගීතය, පද රචනය, තනුව සහ සංගීත නිර්මාණය, ගායනය යන ත්‍රිත්වයේ මනා සහසම්බන්ධයෙන් නිර්මාණය වූ උසස් සුභාවිත ගීතයකි.

මෙබඳු සුභාවිත ගීත රස විඳීමෙන් අපට විනෝදය ලැබෙයි. විනෝදයෙන් වින්දනය ලැබෙයි. වින්දනයෙන් අතිශය වින්දනය ලැබෙයි. අතිශය වින්දනය ප්‍රඥාව ලබා දෙයි.

සුභාවිත ගීත රස විඳීම ජීවිතයේ විනෝදාංශයක් කර ගන්න.

- **කරුණාසේන කහටපිටිය**
[karunasena_k@yahoo.com.au]

# ඔබේ කටහඬ



වසන්තය මග හැරුන දුක හිතෙන සිසිරයක
බෝ දුරක් ඇවිද ගිය යලිත් නොහැරෙන දුරක
මුදු ස්වර රාවයෙන් තුන් හිතම නිවාලන
මිහිරි සංධ්වනියකි අදත් මට ඔබේ හඬ

එදා වාගේ ම මට ඒ හඬ ම දැනෙනවා
මුණ ගැසී ඒ ලෙසින් ගියෙ ඇයි ද සිතෙනවා
කියන්නට, අසන්නට බැරිවු දේ තියෙනවා
කාටවත් නෑහෙන්න අදත් මම හඬනවා

කතා කළෙ කුමකට ද, කියා පහදා දෙන්න
එදා කෝලවු වදන් එකින් එක ගලපන්න
හංස ගී ඇසෙනවිට එදා සේ මුමුණන්න
මේ සිසිරයේ නොහැකි බව දනිමි එලෙසින්ම

තත්පරෙක, ඇසිල්ලෙක මගේ දුක පහදන්න
වදන් සොයනෙම් කෙලෙස, බෝ දුරකි ඔබ මෙමට?
සැමදාම නොපෙන්නුව මගේ සිත වසාගෙන
හිත පතුල අවුලනා ඔබේ හඬ විඳිමි මම

අමාවක දිනක සඳ ඉල්ලන්න අකැප බව
මේ තරම් ඈත ගිය ඔබ නැවත නේන බව
නොදන්නා සේ ඉන්න බැහැ, මුරණ්ඩුයි මසිත
අසන බොරු කාරණා ඉවසන්න, නැසු ලෙස

මොනවත් ම නොකීවට කමක් නැහැ දැනෙන්නට
කිසිවකුත් නොලැබුණත් වගක්වත් නැහැ සිතට
ඔය හඬම ඇතිය මට කල්පයක් නිවෙන්නට
යලි දිනෙක දකිනතුරු මතු භවෙක, වසන්තෙක

එදාටත් මේ වගේ මාව මග දා යන්න
අඳුනගත්තත් නොදැක්කා වගේ ඔබ ඉන්න
අරුත් නැති සංධ්වනියක ස්වර ගලපන්න
බලා ඉමි, හැමදාම හුරුපුරුදු ලෙස ම මම

- **රූපිකා ද සිල්වා** [rupikadesilva88@gmail.com]





# විටමින් නාමකරණය

ශරීර සෞඛ්‍යය කෙරෙහි ආහාරවල බලපෑම පිළිබඳව ආදි යුගයේ සිට ම මිනිසාට තරමක අවබෝධයක් තිබුණු බවට සාක්ෂි තිබේ. අපේ සමහර පැරැන්නෝ ඔවුන්ගේ ආහාර, උෂ්ණාධික ආහාර සහ ශීතාධික ආහාර වශයෙන් තෝරා බේරා ගැනීමට පුරුදුව සිටියහ. ඉස්සන්, බල මාළු, දැල්ලන් වැනි මාංශ වර්ග උෂ්ණාධික ආහාර ලෙසටත්, වම්බටු, පිපිඤ්ඤා, මී කිරි වැනි ආහාර ශීතාධික ආහාර ලෙසටත් සලකන සමහර අය අදටත් සමාජයේ සිටිති. ආයුර්වේදයේ ද උෂ්ණාධික සහ ශීතාධික ආහාර ගැන සඳහන් කර තිබේ.

එමෙන් ම, උණ සහ සෙම්ප්‍රතිශ්‍යාව මැඩලීම සඳහා විටමින් C යෝග්‍ය බවත්, හිරු එළියෙන් විටමින් D ලැබෙන බවත්, කැරට් වැනි එළවළුවකින් විටමින් A ලැබෙන බවත් අද සාමාන්‍ය සමාජ ව්‍යවහාරයේ ද පවතී. අප ගන්නා ආහාරවල ගුණාගුණ සහ යහපත් සෞඛ්‍යයක් පවත්වාගැනීම සඳහා ආහාරයේ අඩංගු වන ප්‍රධාන සංඝටකයක් වන "විටමින්" විද්‍යාත්මකව හඳුනාගැනීම සඳහා විවිධ විද්‍යාත්මක සොයාගැනීම් රාශියක සංකලනයක් උපයෝගී කර ගෙන තිබේ.

ආහාරවල අන්තර්ගත සංඝටක පිළිබඳ විමසිලිමත් වූ මුල්ම පර්යේෂකයින් විසින් ඒවායේ අඩංගු යම්කිසි වැදගත් අදෘශ්‍යමාන මූලික පෝෂණ කොටසක් තිබෙන බව හඳුනාගන්නා ලදී. මේ සම්බන්ධයෙන් විද්‍යා පරීක්ෂණ මෙහෙයවූ, ස්කොට් ජාතික ඩැනියෙල් රදර්ෆඩ් (Daniel Rutherford) රසායන විද්‍යාඥයා විසින් 1772 වර්ෂයේ දී මෙම පෝෂක කොටස් සහිත රසායනික සංයෝගවල නයිට්‍රජන් මූලද්‍රව්‍යය (N) තිබෙන බව සොයාගන්නා ලදී. නයිට්‍රජන් අඩංගු ආහාර පිළිබඳව තව දුරටත් පරීක්ෂණ කරගෙන ගිය ඕලන්ද ජාතික රසායන විද්‍යාඥයෙකු වන ජොහැන්නස් මල්ඩර් (Johannes Mulder) විසින් 1838 දී, මෙම සුවිශේෂී රසායන ද්‍රව්‍යය, ග්‍රීක් භාෂාවේ, prōteios ("primary"හෝ ප්‍රාථමික) යන අර්ථය අනුව එය ප්‍රෝටීන් (Protein) ලෙස නම් කරන ලදී.

ස්ථිර වශයෙන්ම විටමින් හඳුනාගැනීමටත් පෙර සිට ළමා මාන්දම (rickets) සහ වැඩිහිටියන්ට බහුලව වැළඳෙන මුඛය දෙපැත්ත වණවීම, දත්මුල් දියවීම, අධික මහන්සිය, ඇළිමැළි දුබල ගතිය වැනි ලක්ෂණ සහිත ශීතාද රෝගය (scurvy) සඳහා ද හේතුවන්නේ පෝෂණීය ආහාර අඩුවීම බව උපකල්පනය කර තිබේ. කලක් ගතවනතුරු ම මෙම රෝග ලක්ෂණ මතුවනුයේ හඳුනා නොගත් ආසාදන, පිළුණු වූ හෝ දූෂිත ආහාර අනුභවය, මුහුදු සුළඟට හසුවීම වැනි විවිධ හේතු නිසා විය හැකි බවට සැකයක් ද පැනනැගී තිබිණ.





ඩැනියෙල් රදර්ෆඩ් ජොහැන්නස් මල්ඩර්

මේ කාලයේ දේශගවේෂණය සඳහා මුහුදු යාත්‍රාවල සේවය කරමින්, මාස කිහිපයක් තිස්සේ සමබර ආහාර නොලැබුණු සමහර නැවියන්ට ශාරීරික දුර්වලතා, දත්මුල් දියවීම, අධික මහන්සිය, ඇළි මැළි දුබල ගතිය වැනි ලක්ෂණ සහිත "බැරි-බැරියාව" (beri-beri) රෝගය හටගන්නා බව දකින්නට ලැබිණ. එම නැවියන්ට නිරතුරුව ම නිවුඩු ඉවත්කළ සහල්වලින් සකස් කළ බත් ආහාරයට ගැනීමට සිදුවන නිසා, එම ලක්ෂණ සහිතව, ශරීරය දුර්වල වීමේ රෝගය හටගන්නා බවට සැකයක් මතුවිය. මේ ගැන සිත් යොමු කළ පර්යේෂකයින් විසින් පරෙවියන් සහ කුකුලන් වැනි සතුන්ට නිවුඩු රහිත සහල් පමණක් ආහාරය සඳහා දී පාලක පරීක්ෂණ ද සහිතව ලබාගන්නා ලද නිරීක්ෂණ මගින් මෙම සැකය තහවුරු කර තිබේ.

මෙම නිරීක්ෂණ ඔස්සේ තවදුරටත් පරීක්ෂණ පැවැත්වූ පෝලන්ත ජාතික රසායන විද්‍යාඥයෙකු වන කැසිමීර් ෆන්ක් (Casimir Funk) විසින් සහල් නිවුඩු වැනි ආහාර සංඝටකවල තිබෙන ප්‍රෝටීනවලට අමතරව මිනිසාට ජීවත් වීමට අත්‍යවශ්‍ය තවත් සුවිශේෂී රසායනික ද්‍රව්‍යයක් තිබෙන බව නිගමනය කළේය. මෙය නයිට්‍රජන් සහ හයිඩ්‍රජන් එකට බැඳී ඇති ඇමීන බණ්ඩයක් (-$NH_2$) බව ද ඔහු අනුමාන කළේය. මෙම නිරීක්ෂණ උපයෝගී කර ගනිමින් N අඩංගු මෙම රසායන ද්‍රව්‍යයට, "ජීවය සඳහා ඇමීන" යන අදහස ආරෝපණය කළ හැකි බව පෙන්වා දුන් ඔහු ග්‍රීක් භාෂාවෙන් එම අදහසට අනුරූප "Vita-Amine" ලෙස නම්කරන ලදී. කෙසේ වෙතත් පසු කාලයේ දී කරන ලද පර්යේෂණවල දී, නයිට්‍රජන් අඩංගු ඇමීන් බණ්ඩය නොමැති විටමින් වර්ග ද තිබෙන බව හඳුනාගත් පසු 1912 වර්ෂයේ දී, එම වචනයෙහි

මැද එක් "a" අකුරක් සහ අවසාන "e" අකුර ඉවත්කර, මෙම අපූරු ද්‍රව්‍යය Vitamin - " විටමින්" ලෙස නම් කර ඇත.


කැසිමීර් ෆන්ක්


එල්මර් මැකලම්


**විටමින් සඳහා විධිමත් පර්යේෂණ කර ඒවා නම් කිරීම**

"විටමින්" යන සංකල්පය ගොඩනැගීම සඳහා මෙසේ විද්‍යාඥයින් කිහිප දෙනෙකුගේ ම චින්තන සහ පර්යේෂණ දායකත්වය ඒකරාශී වී තිබෙන අතර, වරින් වර හඳුනා ගත් විවිධ විටමින් වර්ග නම් කිරීමේ දී ද, යම් යම් මතභේදවලට තුඩු දී, පසුව වඩාත්ම ගැලපෙන ක්‍රමවේදයක් ගැන එකඟත්වයට පැමිණ තිබේ. විසිවන ශත වර්ෂයේ පළමු සහ දෙවන දශකවල දී විද්‍යාඥයෝ කිහිපදෙනෙකු ආහාරවල අඩංගුවන විටමින් පිළිබඳව පර්යේෂණ කර තොරතුරු රාශියක් එක්රැස් කරගෙන තිබුණි. මේ අතර විවිධ ආකාරවලින් එකම විටමිනය හඳුනාගෙන තිබීම ද දකින්නට ලැබිණ. මෙසේ කරන ලද විවිධ පර්යේෂණ අතර ඇමෙරිකන් ජාතික එල්මර් මැකලම් (Elmer McCollum) ජීවරසායන විද්‍යාඥයා විසින් සහල් නිවුඩුවල ඇතැයි විශ්වාස කළ විටමිනය Beri-beri රෝගය සමනය කිරීම සඳහා ප්‍රත්‍යක්ෂ බව සනාථ කරමින් Beri-beri රෝගයේ නමෙහි පළමු අක්ෂරය වන "B" භාවිත කර, එම විටමිනය Vitamin B ලෙස නම් කරන ලදී. මේ වන විට බොහෝ දුරට එහි රසායනික ව්‍යුහයට සමාන එහි තවත් ප්‍රභේද රාශියක් සොයා ගෙන තිබුණ බැවින්, ඒ සියල්ලම වෙන වෙනම නම් කිරීම පිළිබඳව මතභේද ඇතිවිය. පසුව 1915 දී එල්මර් මැකලම් තමා සොයාගත් B විටමිනය B1 ලෙස නම්කර, ඒ සියල්ල එකම කාණ්ඩයට ගැනීම සඳහා, විටමින් B ශ්‍රේණියක් සකස් කිරීම සඳහා යෝජනා කරන ලදී. මේ අනුව විටමින් B1, B2, B3 ආදී වශයෙන් විටමින් B එකතුව සකස් විය. මෙය විටමින් B සංකීර්ණය (Vitamin B-complex) ලෙස නම් කරන ලදී. මීට ටික කලකට පසු, B1 විටමිනය "තයමින්" (Thiamine) බව රසායන විද්‍යාත්මකව ඔප්පු කර ඇත. මෙය ජලයේ ද්‍රාව්‍ය විටමිනයක් බව ද හඳුනා ගන්නා ලදී.

මේ කාලයේම එල්මර් මැකලම් සහ ඔහුගේ සහායකයෙකු විසින් සමහර ආහාරවල තිබෙන ජලයේ අද්‍රාව්‍ය වෙනත් විටමිනයක් හඳුනාගෙන තිබුණි. මෙසේ සමහර විටමින්වල ස්වාභාවිකව දකින්නට ලැබෙන "ජලයේ අද්‍රාව්‍ය භාවය", "A" සාධකය ලෙස හඳුන්වා, ඔවුන් විසින් එම විටමිනය Vitamin A වශයෙන් නම් කරන ලදී.


මේ ආකාරයට අලුතින් එක්වන දැනුම් සම්භාරයත් සමගම සොයාගනු ලබන විටමින් ප්‍රභේද නම්කිරීම ද තරමක ගැටළුවක් බවට පත්ව තිබියදී එල්මර් මැකලම් විසින් තමන් විසින් සොයාගනු ලැබූ විටමින් ප්‍රභේද දෙක, ඉංග්‍රීසි අකාරාදියේ මුල් අක්ෂර භාවිත කරමින් විටමින් A සහ විටමින් B ලෙස නම් කරන ලද බැවින්, ඉදිරියේදී සොයාගනු ලබන විටමින් ප්‍රභේද නාමකරණය සඳහා ද එම ක්‍රමවේදය සුදුසු බව යෝජනා කළේය.


ඇල්බට් සෙන්ගුර්ජි


නෝමන් හැවර්ත්

මේ අතර, නාවික ගමන්වල නොයෙදෙන සාමාන්‍ය ජනතාව අතර වුව ද "බැරි-බැරියා" වැනි රෝග ලක්ෂණ සහිත රෝගීන් සිටින බව නිරීක්ෂණය කර මෙයට හේතුව විය හැක්කේ විටමින් B අඩුකම සමගම ඇතිවන වෙනත් ඌනතා ද විය හැකි බවට මතයක් ද ඉදිරිපත් විය. මේ අනුව මිනිසාගේ ආහාර සහ අභ්‍යන්තර අවයවවල ක්‍රියාකාරීත්වය අතර සම්බන්ධය ගැන උනන්දුවක් දැක්වූ හංගේරියානු ජාතික පර්යේෂකයෙකු වූ Albert Szent-Györgyi (ඇල්බට් සෙන්ගුර්ජි) විසින් සමහර අයට වැළඳෙන "බැරිබැරියාව" සමනය කළහැකි විටමිනයක් ලෙස සැලකිය හැකි රසායන සංයෝගයක් 1930 දී සොයා ගන්නා ලදී. මෙය බොහෝවිට නාරං, දොඩම් වැනි ඇඹුල් රස සහිත පලතුරුවල අඩංගු බව ද ඔහු නිරීක්ෂණය කළේය. එවකට පිළිගත් ක්‍රමවේදය අනුව මෙය Vitamin C ලෙස නම් කරන ලදී. පසු කාලයේ දී මෙම විටමිනයට "බෙරි බෙරි" රෝගය සමනය කරන යන අර්ථය නැතහොත් "anti scurvy" යන තේරුම සහිත "Ascorbic" යන නාමය ලැබුණි. මෙහි ඉතා දුර්වල ආම්ලික ලක්ෂණ ඇති බැවින් එය "ඇස්කොබික් අම්ලය" ලෙස නම් කර ඇත.


"ඇස්කොබික් අම්ලය" නැතහොත් Vitamin C පිළිබඳව තව දුරටත් පරීක්ෂණ මෙහෙයවූ බ්‍රිතාන්‍ය ජාතික රසායන විද්‍යා මහාචාර්ය නෝමන් හැවර්ත් (Norman Haworth) විසින් එම විටමිනයේ අණුක ව්‍යුහය සහ



අණුක සූත්‍රය නිර්මාණය කර 1933 වර්ෂයේ රසායන විද්‍යාව සඳහා වන නොබෙල් ත්‍යාගය ද දිනා ගත්තේය.

Vitamin C හි අණුක සූත්‍රය වන $C_6H_8O_6$, ග්ලූකෝස්හි අණුක සූත්‍රය වන, $C_6H_{12}O_6$ සමග බොහෝදුරට සමාන කමක්ද පෙන්වයි.

යුරෝපීය රටවල ශීත කාලයේ දී සමහර අයට මාන්දම (rickets) වැනි ලක්ෂණ සහිත රෝගයක් වැළඳෙන බව නිරීක්ෂණය කර තිබේ. විටමින් A අඩංගු මෝරතෙල් (Cod Liver Oil) ගැනීමෙන් මෙම රෝගී තත්ත්වය මග හැරී යන බව සොයාගෙන තිබුණි. මෝරතෙල්වල ඇති විටමින් A කොටස රසායනිකව ඉවත් කර එය මාන්දමට ගොදුරු වී ඇති අයගේ ආහාරයට එකතු කළ විට දී ද, රෝගය සමනය වන බව මැකලම් විද්‍යාඥයා විසින් 1922 දී නිරීක්ෂණය කරන ලදී. මේ නිසාම, මෝරතෙල්වල විටමින් A ට අමතර තවත් වෙනත් පෝෂණ කාරකයක් තිබිය හැකි බව ඔහු පරීක්ෂණවලින් ඔප්පු කළේය. මෙම සංයෝගය විටමිනයක් වියහැකි බවට උපකල්පනය කර, ඒ වනවිට නම්කර තිබුණු විටමින් මාලාවේ ඊළඟ අක්ෂරය භාවිත කර එය Vitamin D ලෙස නම්කරන ලදී. මේ සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණ කිරීමේ දී එම රෝගීන් හිරු එළියට නිරාවරණය කළ විට ද රෝගී තත්ත්වය මගහැරී යන බව දකින්නට ලැබිණ. හිරු එළියේ ඇති පාරජම්බුල කිරණ (Ultra-violet rays) මිනිසාගේ සමට පතිත වූ විට ස්වාභාවිකවම විටමින් D නිපදවෙන බව පසුව ඔප්පු කරන ලදී. ශීත කාලවල දී යුරෝපීය රටවලට සූර්යාලෝකය මඳ වශයෙන් ලැබෙන නිසා මිනිසාට මෙම රෝගී තත්ත්වය ඇතිවන බව ද මෙම පරීක්ෂණවලින් සනාථ විය.


හර්බට් ඉවන්ස්


කැතරින් බිෂොප්

මේ ආකාරයට විටමින්වලට අදාළ පරීක්ෂණ ඉතාමත් යුහුසුළුව කරගෙන යද්දී, ඇමෙරිකානු වෛද්‍යවිද්‍යා පර්යේෂකයින් දෙදෙනෙකු වන හර්බට් ඉවන්ස් (Herbert Evans) සහ කැතරින් බිෂොප් (Katharine Bishop) විසින් විද්‍යාගාර මීයන් යොදවා කරන ලද පරීක්ෂණයක දී විටමිනයක් ලෙස සැකකළ සාධකයක් සොයාගන්නා ලදී. ඔවුන්ගේ පර්යේෂණයේ දී සුවිශේෂී ලෙස සංයෝජනය කරන ලද ආහාරයක් ලබාදුන් මීයන් හොඳින් වැඩුණු අතර එහි සිටි ස්ත්‍රී ලිංගික මීයන් ප්‍රජනනය කිරීමට අසමත් බව නිරීක්ෂණය විය. මෙය මෙතෙක් හඳුනා නොගත් සිද්ධියක් බැවින් එසේ වියහැකි බවට හේතුව “X සාධකය” (X factor) ලෙස මුල දී සඳහන් කර තිබුණි. මෙසේ නිර්නාමිකව තිබූ සාධකය 1922 වර්ෂයේ දී Vitamin E ලෙස නම් කරන ලදී.

මිනිසාගේ ආහාරවල තිබෙන පොදු පෝෂණ කොටස්වලට අමතරව, පෝෂණය සඳහා අත්‍යවශ්‍ය විටමින් රාශියක් අනාවරණය වීමෙන් පසු, සමහර විද්‍යාඥයෝ, මිනිස් සිරුරේ අංගෝපාංගවල ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වියහැකි වෙනත් සාධක ගැන ද තම පර්යේෂණ යොමු කරන්නට පටන්ගත්හ. මෙහි දී මීළඟට හඳුනා ගතහැකි වන්නේ විටමින් F විය යුතු බවට සංවාදයක් ද විද්‍යාඥ ප්‍රජාව අතර ඇතිවිය.

මෙම සංවාදය පවතිද්දී, ඩෙන්මාර්ක් ජාතික ජීව-රසායන විද්‍යාඥයෙකු වූ හෙන්රික් ඩෑම් (Henrik Dam) රුධිරය සම්බන්ධ පර්යේෂණ පවත්වන අතර මිනිසාගේ සිරුරෙහි සුළු තුවාලයකින් පිටවන රුධිරය ස්වල්ප වෙලාවකින් කැටි ගැසී රුධිර වහනය නතර වීමේ යාන්ත්‍රණය පිළිබඳව සිය පරීක්ෂණ මෙහෙයවීය. මෙහිදී රුධිරයේ අඩංගු විටමිනයක් වියහැකි සුවිශේෂී ද්‍රව්‍යයක් නිසා මෙසේ සිදුවන බව ඔහු නිගමනය කළේය. එහෙත් ඔහු එම සාධකය විටමින් F ලෙස නම් කිරීම වෙනුවට රුධිරය කැටිගැසීම (coagulation) යන තේරුම දෙන ජර්මන් භාෂාවේ Koagulation යන වචනයේ මුලකුර අනුව එම විටමිනය නම් කලයුතු බවට ඔහු යෝජනා කළේය. මේ හේතුවෙන් 1929 වර්ෂයේ දී, රුධිරය කැටි ගැසීමට ඉවහල් වන විටමිනය Vitamin K ලෙස නම්කරන ලදී.

මුල් අවදියේ දී විටමින් අකාරාදී පිළිවෙලට A අකුරෙන් ආරම්භ කර E දක්වා කළ නම් කිරීමෙන් පසු මෙසේ එකවරටම K ලෙස නම් කිරීම තරමක් අවුල් සහගතය. භාවිතා කළ ක්‍රමවේදයේ විද්‍යාත්මක මුහුණුවරක් නොමැති නිසා එය මෙසේ ඉවත් කිරීමට තීරණය කරන්නට ඇතැයි සිතිය හැක. පසු කාලයේ වඩාත් නිරවුල් අණුක සූත්‍ර සහ අනුක ව්‍යුහ භාවිත කිරීමේ ක්‍රමවේදය මගින් නව සොයාගැනීම් හැඳින්වීම වඩාත් ජනප්‍රිය වී තිබේ.

| | |
|---|---|
| B1 | Thiamine (තයමින්) |
| B2 | Riboflavin (රයිබෝෆ්ලෙවින්) |
| B3 | Niacin (නයසින්) |
| B5 | Pantothenic acid (පැන්ටොතෙනික්) |
| B6 | Pyridoxine (පිරිඩොක්සීන්) |
| B7 | Biotin (බයෝටින්) |
| B9 | Folate (ෆෝලේට්) |
| B12 | Cobalamins (කෝබෝල්ඇමීන්) |

මේ ආකාරයට උදාහරණයක් වශයෙන්, B විටමින් ශ්‍රේණියට ඉහත වගුවෙහි දැක්වෙන ආකාරයට නව නාමකරණයේදී

“ව්‍යුහාත්මක වර්ගීය” (Generic) නම් ලැබී තිබේ. මේ අතර B ශ්‍රේණියට අයත් ලෙස සලකා, කලින් B4, B8, B10 සහ B11 ලෙස නම් කර තිබුණු විටමින නව ක්‍රමවේදය අනුව විටමින නොවන බව ඔප්පු වීමෙන් පසුව ලේඛනයෙන් ඉවත් කර තිබීම ද විශේෂත්වයකි.කෙසේ වෙතත්, විටමින් A, B සහ C නම්කිරීම සඳහා බෙහෙවින් මූලික වී තිබෙනුයේ බෙරි-බෙරි* හෙවත් ශීතාද රෝගයවීමත්, විටැමින් D නම් කිරීමේ දී මාන්දම වැනි රෝගයක් මුල් වී තිබීමත්, දරිද්‍රතාව නිසා හටගන්නා මන්දපෝෂණය හේතුකොටගෙන හටගන්නා බෝ නොවන රෝග පිළිබඳව ඒ කාලයේත් ජනතා අවධානය යොමු වීමට ඉවහල් වී තිබීම විශේෂත්වයකි.

- **දයාරත්න වීරසේකර** [dayawee2@yahoo.com]

* බෙරි-බෙරි මේ රෝගය නම්කර ඇත්තේ සිංහල වචනයක් අනුව බව සැලකේ.

Thiamine deficiency is a medical condition of low levels of thiamine (vitamin B1). A severe and chronic form is known as beriberi. The name beriberi was possibly borrowed in the 18th century from the Sinhalese phrase බැරි බැරි (bæri bæri, “I cannot, I cannot”, owing to the weakness caused by the condition.

https://en.wikipedia.org/wiki/Thiamine_deficiency

# පළමුවෙනි තැපැල් මුද්දරය




පණිවිඩයක් ලියා ලියුමක යවන්නට
කවරයකුත් තනා හසුනක් බන්නට
තවරා ගම් ටිකක් ලියුමක් වහන්නට
ඇරඹුව යුගය දෙස කැමතිද බලන්නට?

එක්සත් රාජධානිය “හිරු බහින්-නැති”
බලගතු රට එදා වස්තුව නිමක් නැති
පළමුවෙනි රටයි මුද්දර තනා ඇති
දහ අට හතළිහේ මැයි එක දිනේ ඇති

“පෙනි බ්ලැක්” නමින් කලු සුදු මුද්දරය
පැන්සර් එකක මිල සටහන් මුද්දරය
වික්ටෝරියා මහා රැජනගේ චිත්තරය
සටහන් කළා ලොව පළවෙනි මුද්දරය

- **නිමල් සේදර** [nimalsedera@yahoo.com]

# අතීත සුන්බුන්



“ප්‍රේමය” වනාහි
ආශාව නිසා හටගෙන,
ආකර්ශනය නිසා හඹාගිය
හුදු විඳීමකින්
සපුරා වෙනස් වූ හැඟීමකි;

ආශාව නිසා හටගෙන,
ආකර්ශනය නිසා හඹාගිය
හුදු විඳීමක් අවසන
පළිගැනීම, අපහාසය,
අනෙකා අපහසුතාවට පත්කර සතුටු වීම,
අනෙකාගේ විඳවීම, රස විඳීම
යනාදී මේ සියල්ල ඔබට හමුවෙනු ඇත;



එහෙත්
සැබෑ ප්‍රේමයක් වී නම්
අතහැරීම, ළඟ නොරැඳීම
කිසිවිටෙකත් ප්‍රේමයේ අවසානයක්
සනිටුහන් නොකරයි;


එනිසාම
අනෙකාගේ සතුට වෙනුවෙන්
නිහඬ සමුගැනීමක් මිස,
ළඟින් ඇසුරුකළ දවස
මිහිරි අතීතයේ සුන්බුන්
තාක්ෂණයේ දියුණුව හරහා
ලොව හමුවේ දිග නොහැරෙනු ඇත...

- **තිමාලි ද සිල්වා**




# ඇට කෝටු බාස්

**2012 මාර්තු 17**



රීජන්ට් වීදියේ නවාතැනට පැමිණ දින කිහිපයක් ගතවෙද්දී පවුලීන් නවාතැනින් සමුගෙන ගියාය.

තුන් මසක හෝ හය මසක කොන්ත්‍රාත්තු කාලයකට ලබාගන්නා කාමර යළි භාරදීම හෝ දිගටම රැඳීසිටීම ගැන නිශ්චිත කාලය සම්පූර්ණ වීමට ආසන්නයේ නිවාස හිමිකරුට දැනුම්දිය හැක. පවුලීන් සමුගත්තේ කුමන හේතුවකටදැයි හරි හැටි පැහැදිලි නොවූවත් ඇගේ පිටව යාම නවාතැනේ සෝෂාවට නැවතීමේ තිත තැබීමක් විය. ආකර්ෂණීය සිරුරක් හිමි රුවැත්තියක වූ පවුලීන් සිය සිරුර නිරාවරණය කෙරෙන ඇඳුමින් සැරසී ආලින්දයට බට විගස ප්‍රංශයෝ දෙදෙනාත්, බ්‍රසීල ජාතික මර්සෙලෝත් නිතැතින්ම එතැන පහළ වෙති. සුහද සල්ලාපයෙන් හා අතරතුර කැගැසීම් වලින් පිරෙන නවාතැන පිටත වීදියේ වාහන හඬ සමග මුසුව නිපදවා දෙන්නේ අධ්‍යයන කාර්යයකට කිසිසේත් නොගැලපෙන පරිසරයකි.

පවුලීන්ගේ සමුගැනීම, ආකර්ෂණීය රුවැත්තියකගේ දායකත්වය නිවසට අහිමි කළ ද, හිස්තැන පිරවීමට ආ සොයි ඇයට වඩා මගේ සිත දිනාගන්නට සමත් වූවාය. චීන ජාතික තරුණියක් වූ ඇය මගේ විශ්වවිද්‍යාලයේ ම වාණිජ්‍යය හදාල අයෙකි. ක්‍රිස්ටල් හදාලේ ද මෙම විෂයයන් ම ය.) නමුත් අනු විෂයයන් ලෙස සංගීතයත්, ඉතාලි භාෂාවත් තෝරාගෙන තිබුණු සොයි නිරතුරුව සිනාමුසුව, කඩිසරව නිවසේ දුවපනින්නට පටන්ගත්තාය. අප සියල්ලෝම එකම පවුලක නම් සොයි යනු සියල්ලන්ගේ ම ආදරය දිනන බාල සොයුරිය වැනි බව පෙනීයන්නට විය.

මෙය නම් අපූරු පවුලකි!

ලංකාවෙන් ආ මා, ප්‍රංශයෝ දෙදෙනෙක්, චීන තරුණියන් දෙදෙනෙක්, බ්‍රසීල ජාතිකයෙක්, කොරියානුවෙක්, ජපනෙක් හා ඉංග්‍රීසිකාරයෙක් මෙහි වාසය කළෝය. ජීවිතයේ කිසිදු දිනක බලාපොරොත්තු නොවූ නමුත් විඳින්නට දකින්නට ආශා කළ අපූරු විශ්ව පවුලක් මා අභියස විය!

ඉංග්‍රීසිකාරයෙකු මෙම ලේඛණයට හදිසියේම එක් කිරීම පිළිබඳ සමාවුව මැනවි! හැරී නමැති තරුණ එංගලන්ත වැසියා ද මා අභියස පෙනී සිටියේ එපරිද්දෙන් හදිසියේම ය. වෙනත් සාමාජිකයෙක් පිළිබඳ කිසිදු අදහසකින් තොරව කුසීතව සෝපාවේ වැතිර සිටි මොහොතක නිරාවරණය වූ උඩුකයකින් යුතු මෙම සුදුමැලි තරුණයා ජූන්ගේ කාමරයෙන් පිටව, නිදිමත මුහුණින් මා දෙස බලා යන්තම් හිස වනා, නාන කාමරයට වැදුණේය. නවාතැනට පිවිස සතියක් ගතවනතුරු ම කිසිදු සටහනක් නොතිබූ තැනැත්තෙක් හැන්දෑ වරුවක නිදිමරගාතයෙන් කාමරයකින් එක්වරම පිටට පැමිණීම මා කිසිවිට බලාපොරොත්තු නොවූවකි.

වඩා විශේෂම කාරණය වූයේ ඔහු මට මෙන්ම සියල්ලන්ට ම අමුත්තෙකු මෙන් වී ම ය.

“ඒ හැරී. එයා එංගලන්තෙන්... අපි නිදාගන්නකොට එයා නැගිටලා වැඩට යනවා. අපි වැඩට ගියාම එයා ඇවිත් නිදාගන්නවා”

අමුත්තා පිළිබඳ පසුව මා කළ විමසීමට ජූන් දුන්නේ එවන් පිළිතුරකි. එහෙත් ඔහු කිනම් රැකියාවක නිරත වූවෙකු ද යන්න හෝ වෙනත් කිසිදු තොරතුරක් දත්තෙකු නවාතැනේ නොවී ය.

නිවාඩු දිනක වුව අප හා වචනයක් හෝ දෙඩුමට උත්සුක නොවූ හැරී නිශ්චිත සංඥා කිහිපයකින් (දෙකකින්) පමණක්

අප හා සමග සබඳතා පවත්වාගෙන ගියේ ය. නිදිබර මුහුණින් හිස සෙලවීමත්, නිවසට ඇතුළු වන විට හා පිටවන විට, "හායි මේට්, බායි මේට්" කීමත් යන දෙයාකාරයයි ඒ. ඉඳහිට මොහොතක, නව වෙනසක් කළාක් මෙන් "බායි" යන්න වෙනුවට ඔහු "සී යූ" යන්න යෙදූ අවස්ථා ද විය.

අභිරහස් නිවැසියා හැරී මෙන් නොව සොයි නිතර නිවහනේ දකින්නට වූ අතර ක්‍රිස්ටල්ට වඩා ඇය සමාජශීලී ද වූවා ය.

"ඔයා ඉන්දියාවෙන් ද?"

මා දුටු මුල් වතාවේම මගෙන් ඇය ඇසුවේ සුපුරුදු පැනයකි. අපගේ බාහිර රූපකාය අනුව බොහෝදෙනෙක් අනුමාන කරන්නේ අප ඉන්දියානුවන් බවයි.

"නැහැ. මම ශ්‍රී ලංකාවෙන්"

"ආ... ඒ ළඟම රටෙන්... මම හිතුවා එකත් එකටම තඩි නහයක් තියෙනකොටම... ඒ පැත්තෙන් කියලා!"

මට ඇත්තේ විශාල නාසයකැයි කිසිදින මට නොහැඟුණ ද සොයිට පෙනී ඇත්තේ එසේය. චීනුන්ගේ නාසය අපට සාපේක්ෂව කුඩා බව මට දැනෙන්නට වූයේ එදින සිට ය.

නවාතැන් සගයින් සියල්ලන් වෙත මෙවැනි වදන් යොමු කොට සිනාසෙන්නට වූ සොයි කාගේත් සිත් දිනාගත්තේ නිරායාසයෙනි. යට කී ලෙස ඇය නිවසේ ලාබාල දඟකාරිය බවට සටහනක් තබන්නට නිතර සමත් වූවාය.

සොයුරියක් නොමැතිව, දෙසොහොයුරන්ට මැදිව හැදී වැඩුණු මට බොහෝ කලක් යනතුරු කෙල්ලන් ආශ්‍රයට ඉඩක් ලැබුණේ නැත. විරුද්ධ ලිංගිකයින් ඉදිරියේ කුඩා කල තිබුණු අපහසුව තවතවත් ඉහළ යවමින් මට යන්නට ලැබුණේ ද පිරිමි විද්‍යාලයකට ය. පළමු ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වාම මහනුවර විද්‍යාර්ථයේ අධ්‍යාපනය හදාල මම බාහිර පන්තියක දී පවා හැකි පමණ සිසුවියන් මගහරින්නට පුරුදු වුණෙමි.

පාසැලේ හත්වැන්නේ දී පමණ චෙස් ක්‍රීඩාව බාහිර ක්‍රියාකාරකමක් ලෙස තෝරාගත් මම, මල්ලී ද සමග පාසැලේ පුහුණුවීම් කටයුතුවලට සහභාගිවුණෙමි. බාහිර තරග සඳහා යාමේ දී අවට පාසැල්වල බාලිකාවන් හමුවුව ද, සිත තුළ සැඟවුණු උවමනාව පරයා නැගෙන භීතිය නිසා ම තරගය මොහොතට පමණක් ඔවුන් දෙස බැලීමට පුරුදුවීමි. තරගය සටහන් කෙරෙන සටහන් කොළය සිසුවියන් අතට දීමේ දී ත්, තරගය අවසන අතට අත දී සුභ පතද්දීත් මා විසුළුවකට ගෙන ඔවුන් සිනාවනු ඇතැයි යන විශ්වාසයක් නිරතුරුව මා සමග විය.

මගේ කණ්ඩායම් සගයින් වූ ගලප්පත්ති, අසන්ත, අයි.එස්, විජේසිංහ ආදීහු සිසුවියන් සමග කවට බස් දොඩද්දී මම හැකි පමණ දුරින් හිඳින්නට උත්සාහ කළෙමි.

සිසුවියන් අභියස පළායාමේ පුරුද්ද මවෙත ඇතිවූයේ පවුලේ සොයුරියක් නොසිටි නිසා යැයි පැවසීම එක්තරා මුසාවක්දැයි විටෙක මට ම සිතේ. සියල්ල පරයා සිත තුළ දළු ලා තිබූ, මා කෙසඟ, විරූපී කොල්ලෙකු ය යන හැඟීම ඊට මුලින් වූ හෙළි නොකළ යථාර්ථයයි.

පාසැලේ පහළ පන්තිවල දී මම අනිත් සිසුන්ට වඩා තරමක් උසින් යුතු, කෘෂ ශරීරයකට හිමිකම් කීමි. මගේ පෙනුම නිසා ම සමීප මිතුරෝ "කෝටුවා" යන නාමය මා හැඳින්වීමට භාවිතා කළහ. මේ නාමය සිය නිර්මාණශීලී බව හරහා නවීකරණයට ලක් කරන මා සුමිතුරා වූ විදුර එකල මා ඇමතුවේ "ඇටකෝටු බාස්" යන නමිනි. වචනයේ පරිසමාප්තයෙන්ම මම ඇට කෝටු බාසෙකු වන්නට ඇතැයි මට සිතෙන්නට ගන්නේ පාසැලට නොයන සති අන්තවල දී ය.

මහගෙදර පිටුපසින් වන කුඩා කඳු ගැටය දක්වා දිවෙන ඉඩම් කට්ටියේ කාණු ආදිය කැපීමට අයියාත්, චූටි බාප්පාත් සති අන්ත වෙන් කරන අවස්ථා වේ. ඔවුන් කඳුගැටිය දෙසට පා ඔසවත්ම මම ද ඒ පසුපස ඇදෙමි.

"හා සුද්ධ කරමු බලන්න එහෙනම් මේ කාණුව!" දෙදෙනා ම එක්ව මා වෙත උදැල්ලක් දිගු කරති. පරාජය නොවීමේ තිර අදිටනින් උදැල්ල ගන්නා මට විනාඩි කිහිපයකින් කණ වැකෙන්නේ උස්ව නැගෙන ඔවුන්ගේ සිනාහඬ යි.

"හරියකට උදැල්ලවත් අල්ලගන්න පුළුවන් නං! අන්න බලන්න ඒක කරන විදිහ!!" දෙදෙනාගෙන් අයෙකු මගේ ක්‍රියාව විස්තර විචාරයකට ලක් කරයි. කඳුළු සඟවාගන්නා මම යළි නිවස කරා ඇදෙමි.

"මම නං ඇටකෝටු බාසෙක්ම වෙන්න ඕනෙ!" මිතුරන්ගේ හා නිවැසියන්ගේ අදහස් අවසන මම තීරණය කළෙමි.


ඇට කෝට්ටෙකුට කිසිදු කෙල්ලෙකු කැමති නොවනු ඇති බවත්, මම පිටුපායද්දී සියලු කෙල්ලන් මා පෙන්වමින් සිනාසෙනු ඇති බවටත් විශාල විශ්වාසයක් කල්යත් ම මා තුළ ඇති විය.

මෙය කෙතරම් ප්‍රබල ලෙස ම'සිත අරා නැගිණි ද යත් තරුණියන් හා සාමාන්‍ය පරිදි කතා බහක යෙදෙන්නට මා සමත් වූයේ පාසැලින් සමුගත් පසු ය.

**- ප්‍රියන්ත ෆොන්සේකා** [shanthalalf@gmail.com]

# සිසිල ප්‍රහේලිකාව

## මල්ලි දිසානායක ගේ නිර්මාණයකි




samanmalee7@hotmail.com

### හරහට

1. අවුරුද්ද
2. ආරක්ෂක අවියකි
5. බුදුන් වැඳීමට ඇරඹුම
8. කොළඹ ප්‍රසිද්ධ හන්දියකි
9. පැවත එන්නකි
11. වාද්‍ය භාණ්ඩයකි
12. සනකම් නැති
13. රක්ෂකයා
15. ප්‍රමාණය ගිණිය නොහැකි
17. මිහිරි තෙපුල් ඇත්තී
21. භක්තිවන්ත
23. කරවිල විශේෂයකි
24. ඉතා විශාල
28. හිස්ව ඇත යන අරුත දේ
29. නැටුම් අංගයකි
31. මාර්ගයක වුව දැකිය හැක
32. දිග මනින මිම්මකි
33. දෙවඟනකි

### පහළට

1. නිවනට මග අහුරයි
2. සුවිශේෂී මුහුදු මාර්ගයකි (2, 3)
3. වහලක දැකිය හැක
4. සිනහව
5. පාලන ඒකක විශේෂයක්
6. ඔර්ලෝසුවක බොහෝවිට ඇත (4, 3)
7. ලංකාවේ පැණි බීමකි
10. රසවත්
14. නිදහසට බාධා දේ
16. දළදා මැදුරේ කොටසකි
18. පැත්තකි
19. පානයකි
20. විටෙක බෙහෙතකි
22. දෙපිරිසක් අතර සිදුවිය හැක
25. පෙරදිග රටක පෙදෙසකි
26. වඳ වී යන රැකියාවකි
27. ගින්නක් නැතිව නොනඟී ලු
30. පියාගේ පියා

මෙවර ප්‍රහේලිකාවේ විසඳුම ලබන කලාපයේ පළවෙනු ඇත.



දීපිකා ශ්‍රියානි සුනන්ද්‍රා මඩුගේ

# සෙනෙහස

සිසිල සඟරාවේ කොටස් වශයෙන් පළවෙන නවකතාව

මෙතෙක් කතාව

දෙමාපියන් අහිමි අංජලී කුඩා අවධියේ සිට ම හැදුණේ තම නැන්දණිය තලතා, මාමණ්ඩිය බුවනෙක සහ ඔවුන්ගේ දරු දෙදෙනා ළඟයි. අංජලීට රහසින් පෙම්කරන තලතා-බුවනෙක යුවලගේ බාල පුතු වෛද්‍ය ශිෂ්‍ය සුනෙත් වහාම තම ආදරය අංජලීට පවසන්නට සැරසුනත් ඊට පෙර අංජලී දැක පැහැදුණු සහකාර පොලිස් අධිකාරී හරේන් මංගල යෝජනාවකින් පසුව අංජලීව බැලීමට එනවා. ඒ බව දැනගන්නා සුනෙත් තම මව සමග කෝප වී නිවසෙන් පිටව දුර පලාතක වෙසෙන මිතුරෙකුගේ නිවසට යනවා. වැඩිමහල් පුත් ගුවන් හමුදා කපිතාන් දේවක ද මේ යෝජිත විවාහය ගැන ප්‍රසාදයක් නොමැති බව ඔහුගේ හැසිරීමෙන් තලතා සහ බුවනෙක දැන ගන්නවා.

අංජලීගේ සහ හරේන්ගේ විවාහය නුදුරේ දී ම සිදුවනු ඇති බව දැනගත් සුනෙත් තම මිතුරන් දෙදෙනෙකු සමග යළි නිවසට පැමිණෙන්නේ අංජලී පිළිබඳ තම අරමුණ ඉටුකර ගන්නා අදහසිනුයි. නමුත් ඔහු නොදන්නා කාරණය නම්, අංජලී ඇවැස්ස නෑනා-මස්සිනා විවාහයකින් උපන් දරුවෙකු නිසා, එලෙසින්ම ඇවැස්ස නෑනා-මස්සිනා ඥාති සම්බන්ධයක් ඇති ඔවුන් දෙදෙනා අතර විවාහයක් කිසිදිනෙක සිදුවීමට ඉඩක් නොමැති බවයි.

අද එතැන් සිට



දේවක මෙවර නිවසට පැමිණියේ තම මවගේ තදබල පෙරැත්තය නිසා මිස වෙනදා මෙන් කැමැත්තකින් නොවේ. මීට පෙර නිවසේ දී දැනුන සතුට සහ උද්දාමය වෙනුවට හිස්බවක් සහ කියාගත නොහැකි සාංකාවක් බඳු හැඟීමකින් ඔහුගේ සිත අරක් ගෙන තිබිණ. දේවක නිදාගැනීමට සයනයට ගිය ද ඔහු කල්පනා කළේ එළඹෙන හෙට දිනයේ දී හරේන් පැමිණි විට ඔහු මගහරින ක්‍රමයක් ගැන ය. පෞද්ගලිකව ඔහු දේවකට කිසිදු වැරැද්දක් කර නොතිබුණ ද හරේන් ගැන ඔහුගේ සිතෙහි යම් විරෝධාකල්පයක් ඒ වන විට ඇති වී තිබිණ. පළමු මුණගැසීමේ දී වුව හරේන් ඉතාම සුහදශීලීව සහ ආචාරශීලීව සංවාදයේ යෙදුන ද තමා හැසිරුණේ එතරම් සුහදශීලී බවකින් නොවන බව දේවකට සිහිපත් විය. හරේන් ගැන ඔහුගේ සිතෙහි තිබූ ඒ නොරිස්සුම් සහගත බව දේවකගේ මිත්‍රයා වූ සහන්ට ද තේරුම් ගොස් තිබිණ. නිවසට පැමිණීමට සූදානම් වෙන අතරතුරදී දේවක හමුවීමට පැමිණි සහන්ට එවෙලෙහි ද හරේන් සහ අංජලී ගේ විවාහය ගැන සිය සිතෙහි තිබූ කනස්සල්ල ඔහු නැවත පවසා සිටියේය. සහන් සිනාමුසුව තමාට දුන් පිළිතුර දේවකට සිහිපත් විය.

“මචං හරේන් කියන්නෙ හොඳ කොල්ලෙක්. අංජලීව ආදරෙන් බලා ගනීවි. මගේ ෆස්ට් කසින් නිසා කියන දෙයක් කියල හිතන්න එපා. අංජලීට ඒ වගේ කෙනෙක් ආයෙ හොයන්න අමාරුයි. උඹට නම් මචං ඔය හරේන් ගැන තියෙන්නෙ පොඩි ජෙලසි එකක්. ඒක කාලයත් එක්ක ඇරිල යාවි...”

හරේන් ගැන ඇත්තේ හුදු ඊර්ෂ්‍යාවක් ද යන්න දේවක තමාගේ සිතෙන්ම විමසා බැලුවේය. මෙතෙක් කල් තමා ආදරයෙන් සහ ගෞරවයෙන් රැකබලාගත් සිය මව තරම් වූ සමාන බවකින් සිටි තම ඥාති සොයුරියගේ අනාගත හිමිකරු කෙරෙහි ඔහු ගේ සිත තුළ තිබෙන හැඟීම එලෙස සහන් විසින් ඊර්ෂ්‍යාවක් ලෙසින් විහිළුවට හෝ ලඝු කිරීම තමාට කරන අසාධාරණයක් ලෙස දේවකට සිතිණ.

* * *

තලතා, මිලිනා, සිරිදාස මෙන්ම බුවනෙක ද උදෑසනින් නැගිට නිවසට පැමිණෙන අමුත්තන් පිළිගැනීමට ලහිලහියේ සූදානම්වෙමින් සිටිය ද අනෙක් සියළු දෙනාම ඔවුනොවුන්ගේ කාමරවල නින්දේ පසුවූහ. ඒ සැමදෙනා ම නින්දට යන විටත් මැදියම් රැය පසුවී තිබූ බව දැන සිටි තලතා ඔවුන්ට උදෑසන තේ සෑදීම ද පමාකරන ලෙස මිලිනාට පවසා තිබිණ.

මිලිනා ද සුපුරුදු වෙලාවට නොව තරමක් පරක්කු වී ඔවුන්ගේ උදෑසන තේ රැගෙන උඩුමහලට ගියාය. දේවක රාත්‍රියෙහි නිවසට පැමිණ ඇති බව සුනෙත්ට දැනගන්නට ලැබුණේ එලෙස පැමිණි මිලිනාගෙනි. සුනෙත් සහ දේවක

මීට පෙර කිසිදු දිනෙක එතරම් කාලයක් ඈත් වී සිට නැත. කලකින් නොදුටු තම සොයුරා බැලීමට යාමට ඔහුට සිතක් ඇතිවිය.

“මිලිනම්මා තේ එක අරගෙන යන විට අයිය අවදි වෙලා ද හිටියේ?”

“ඔව් පුංචි බේබි. මං කාමරයට යන සද්දෙටද කොහෙද ලොකු බේබි ඇහැරුණා.”

හිතුවක්කාරකම සහ ක්ෂණික කෝපය පාලනය කරගෙන හැකි ඉක්මණින් නිවසට පැමිණෙන ලෙස දේවක කිහිපවරක් ම දුරකථනයෙන් සුනෙත්ට අවවාද කර තිබිණ. තමා එලෙස නිවසින් පිටවයාමට හරියට ම හේතුව කුමක් ද යන්න දේවක ඒ වනවිට දැනගෙන නොසිටිය ද වර්තමානයේ ඒ සියල්ල ගැන ඔහු දැනුවත් වී ඇති ද යන්න පිලිබඳව සුනෙත් ගේ සිතේ යම් චකිතයක් තිබිණ. එහෙත් බොහෝ කලකින් නොදුටු තම සොයුරා හමුවීමට සුනෙත් යා යුතුව ම තිබූ හෙයින් තේ බී අවසානයේ තම මිතුරන් දෙදෙනා සමග දේවකගේ කාමරය වෙත ගියේය.

දේවකට ඊට පෙර අවස්ථා ගණනක දී භානුක හමු වී තිබුණ ද, කිසි දිනෙක ආදිත්‍ය මුණ ගැසී නොතිබිණ. දේවක තම සොයුරාගේ මිතුරන් ඉතා සුහද ලෙසින් පිළිගත්තේය. තම අකීකරු සොයුරා රැකබලා ගැනීම ගැන ආදිත්‍යයට මෙන්ම භානුකට ද ඔහු ස්තුති කළේය. ටික වේලාවක් ආගිය තොරතුරු කථාබහෙහි නියැලී සිට අනතුරුව ඔවුහු උදෑසන ආහාරය ගැනීමට පහළ මාලය වෙත පැමිණියහ. ඔවුන් කෑම මේසයට එන විටත් අංජලී සහ තාරකී එහි පැමිණ සිටියහ. තාරකී දුටු දේවකට පුරුද්දට මෙන් ඇයට විහිළුවක් කරන්නට සිතක් පහළ විය.

“අපෝ මෙයත් මෙහේ ඇවිදින් ද? මදැයි ඉදල ඉදල ගෙදර ආවා...”

දේවක පැවසු දෙයට තාරකී ද නිහඬව නොසිට ඇනුම් පදයක් කීවාය. ඔවුන් දෙස සිනාමුසුව බලාසිටි අංජලී ඒ දෙදෙනා ගේ රණ්ඩුව සුපුරුදු එකක් බව පැවසුවේ ආදිත්‍ය සහ භානුක දෙස බලමිනි. සුනෙත් මුනිවත රකිද්දී ආදිත්‍ය සහ භානුක ද එම සංවාදයට එකතු වූහ. කිසිවක් කතා නොකර සිටින තම සොයුරා දෙස දේවක විමසිල්ලෙන් කිහිප වරක්ම බැලුවේය. භානුක, ආදිත්‍ය, දේවක, තාරකී මේ සැම තොරතෝංචියක් නැතිව විහිළු කරමින් සිටියහ. බුවනෙක ඔවුන් අතරට පැමිණෙන තුරුම ඔවුන්ගේ එම සංවාද එලෙසම පැවතිණ.

බුවනෙක ද ඉතා සුහදශීලීව ඔවුන් සමග අදහස් හුවමාරු කරගනිමින් උදෑසන ආහාරය ගත්තේය. සුනෙත් ගේ වෙනස භානුකට මෙන්ම ආදිත්‍යයට ද හඳුනාගැනීමට හැකි විය. එහෙත් ඔවුහු එය නොදැනුනා ලෙස සිටිමින් සුනෙත්ට ද විහිළු කරමින් ඒ සංවාදයට ඔහු සහභාගී කරගන්නට යම් උත්සාහයක නියැලුණහ. භානුක, ආදිත්‍ය සහ තාරකී සුනෙත්ගේ ප්‍රශ්ණය හරියටම දැන සිටිය ද දේවක ඒ කිසිවක් දැන සිටියේ නැත. දේවක ගේ මිතුරා වූ සහන්, තාරකී වෙතින් දැනගන්නා ලද තොරතුරු වුව ද දේවක ට පැවසීමෙන් වැලකී සිටියේ එවැන්නකට නිසි ප්‍රවේශයක් ඒ වනවිටත් සහන්ට නොලැබී තිබූ හෙයින් ය.

සුනෙත් කෑම මේසයේ වූ සංවාද වලට සහභාගී නොවූව ද තම සගයන්ගේ සහ සොයුරාගේ කතාබස්වලට හිනැහෙමින් සිටින අංජලී දෙස ඔහු අවධානය යොමු කරගෙන සිටියේය. වෙනදා මෙන් නොව අංජලී තමා වෙත කිසිදු සැලකීමක් හෝ අවධානයක් නැතැයි සුනෙත් ට සිතිණ. තමා සන්තාපයෙන් සිටිය ද ඇයගේ මුහුණෙහි කිසිදු චිත්තපීඩාවක සලකුණක්වත් නැතැයි යන සිතුවිල්ල සුනෙත්ගේ සිත දුකට පත්කරන්නට හේතු විය. සිත තුළ තෙරපුන වේදනාව සමනය කර ගැනීමට සුනෙත් දෑස් පියාගෙන සිත සන්සුන් කරගන්නට වෙර දැරුවේය. අපේක්ෂාවන් සුන්ව සටනකින් පැරද යන පුද්ගලයෙකුට දැනෙනවා මෙන් වූ පරාජිත සිතුවිලි සුනෙත්ගේ සිත තුළ ජනිතවෙමින් තව තවත් ඔහුගේ සිත පාරවමින් තිබිණ. සුනෙත්ට කෑ ගසා හඬන්නට තරම් තමා ගැනම යම් ආත්මානුකම්පාවක් දැනෙමින් තිබිණ. ඔහු ආහාර ගැනීම නවතා හිස ඔසවා පුටු ඇන්දට තබා නැවතත් තදින්ම දෑස් පියාගත්තේය. කෑම මේසයේ සුනෙත්ට ඉදිරිපසින් වූ පුටුවේ සිටි ආදිත්‍යට සුනෙත් යම් අපහසුතාවයකින් සිටින බව දැක ගන්නට ලැබිණ. ආදිත්‍ය ඔහු සිටි පුටුවෙන් එක්වරම නැගිට සුනෙත්ට කතා කළේය.

“මචං සුනෙත්... මොකද වුණේ... භානුක පොඩ්ඩක් බලන්න සුනෙත්ට මොකක් හරි අමාරුවක් ද කියල...” ආදිත්‍ය පැවසුවේ සුනෙත් අසලම පුටුවේ හිඳ කෑම ගනිමින් සිටි භානුකට ය.

සුනෙත් ගේ අනෙත් පස අසුනේ සිටි දේවක ද හැරී සිය සොයුරා දෙස බැලුවේය. සුනෙත් යම් වේදනාවකින් මෙන් දෑස පියාගෙන හිස පුටු ඇන්දට තබාගෙන සිටිනු ඔහු දුටුවේය. දේවක කලබලයෙන් පුටුවෙන් නැගිට සුනෙත්ට ආමන්ත්‍රණය කරමින් ඔහු නැගිටුවා වත්තම් කර ගත්තේය. නිහඬව ම සුනෙත් තම සොයුරා තරයේ බදාගත්තේය. සියල්ලෝම තම උන් අසුන් වලින් නැගිට සුනෙත් වට කර ගත්තෝය. අන් සැමට මදක් ඈත්වන්නට කියමින් භානුක පැමිණ සුනෙත් නැවත පුටුවේ වාඩි කරවූයේය. අනතුරුව ඔහු සුනෙත් ගේ නලලට අත තබා ශරීර උෂ්ණත්වය ද, අත ගෙන නාඩිවල රුධිර ස්පන්දන වේගය ද පරීක්ෂා කර බැලුවේය. ඔහු සුනෙත්ට ශාරීරික අසනීපයක් නැති බව සැක හැර දැනගත්ත ද එය පැවසීමට ඉක්මන් වූයේ නැත. මේ අතර අංජලී සිටි තැනම සිටගෙන කඳුළු පෙරමින් එදෙස තෘෂ්ණිම්භූතව බලාසිටින අතරේ මුළුතැන්ගෙයි සිටි තලතා සහ මිලීනා ද බයෙන් තැතිගෙන දුවගෙන එදෙසට පැමිණියහ. තලතා හඬමින් සුනෙත්ට ආමන්ත්‍රණය කළාය.

බුවනෙක සුනෙත් ළඟට වී ඔහුගේ හිස අතගාන අතරතුර කලබල නොවන ලෙස තලතාට පැවසුවේය.

“ආන්ටි බය වෙන්න එපා. සුනෙත්ට පොඩ්ඩක් උණ වගේ. ඒයෙ රෑ සෙංගෙඩි වගේ තියෙනවා කියල කිව්ව. කලබලවෙන්න එපා. වෙන මොකුත් ප්‍රශ්නයක් නැහැ. අපේ ගාව ගෙනාපු බෙහෙත් තියෙනවා. ඒව දුන්නාම ඕක දවසකින් ඇරිලා යාවි.”

සැබවින් ම, සුනෙත්ට භානුක පැවසූ අන්දමේ කිසිදු ශාරීරික අසනීපයක් නැතත් ඔහුට බොරුවක් පවසන්නට සිදුවිය. කෑම මේසයට පැමිණි වෙලාවේ සිට අංජලී දෙස සුනෙත් කිහිපවරක්ම බලනු භානුක දුටුවේය. විහිළු තහළු කරමින් සැවොම සතුටින් සිටිය ද සුනෙත් සිටියේ මුනිවත රකිමිනි. හරේන් ගේ පැමිණීම ද එදිනට නියමිත වී තිබුණ හෙයින් සුනෙත්ට යම් වික්ෂිප්ත බවක් සමග මනසට යම් කම්පනයක් දැනෙන්නට ඇතැයි භානුකට සිතිණ. එහෙත් එය කිසිවෙකුටත් කිව නොහැකි නිසා ඔහුට එලෙස අසත්‍යයක් පැවසීමට සිදු විය.

භානුක පැවසූ දෙයින් තලතා තරමක් සන්සුන් විය.

“මං පුතා එයාගෙ කාමරයට එක්කරගෙන යන්නම්. ඔයාල කෑම කාල ඉවර කරන්න,” යැයි පවසමින් තලතා සුනෙත් ළඟට පැමිණියාය.

“නෑ අම්මා මං පොඩ්ඩක් මෙතැන ඉන්නම්. දැන් හරි,” සුනෙත් තම මව දෙස බලමින් පැවසුවේය.

සැවොම එතැන් සිට නිශ්ශබ්දව කා බී හමාර කළේ සුනෙත්ට සිදු වූ දේ නිසා ඔවුන් ද යම් කම්පනයකට පත් වූ හෙයිනි. දේවක කිහිපවරක් ම තම සොයුරා දෙස බැලුවේ ඔහුට හදිසියේම සිදු වූ දෙය සිතාගත නොහැකිව ය. උණකට හෝ සෙංගෙඩි අමාරුවකට එවැනි තත්වයක් ඇති විය නොහැකි බව දේවකට සිතුණි. කෙසේ වෙතත් එම්. බී. බී. එස්. සමත් වෛද්‍යවරයෙකු වූ භානුක ගේ කීම ගැන පවුලේ අන් අයට නම් කිසිදු අවිශ්වාසයක් නොතිබිණ. ඒ නිසා ම, තලතා සෙම්ගෙඩිවලට අත් බෙහෙතක් සාදන්නට මිලීනාට පැවරුවාය.

උදෑසන ආහාරයෙන් පසු තාරකී සහ අංජලී ද, සුනෙත් සහ ඔහුගේ මිතුරන් ද, නැවත උඩුමහලෙහි ඔවුන්ගේ කාමර වෙත ගියහ. බුවනෙක විසින් දේවක නවතාගත්තේ අංජලී ගේ විවාහයේ ඉදිරි වැඩකටයුතු ගැන කතා කිරීමට ය. සුනෙත් පමණක් නොව දේවක ද අංජලීගේ විවාහයට එතරම් කැමති නොවන බව බුවනෙක මෙන්ම තලතා ද දැනගෙන සිටියහ. එහෙත් සුනෙත් තරම් ප්‍රතිරෝධයක් දේවක තුළ නොතිබුණ හෙයින් අඩුම තරමේ ඉදිරි වැඩකටයුතු සංවිධාන කරගැනීමට දේවක ගේ හෝ සහාය ලබාගත යුතුව ඇතැයි බුවනෙක සිතුවේය.

* * *

සුනෙත්ට සිය කාමරයට යන්නට හැර භානුක සහ ආදිත්‍ය ඔවුන්ගේ කාමර වෙත යන්නට සැරසුණහ. එලෙස යන්නට පෙර භානුක සුනෙත් ගේ අතින් අල්ලා මොහොතකට නතර කර ගත්තේය.

“මචං උඹ දන්නව නේ, උඹට උණවත් සෙම්ගෙඩි වත් නැහැ කියල. මම දැක්කා උඹ කිහිප වරක්ම අංජලී දිහා බලනවා. හිතට දැනෙන දේවල් පොඩ්ඩක් ඉවසගන්න පුරුදු වෙයන් මචං. දැන් රූම් එකට ගිහින් පොඩ්ඩක් රිලැක්ස් කළාම ඔය ඔක්කොම හරි යාවි. මායි, ආදිත්‍යයයි තව පොඩ්ඩකින් එන්නම්,” භානුක මිතුරාට සමු දුන්නේය.

“සුනෙත්ට උණයි, සෙංගෙඩියි තියෙනවා කියල භානු කියන කොට මටත් පුදුම හිතුණා. මචං සුනෙත්, භානු කියනව වගේ පොඩ්ඩක් ඉවසන්න පුරුදු වෙයන්.” ආදිත්‍ය ද සුනෙත් අස්වසන්නට විය.

“ඇත්තටම මොකක් දෝ මහ සාංකාවක් වගේ දෙයක් මගේ හිතට දැනුණා ආදි. ඒ ෆීලින් එක මට ඒ වෙලාවෙ කන්ට්‍රෝල් කරගන්න බැරිවුණා. දැන් ඒක හරි. හරේන්ල එනව කියන්නෙ කීයට විතරද කියල උඹල දන්නව ද?” සුනෙත් තම මිතුරන් ගෙන් විමසුවේය.

“අපිත් දන්නෙ නැහැ මචං, හරේන් කීයට ආවත් අපිට කමක් නැහැ. උඹ රූම් එකට ගිහින් පොඩ්ඩක් රිලැක්ස් වුණොත් හොඳයි මචං,” එවර භානුක එය පැවසුවේ තරමක් අවධාරණය කරමිනි.

එයට කට කොණකින් සිනාසී, හිස වනා ප්‍රතිචාර දැක්වූ සුනෙත් මිතුරන්ගෙන් සමුගෙන කාමරය වෙත ගියේය.

එතැන් සිට ලබන කලාපයෙන් කියවන්න.

**- දීපිකා ශ්‍රියානි සුන්ද්‍රා වඩුගේ**

[deepikascf@gmail.com]

# භාවනාව

කොකා වැවේ ඉවුර මත හිඳී
උදෑසන භාවනාවේ දී
දඟලපු ළමුන් දෙදෙනෙක්

මෛත්‍රී භාවනාව නම් නොවෙයි වගේ
බිලී පිතිත් අත ඇතුව
නිසොල්මන්ව

**- සමන් සහසූරිය**






# කිඹුලන්ගෙන් ප්‍රවේශම් වෙනු!



බල්ලට ඇති වැඩකුත් නෑ, හිමින් ගමනකුත් නෑ කිව්වට ඕවා කාලයේ තාලයත් එක්ක එක එක විදිහට වෙනස් වෙනවා. බල්ලෝ කිව්වාට ඉතින් මෙහෙමයි. රත්තරන් පාට දාරවලට ගාපු, දුඹුරු පාට පටියකුයි, රිදී පාටට දිලිසෙන දම්වැලකුයි යාකරන් එක පැත්තක ඉන්න බව්වගේ අනිත් පැත්ත යා වෙලා තියෙන්නේ උදේ රත්තරන් කෙඳි වක්කරන සූර්ය දේවතාවටත් වඩා ලස්සනට නිය පාට වැටිච්ච, අතගාලා බලන්නත් ආසා හිතෙන රෝස පාට සුරංගනාවියක් වගේ නෝනා කෙනෙකුට කියලා දන්න බව්වත් යන්නේ හරි ආඩම්බෙරෙන්.

තඹ පාට කොන්ඩ තියෙන, කොළ පාට ඇසුයි, සුළං හමන තාලයට පැද්දෙන්නේ නැතිව රෝස පාට සපත්තුවල සුදු පාටට ගැටගහපු ලේසුයි හොල්ල හොල්ල නීට්ෂේයි, හයිඩෙගරුයි, ෂාරුක් ගැනයි මහ බර කතාවක් දාගෙන ම, හංස ලතාවට මදක් නෑකම් කියාගෙන ඇස් කොන් හරි හරියට ඔත්තු බලන්න තියාගත්ත හංසිකාලා නම් හරිම සුන්දර දසුනක් මවනවා වැව් ඉස්මත්ත දිහා බලාගෙන ඉන්න තිත්තයින්ට. අපේ පැටියට තිත්තයන් පෙන්නන්න ගිහින්, තිත් ගනින්න ඕනේ කියල වෙච්ච විජ්ජුම්බරය නම් මේකේ ලියන්න බෑ.

සුදු පාට වැලි පුරෝලා, දෙපැත්තට ගල් අල්ලලා, අලුතින් වැටකුත් ගහපු හින්දා කිඹුල්ලු නම් ඉන්නේ ටිකක් කනස්සල්ලෙන්.

ඉතින් අර වැඩක් නැතිව රස්තියාදුවේ සුළං හමන පැත්තට සුනිල් ශාන්තයන්ගේ සින්දුවලට පැද්දෙන, රෝස පාට, සුදු පාට, ඕලු, නෙළුම්, මානෙල් දිහා බලාගෙන ඇත්තටම හයිඩෙගර් ඉන්නේ සරල රේඛියව නීට්ෂේ ගිය ගමන් පථයේ ද, එහෙම නැත්නම් එළවළු විතරක් කාපු කට උඩ පොඩි කළු රැවුල් කැල්ලක් උඩ යට හොල්ල හොල්ල ලෝකයම නන්නත්තාර කරපු ආඥාදායකයා එළවළු මල්ලට ඔබා ගත්තු මැගිලියගේ ඕපාදූප ලයින් එකේ ද කියලා කල්පනා කර කර ඉන්නකොට තමයි දැක්කේ "කිඹුලන්ගෙන් ප්‍රවේශම් වෙනු!" කියලා කළු පාට අකුරු වලින් කහපාට බෝර්ඩ් එකක් ඇතුලේ සීරුවෙන් හිටගෙන ඉන්න බෝල අකුරු ටික.

ඔය අකුරු ඔහොම සිල් ගත්ත ඒබරන් ආතා වගේ මෙච්චර ලස්සන නෙළුම්යාය දිහා බලාගෙන වගේ වගක් නැතිව ඉන්නේ, දැති දැති උල් පිටේ අලවාගෙන අඩවන් වූ දෙනෙතින් ශූන්‍යතාවාදී බැල්මක් දාන කිඹුල් තඩියා දැකලා ඇති වෙච්ච පැහැදීමට ද කියල හිතාගන්න බැරුව මාත් උඩුකුරුඇද්ඇදං ගැහිලා හිටියා.

හැමතැනම වලාකුළු පිරිලා. සුදුපාට පුළුන් පුරෝගත්තු වැව් මැද්දේ පුංචි දූගේ කඩුක්කන් වගේ ලස්සනට තිත් තිත් රටා මවන, රතුපාට රෝසපාට නෙළුම් මල් නම් උදේට ඉන්නේ හරිම ආඩම්බරෙන්. කුඹුක් ගස් අස්සෙන් පාත් වෙලා රස්නේ තියන පෝෂ්‍යදායී ඉර කෙඳි හින්දා අපිත් තාම ඉන්නේ ඉතින් හරිම උද්දාමයෙන්. හැබැයි ඉතින් හවසට ඔපීසිය ඇරෙනකොට මුකුළිත වෙච්ච රතුපාට තිත් ඇයෝ හොයාගන්න බැරිවුණාට ආයෙත් මල් ඇවිදින සුදුපාට වැලි තීරය නෙළුම් යායක් වෙන්නේ හීනියට පැත්තකටවුණු ලැජ්ජාවෙන් කළුවෙන වැව්තලාවට හීනියට ම කෝචෝක් එකක දාන ගමන්. නෙළුම් වුණත් වතුරේ ම පිපිලා හරියන්නේ නෑ කියලා කව්දෝ පශ්චාත් නූතනවාදියෙක් කියපු කතා අහලා පහුගිය කාලේ වෙච්ච සන්තෑසිය මතක් වෙලා ලුණු පිරිච්ච දාඩිය බිඳකුත් පැන්නෙ නැතෑ මුඛයට.

ඉතින්, මේ වෙලාවට තමයි එංගල්ස්ලා, කාල්මාක්ස්ලා වුණත් කෝපි කෝප්පයක් නිවුන ද කියලා ඥානවිභාගය කරමින් කලිසම්වල දිග, කොට මනින්න පටන්ගන්නේ. මාත් ඔය අස්සේ තිත්ත පැටවු බලන්න ආපු දියකාවෙක් වගේ මූණ වතුරේ ඔබාගෙන, පස්සා පැත්ත උඩ තියනවා කියලා අමතක වෙච්ච පැස්බරෙක් වගේ, ෆ්‍රෙඩ්රික් නීට්ෂේ කියන්නේ කවුද කියලා කල්පනා කර කර ඉඳිද්දි, තව පොඩ්ඩෙන් හුස්ම ගන්න බැරුව, "සබ්බං පහාය ගමනීයන්" කියලා ත්‍රීවීල් එකේ පිටිපස්සේ බජාර් සෝමේ ගහපු වාක්‍යය ගේ ඉස්සරහා ගස් දෙකේ ඇඳලා සතියක් නවාතැන් දෙන වැඩක් තමයි සෙට් වෙන්න ගියේ!

- **අසංක ඉරාජ් ලක්නාථ** [laknatha@laknatha.com]

# පරිවර්තන සාහිත්‍යයෙන්

## මහාරාජා සහ රැජින

**රබීන්ද්‍රනාත් තාගෝර් ගේ "Raja and Rani" කෙටිකතාවේ සිංහල පරිවර්තනය හෙල්මලී ගුණතිලක**

බිපින් කිශෝර් රිදී හැන්දක් මුව හොවාගෙන උපන්නෙකු බැවින් ඔහු මුදල් ඉපයීමට වඩා දෙගුණයක් හොඳින් එය වියදම් කිරීමට දැන සිටියේය. මින් ඇතිවූ ස්වභාවික ප්‍රතිඵලය නම් ඔහුට තමන් උපන් නිවසේ වැඩි කල් වාසය කිරීමට නොහැකි වීමයි.



බිපින් යහපත් පෙනුමක් ඇති සුකුමාර තරුණයෙක් විය. ඔහු ව්‍යාපාර සම්බන්ධයෙන් මෝඩයෙකු වුවත්, ජීවිතයේ හැලහැප්පීම් දරා ගැනීමට නුසුදුස්සෙකු වුවත්, සංගීතයට දක්ෂයෙක් විය. ජගන්නාත්ගේ රියේ රෝදයක් ලෙසින් ඔහු ජීවිතය ඔස්සේ පෙරළී ගියත්, ඔහුට අවශ්‍ය කුමාර ජීවිතය වැඩි කාලයක් තිස්සේ ගෙන යාමට නොහැකි විය.

වාසනාවකට මේ වෙද්දී තරුණ මහාරාජා චිත්තරන්ජන්, ආධුනික නාට්‍ය කණ්ඩායමක් සංවිධානය කිරීමට මහත් උනන්දුවෙන් පසුවිය. බිපින් කිශෝර් ගේ පෙනුමත් සංගීත හැකියාවත් දැක ඒ ගැන පැහැදුණු මහාරාජා, ඔහුව තම කණ්ඩායමට සතුටින් බඳවා ගත්තේය.

චිත්තරන්ජන් උපාධිධාරියකු වුවත් ඔහු අනවශ්‍ය වියදම් කාරයෙක් නොවීය. පෝසතකුගේ පුතෙකු වුවත් ඔහු හැම විටම නියමිත වෙලාවට, නියමිත තැන්වල ආහාර ගැනීමත්, නින්දට යාමත් කළේ ය. කෙසේ වෙතත් ඔහු බිපින්ට ආසක්ත වූයේ සුරාවට ආකර්ෂණයවන්නෙකු ලෙසිනි. ඇතැම් දිනවල ඔහු බිපින් ට සවන් දෙද්දී, ඔහු සමඟ ඔපෙරා තනු නිර්මාණ ගැන සාකච්ඡා කරද්දී ඔවුන් වෙත ගෙනැවිත් තිබුණු ආහාර පාන හීල් වූ අතර රාත්‍රිය ගෙවී ගියේය. තම ස්වාමියාගේ වෙන කිසිදු වරදක් නැතත් ඔහුගේ එකම දුර්වලතාවය බිපින් කිශෝර් වෙත මේ දක්වන අසාමාන්‍ය ඇඟඇලුම්කම බව චිත්තරන්ජන් ගේ සේවකයෝ පවා කීහ.

වසන්තා කුමාරි තරුණ රැජින නම් තම සැමියාට බැන වැදුණේ ඔහු කිසිම වාසනාවක් නොමැති බැබුන් වඳුරෙකු වෙනුවෙන් තම කාලය නාස්ති කරගනු බව කියමිනි. ඔහු අද හෙටම පළවා හළ හැකි නම් ඇයට සැනසීමට හැකි බව ඈ කීවාය.

තම තරුණ බිරියගේ ඉරිසියාවකට සමාන මේ හැසිරීම් ගැන මහාරාජා චිත්තරන්ජන් යටි සිතින් සතුටු විය. මේ ලෝකයේ සිටින්නේ තමන් ආදරය කරන පිරිමියා පමණකැයි ගැහැනුන් සිතන බව ඔහු තනිවම සිනාසෙමින් සිතුවේය. මීට අමතරව අගය කිරීමක් ලැබිය යුතු තවත් පිරිමින් සිටිනු හැකි බව ඔවුන් කල්පනා කරන්නේ නැත. ඔවුන් සිතන පරිදි මෙලොව එකම යහපත් පිරිමියා නම් තම දෙසවනට විවාහ පොරොන්දු කෙඳිරූ තැනැත්තා ය. තම සැමියාගේ ආහාර වේල මඳක් ප්‍රමාද වීම ඇයට මහා මෙරක් තරම් ගැටලුවක් වන නමුත් සැමියා මත යැපෙන්නන්ට කෑම කටක්වත් නොමැති වුවත් ඔවුන් එය පිත්තල බොත්තමක් තරම්වත් ගණන් ගත්තේ නැත. ස්ත්‍රී පාර්ශවයේ මේ අසාධාරණ හැසිරීම විරෝධය පෑ යුතු වර්ගයේ එකක් වුවත් චිත්තරන්ජන්ට ඒ ගැන අප්‍රසාදයක් දැනුණේ නැත. මේ නිසා ඔහු තම බිරිඳ ඉදිරියේදී බිපින් සමඟ බරපතල සාකච්ඡාවල නිරත වූයේ ඇයව අවුස්සා ඇගේ නොරිස්සුම රස විඳීමට ය.

නමුත් මේ මහාරාජා චිත්තරන්ජන්ට සහ රැජිනට ක්‍රීඩාවක් වැනි වූ දේ බිපින්ට නම් මහත් ව්‍යසනයක් විය. ඊට හේතුව, රැජින මේ අවාසනාවන්ත යැපෙන්නා වෙත උවමනාවෙන්ම දැක්වූ නොසලකාහැරීම දැක ඒ රජමාළිගාවේ සේවකයන් ඊටත් වඩා උවමනාවෙන් ඔහුව නොසලකා හැරීමයි. ඔවුන් නිරතුරුවම බිපින් ගේ සුවපහසුව ගැන සොයාබැලීමට අතපසු කිරීම ඔහුගේ මහත් සිත් තැවුලටත්, දොම්නසටත් හේතු විය.

වරක් රැජින, පුටේ නම් සේවකයාට දොස් පවරමින් මෙසේ ඇසුවාය. "උඹ කිසි වෙලාවක වැඩක් පලක් කරනවා පේන්න නැහැ, දවස තිස්සෙම මොනවද මිනිහෝ කරන්නේ?"

“සමාවෙන්න මැඩම්, මගේ දවසම ගෙවෙන්නේ මහාරාජාගේ අණට බිපින් බාබුගේ සාත්තුවට,” අසරණ සේවකයා ගොත ගැසීය.

“ඇයි උඹේ බිපින් බාබු මහාරාජා කෙනෙක් ද?” මෙය අසා රජින නොරිස්සුමෙන් විමසුවා ය.

පුටේට මෙය ප්‍රමාණවත් විය. ඊළඟ දිනයේ පටන් ඔහු බිපින් බාබුගේ ඉඳුල් පිඟන් ඉවත් නොකළ අතර ඇතැම් දිනවල දී ඔහුගේ ආහාර ආවරණය කරන්නට ද අමතක කළේය. මේ නිසා බිපින්ට නුහුරු ලෙස තම පිඟන් කෝප්ප සෝදා ගැනීමටත්, බොහෝ අවස්ථාවල නිරාහාරව සිටීමටත් සිදුවිය. නමුත් මේ ගැන කන්කෙඳිරි ගා මහාරාජාට පැමිණිලි කිරීම ඔහුට තරම් වූයේ නැත. සේවකයන් සමඟ සණ්ඩු සරුවල් ඇති කරගැනීම වැනි මට්ටමකට තමන්ව පහතට හෙළා ගැනීමට අකමැති වූ බැවින් ඔහු මේ අපහසුතා නොසලකා සිටීමට සමත් විය. එබැවින් බිපින් කෙරෙහි මහාරාජා ගේ කැමැත්ත වැඩි වෙද්දී රජිනගේ අකමැත්ත ද සීමාන්තික ලෙස වැඩිවිය.

නිසි පුහුණුවීම් වලින් අනතුරුව සුභද්‍රහරන් නම් ඔපෙරාව මහජන දැක්මට සූදානම් විය. මෙහි වේදිකාව තැනුනේ රජමාළිගාවේ මිදුලේ ය. ක්‍රිෂ්ණා ගේ චරිතය මහාරාජා චිත්තරන්ජන් විසින් රඟ පෑ අතර බිපින් පණ පෙව්වේ අර්ජුන ගේ චරිතයටයි. ඔහු කෙතරම් මිහිරි ලෙස ගී ගැයුවේ ද! ඔහු කෙතරම් පියකරු ද! නරඹන්නෝ මහත් සතුටින් අත්පොළසන් දෙන්නට වූහ.

නාට්‍යය අවසන් වූ පසු චිත්තරන්ජන්, තම රජින වෙත පැමිණ ඒ ගැන ඇගේ අදහස් විමසුවේය.

“ඇත්තටම, බිපින් අර්ජුනගේ චරිතය හරිම අපූරුවට කළා. එයා වංශවත් පවුලක කෙනෙක් වගේ තමයි හරියටම පේන්නේ. එයාට තියෙන්නේ එයාටම ආවේනික කටහඬක්!”

“එතකොට මම කොහොමද? මම ලස්සන නැද්ද? මගේ කටහඬ මිහිරි නැද්ද?” චිත්තරන්ජන් කවටකමින් ඇසුවේය.

“ඔයා ඉතින් වෙනම කතාවක් නේ” කී රජින නැවතත් බිපින් කිශෝර් ගේ නාටකීය හැකියාවන් වර්ණනා කරන්න පටන් ගත්තාය.

ඉක්බිති තත්ත්වය සහමුලින්ම වෙනස් වූ අතර ප්‍රශංසා කරන්නා අවලාද නඟන්නට පටන්ගත්තේය. මෙතුවක් කල් තම බිරිඳ ඉදිරියේ බිපින් ගේ ගුණ වර්ණනාකිරීමට පසුබට නොවූ චිත්තරන්ජන්, දැන් සිතුවේ මිනිසුන් වැඩිදුර නොසිතා බිපින් ගේ හැකියාවන් අතිශයෝක්තියෙන් වර්ණනාකරන බවයි. ඔහුගේ පෙනුමේවත් කටහඬේ වත් ඇති සුවිශේෂී බව කුමක් ද? මීට ටික කලකට ඉහත දී ඔහු ද එවැනි වැඩිදුර නොසිතන්නෙකුව සිටියද, හදිසියේම, අභිරහස් ක්‍රමයකට චිත්තරන්ජන් ගේ සිතීමේ හැකියාව දියුණු වී තිබිණි!

ඉනික්බිති එළඹුණේ මාලිගාවේ දී බිපින් ගේ සියලු පහසුකම් ගැන සොයා බැලෙන කාලයකි.

“බිපින් කාලයක් තිස්සේ යමක් කමක් තිබුණු කෙනෙක් නිසා එයාට රාජ සභාවේ සුළු සේවකයෝ එක්ක නවාතැන් දෙන එක වැරදියි නේද?” රජින මහාරාජාගෙන් විමසුවාය.

“හෑ!” කියා ඊට කෙටියෙන් පිළිතුරු දුන් මහාරාජා මාතෘකාව වෙනස් කළේ ය.

රාජකීය ළදරුවාගේ ඉඳුල් කට ගෑමේ මංගල්‍යය වෙනුවෙන් තවත් ප්‍රසංගයක් පවත්වන්නට රජින යෝජනා කළ විට මහාරාජා චිත්තරන්ජන් එය නැසුණු සේ සිටියේ ය.

දිනක් තම යහන නිසි ලෙස නොසැකසීම ගැන මහාරාජා චිත්තරන්ජන් පුටේ නම් සේවකයාට බැන වැදුණු විට “මම මොනවා කරන්නද අවසර, රජින මට අණ දීලා තියෙන්නේ දවසම බිපින් බාබු බලාගන්න කියලා” යැයි ඔහු පැවසුවේ ය.

මෙයින් කෝපයට පත් මහාරාජා “පුහ්! බිපින් බාබු රජෙක් කියලා දැන් නේ මං දන්නේ! ඇයි ඌට උගේ පිඟන් තනියම හෝදාගන්න බැරිද?” යැයි කෑ ගැසීය. මින් අනතුරුව සේවකයා තම ස්වාමියාගේ අණ පිළිපදින්නට පටන් ගත් බැවින් බිපින් නැවතත් පෙර සේම අසරණභාවයට පත් විය.

දැන් දැන් බිපින් ගේ ගීතවලට රජින ප්‍රිය කළා ය. ඇයට ඒවා බෙහෙවින්ම මිහිරි වූ අතර ඈ ඒවායේ කිසි දොසක් නොදැක්කාය. හවස්වරුවල දී ඇගේ සැමියා බිපින් සමඟ මිහිරි සංගීතය ගැන සාකච්ඡා කරද්දී ඈ යාබද කාමරයක පැලල්ලක පසුපස සිට ඊට සවන් දුන්නාය. වැඩි කල් ගත වීමට මත්තෙන් මහාරාජා නැවතත් නියමිත වෙලාවට ආහාර ගැනීමත්, නින්දට යාමත් පුරුදු පුහුණු කරන්නට විය. සංගීත සාද අවසන් වූ අතර රජමාළිගාවට බිපින් ගේ සේවාව තවදුරටත් අනවශ්‍ය විය.

මහාරාජා චිත්තරන්ජන් සාමාන්‍යයෙන් මධ්‍යහ්නය දක්වා රජමාළිගයෙන් බැහැරව තම ඉඩකඩම් පාලන කටයුතු සිදුකළේය. දිනක් ඔහු වේලාසනින් ආපිට පැමිණ මාලිගාවේ කාන්තාවන්ගේ කොටසට යද්දී තම රජින යමක් කියවමින් සිටිනු දුටුවේය. ඒ කුමක්දැයි ඔහු ඇසූ විට ඇය තරමක් පසුබානු පෙනුනත් ඉනික්බිති කීවේ “මං මේ බිපින් බාබු ගේ සින්දු පොතෙන් සින්දු කීපයක් කියෙව්වා, ඔයාගේ සංගීත විනෝදාංශය නවත්තලා දැම්මාට පස්සේ අපිට ඉතින් සංගීතය අහන්න ඉඩක් නැති වෙලාම ගියා නේ.”

සංගීතය නම් විනෝදාංශය තම සැමියාගේ මනසින් මකා දැමීමට වෙහෙස වූයේ තමන් බව ඇයට ඒ මොහොතේ අමතක වූවා වැනි විය.

ඊට පසු දින මහාරාජා චිත්තරන්ජන් විසින් බිපින් තම නාට්‍ය කණ්ඩායමෙන් නිර්දය ලෙස ඉවත් කරනු ලැබුවේ ඒ අහිංසකයාට මින් මතුවට කෑම වේලක්වත් ලැබෙන්නේ කෙලෙසදැයි නොසිතමිනි.


බිපින්ට වැඩියත්ම ශෝකයක් දැනුණේ තමන්ව මෙලෙස සේවයෙන් පහකිරීම නිසා නොවේ. ඔහු මහාරාජාට සේවය කළේ මුදලට නොව අවංක භක්තිමත් බැඳීමකිනි. මහාරාජාගේ මේ හදිසි වෙනස්වීම ඔහුට වටහා ගැනීමට නොහැකි විය.

“මේ දෛවය තමයි, දෛවය තමයි!” ඔහු තමාටම කියාගත්තේය. ඉනික්බිති ඔහු බරැති සුසුමක් හෙලා, තම පරණ ගිටාරය එහි ආවරණයේ හොවාගෙන, තමන් සතුව ඉතිරිව තිබුණු කාසි දෙක පුටේට සමුගැනීමේ තෑග්ගක් සේ පිරිනමා, තමන්ට එකදු මිතුරෙකු වත් නොමැති විසල් ලෝකය වෙත පිය නැගුවේය.

**- පරිවර්තනය: හෙල්මලී ගුණතිලක**

[helmalie999@yahoo.com]

# ජේසු උපතේ අරුත සමරමු



හිරු සඳු තාරුකා කැල සතුටින් පිනවා
ඉම්හිරි විහඟ ගී නුබ ගැබ මත ලෙලවා
“රෝගින්”, “පුලන්නන්” හැමගෙම සිත් නලවා
සාමයෙ කුමරු ඉපදුන දින ළඟ එනවා

එළියක් නොමැති පිරිසිදු වාතයක් නැති
“මල, මූ” සමග බැටළුවො රැල ලගින නිති
ගව මඩුවකට සුරකුමරියො එළිය දෙති
පාපෙන් අපව ගලවන්නට බිළිඳු එති

දරුවන් පිනවන්නෙ අද නත්තල් සීයා
ඇති හැකි ලෙසට බොහො අය තෑගි ද දේයා
“සාමයෙ කුමරු” පිලිබඳ නැති ලෙස සේයා
අද “ගව ලෙනට” නැත පෙර ලෙස තරු පායා

බෙදමින් තෑගි නත්තල් ගස් හදාගෙන
කා බී නටති ගී ගය ගය හිනා එන
ජේසුගෙ උපත “ගව ලෙන” තුල එදා දින
පෙන් වූ අරුත අද අමතක වෙලා මෙන

සමිඳුන් අපට එවූ උතුමාණන් සිතුවේ
“රෝගින්”, “පුලන්නන්” ගැන බව දත යුතුවේ
නැති බැරි දිළිඳු පිරිවර දස අත මතුවේ
උන් ගැන නොහිත අද අපි මොනවද පැතුවේ?

දුප්පත් නිසා හෝ ආදායමක් නැති
පාසල් යන නොයන පොඩි දූ දරුවො ඇති
පිරිසක් සිටිති මවුබිම තුල හඬන නිති
යවමුද තෑගි පුදමින් සමිඳුනට තුති

දිවියම කැපකරන් දැඩි වේදනාවෙන්
මියගිය කුමරු නොම යට කොට හිනාවෙන්
නැති-බැරි දිළිඳු පිරිවර වෙත දයාවෙන්
ජේසුගෙ උපත සමරමු කල්පනාවෙන්

**- ආනන්ද ගුණතිලක** [a.gunatilake@hotmail.com]

# සමිඳුනි

නිවාරණය අත්හැරීම
අනියත බව සමිඳේ
මවා නොදැක සිත ඇතුලේ
දෝලනයේ කිමිදේ
ආශාවේ තිමිර පටල දඟර ගැසී විහිදේ
කරනම් ගසනා රන්පත් මනුදම් බිඳ පැද්දේ

වනපෙත බිඳ ආරාමය
සිංහරාජ කන්දේ
තුරු පත් දිය උල්පත් සිඳ
කුරුළු කඳුළු විද්දේ
මින් රළ, දියබරි ගෙම්බන් වඳ වී යන බැද්දේ
සිමෙන්ති කනු උඩ නැගෙනා ආරාමේ සද්දේ

පිඬු සිඟනා සිත දමනා
භාව වේග සිඳිනා
දමක පහස ජන හදකට
සන්සුන් සංයමිනා
හමන සුළං මද නළ පිරි වන පෙත් බිම හෙලනා
සමිඳුනි අනියතය දකිමි දාහය පෙණ දමනා



**- ඩී. අමරසිරි ගුණවර්ධන**

[amarasiridg@gmail.com]




# තැක්න්ස් හරිනී

හීන් පොදයක්!
ග්‍රීෂ්ම උදයක් උනාට රස්නෙ අඩු වෙලාවක්
වටයක් දෙකක් ඇවිදින්නත් ශෝක්.
බාධාවකින් තොරව මනෝපාරක් දාගෙන යන්නත් පුලුවනි!

වැඩුණු බඩ හෙවත් නෙරා ඇති උදරය
කොච්චරවත් මට්ටු කරන්න බැරි උදරය
මට්ටු කරන්න තියෙන හොඳම මඟක් නෙහ්,
ඇවිදිල්ල, ඇවිදිල්ල?
චූලෝදර, මහෝදර, ආදර,
"දර" වරින් ඉවර වෙන වචන
එතකොට කරදර?
ඔව් ජීවත් පොදි, පොදි ගෝනි ගෝනි පිටින්
එනකොට එන්නේ
වැස්ස ගංවතුර, වගා හානි, මාර්ග විනාසවීම
දුප්පතුන්ගේ ජීවිත නැති බංගස්තාන කරගෙන
දෙගොඩතලා යන්නේ.

මෑතක් වනතෙක්ම අපි ජීවත්වන ගමේ
කැන්ගරුවන් බලමින්, ගෙඹි රෑහැයි නද අසමින්
පාලුවට ව්‍යායාමයට ඇවිදින ස්වභාවික පරිසර කොටසේ
පාර දෙපස අව්ව තපින ලෝකෙම්ම දාර විස නයි
කාලෙකින් දැක්කෙ නෑ.
උන් නැතුවත් පාළුයි.
උන් දැක්කම එන කඩාගෙන දුවන්න හිතෙන හිතිවිල්ල
සමග එන ඒ ඇඩ්‍රිනලීන් පාර ඕනේ ඇඟට ඉඳලා හිටලාවත්.

නොවැම්බර, ඉල්, වීර මාසේ,
උතුරේ වේවා දකුණේ වේවා
මලවුන් සමරන්න බාධාවක් තියෙන්න බෑ!

ඒ අස්සෙ නොගැලපෙන එකෙක්, වංසෙන් වීරයෙක්
ජාතිවාදෙ අවුලන්න තවමත් තවමත් ට්‍රයි එක.
ආනන්ද (විජේපාල)ය සර්පයා දුටුවේ ද?

22 අරගලයේ ප්‍රතිබිම්බය
පාර්ලිමේන්තු වැඩැම්මූ 24 ත් ඉවර වේගෙන යන්නේ.
25 අලුත් බලාපොරොත්තු!

අලුත් ආණ්ඩු.
ඇමරිකාවෙත් ලංකාවෙත්.
ට්‍රම්ගෙ නඩු අහන්න බෑ ලු,
ඇමරිකන් මහාධිකරණය කියනෝ,
ජනපතිනේ.
නඩු ටිකෙන් බේරෙන්න ජනපති උනාද, ගෝට්‍රම්ප්ච්චී?

නත්තල ළඟයි.
ගාසාවටත් නත්තල්,
කුඩු කරල විනාශ කරලා ඉවරවෙලා
නෙත්නයාහුයි, හිස්බුල්ලායි ගිවිසුමකට ඇවිල්ලා.
අප්‍රමාණ අහිංසක ජීවිත, දේපල විනාසය
පයිසෙකට මායිම් නොකර.
නත්තලට බඩු ටික විකුණගන්න ඕන ඇති.
බිස්නස්කාරයින් කියන්න ඇති
පොඩ්ඩක් නවත්තපියව් කියලා.

කස්ටියකට විතරයි
මානව අයිතිවාසිකම් උල්ලංඝනය බැරි!
කට්ටියකට පුලුවන්.

පුටින්ල නත්තල සමරන්නෙ
ටිකක් පරක්කු වෙලා orthodox නේ.
එතකොට මොකක් හරි ගිවිසුමක් එයි.
උන්ගේ බඩු ටික විකුණගන්න විරාමයක්.

අරගලයට පහරදෙන්න සංවිධානය කළ
සේනාවලට මත් ද්‍රව්‍ය පොවලා
ආවේස කරලා උමතු කරලා
ගන්න තැනක් වෙනුවට
අද අගමැති අරලිය ගහ නිවස්නය
සාහිත්‍යය තැගි දෙන තැනක් බවට පත්වෙලා
සැබෑ වෙනසක්.

තැන්ක්ස් හරිනී...!!!

**- නිහාල් රූපසිංහ**
[nihal.rupasinghe07@gmail.com]

# සිසිල කෙටිකතාව

## බණ්ඩා මාමා

**ශ්‍රීමතී ගනේවත්ත**



වැඩිපුර දින කීපයක නිවාඩුවක් ලැබුන බැවින් ගමට යා යුතු යයි සිතූ මම පසුදින උදෙන්ම යාමට තීරණය කලෙමි. අවශ්‍ය කලමනා සකස්කරගත් මම උදේ පහට පමණ පිටත්වන බසයෙන් යෑම සඳහා නවාතැනින් පිටත්වීමි.

උදේ නමය පමණ වනවිට පන්විලට ළඟාවීමට හැකිවුව ද එතැන් සිට තවත් කිලෝමීටර තුනක් පමණ තවත් බසයකින් යා යුතු විය. අමතරව ගම්සභා පාර දිගේ කිලෝමීටර භාගයක් පමණ ගිය විටයි ගමන අවසන් වනුයේ.

පෙර මෙතරම් දුරක් ගෙවා ගිය ද අලුත් පාලමක් ඉදිකොට තිබීම නිසා පන්විල සිට විනාඩි තිහකින් පමණ ගෙදරට ළඟාවිය හැකි බව චූටි නංගී එවූ ලිපියක දන්වා තිබුණි. ගමට පාලමක් ලැබීම ගැන ඇය ඉමහත් සතුටකින් සිටින බව මට හැඟුණි.

බසයෙන් බැසගත් විගස මා දුටුවේ අමුතුම පරිසරයකි. ගඟ දෙපස තිබූ විශාල කැලෑ රොද කපා එලිපෙහෙලි කර තිබුණි. ඒ අතර කුඩා කඩ කීපයක් හා බාබර් සාප්පුවක් ද දක්නට ලැබුණි. අප කුඩාකල කුරුලු කූඩු සෙවීමට රිංගූ බෝවිටියා, මාදං, කිරිල්ල, එරමිණියා ආදී පඳුරු කිසිවක් දක්නට නොවූ අතර, මගේ හද කම්පාකරවන සිදුවීමක් වූයේ අප කුඩා කල පාසල් යාමට පැමිණි තොටුපලේවූ විශාල රඹුටන් ගස කපා දමා තිබීමයි.

කෙසේ නමුත් විනාඩි කීපයකින් මට ගෙදරට ඒමට හැකිවිය.

ඈත දී ම මා එනු දුටු චූටි නංගී, “හානේ, පොඩී නොකියාම ආව නේද?” කියමින් මා අත වූ ගමන් බෑගය අතට ගත්තාය.

“කෝ චූටි අම්මලා?” මම ඉස්තෝප්පුවේ කාමරයට ඇතුල්වීමි.

“ඔක්කොම පන්සලට ගියා. පෝයට ශීල ව්‍යාපාරයක් පවත්වනවා. දන්සැලක් හා තොරණකුත් තියෙනවා. අයියා ආව එකත් හොඳයි. ලොකු හාමුදුරුවෝ අයියා ගැන අම්මාගෙන් අහල තිබුනා,” නංගී තොරතෝංචියක් නැතිව කියවයි.

සැනෙකින් කුස්සියට දුව ගිය ඇය ඉඟුරු දැමූ තේ කෝප්පයක් මා වෙත පිළිගැන්වූවාය.

“මොනවද චූටි ගමේ අලුත් තොරතුරු?” මම ඇසීමි.

“අලුත් පාලම ලැබුන එක ලොකු දෙයක්. දැන් අපිට ටවුමට යන්න හුඟක් පහසුයි. නැත්නම් වරුවක් ගතවෙනවනේ ඔරුව මෙගොඩට එනකම්,” නංගී කීවාය.

“හැබෑට, දැන් කොහොමද බණ්ඩා මාමා?”

“පාලම නිසා බණ්ඩා මාමට රස්සාව නැතිවුණා නෙ. පව්! බණ්ඩා මාමා පහුගිය කාලෙ අසනීපවුණා. තුනටියේ අමාරුවක් හැදිල මඩුල්කැලේ ඉස්පිරිතාලෙ මාස දෙකක් විතර හිටිය. හරියට සනීපයක් නෑ. දැන් නම් ගෙදර ඇවිත් ඉන්නවා. සුමනාවතී අක්ක තමයි සාත්තු කරන්නෙ. ජයපාල අයිය පාලම ළඟ කඩයක් දාගෙන. එයාට නම් දැන් සරුයි. ඒ උනත් සුමනාවතී අක්කයි, විජේ අයියයි තමා බණ්ඩා මාමගෙ දුක සැප බලන්නෙ.”

මට බණ්ඩා මාමා ගැන විශාල කනගාටුවක් ඇතිවිය. අප කුඩා කොල්ලන් අවදියේ පාසැල් ගියේ බණ්ඩා මාමගෙ ඔරුවෙන් එගොඩ වී ය. දඟකාර වයසේ බණ්ඩා මාමා සමඟ ගතකල කාලය ජීවිතයේ අමතක නොවන සිදුවීම් රැසක් අදත් මතකයේ රැඳී ඇත.

උදෙන්ම තොටුපල වෙත යන ඔහු එහි වූ විශාල රඹුටන් ගසේ බැඳ දැමූ කඹය ගලවා ඔරුව දියඹට ගනියි. අනතුරුව හොඳින් සකස් කර ගත් බුලත්විට කටේ රුවා ගනියි. ඉන් පසුවයි ඔහුගෙ රාජකාරිය අරඹන්නේ.

දිනකට කීප වාරයක් පිරිස එගොඩ මෙගොඩ රැගෙන යන ඔහු, අප පාසැල් යන එන වෙලාවට වෙනත් කිසිවකු ඔරුවට නංවා ගන්නේ නැත. අපේ දඟකාරකම් දන්නා ඔහු, එගොඩ වන තුරු තද නීති මාලාවකට යටත්කොට ආරක්ෂා සහිතව අපව එගොඩට ගෙනයයි.

උදේ රාජකාරිය දහය පමණ වනවිට අවසන් කරන ඔහු, එමලි නැන්දා සකස් කර දුන් රොටියක් හෝ වෙනත් යමක්

කෑමට ගෙන සූදානම් වන්නේ ලොකු බුලත් විටක් සකසා ගැනීමටයි.

ඔහුට එමලි නැන්දා හමුවීම ද අපට අමතක නොවන රසවත් කතන්දරයකි.

සති කීපයකට වරක් තමා විසින් වියන ලද පැදුරු කීපයක් විකිනීම සඳහා පොලට ගෙන යාම ඇයගේ පුරුද්දකි. ඉන් ලැබෙන සොච්චම් මුදල ඇය තම ගෙදර අඩුපාඩු සඳහා පිරිමැස්මෙන් වියදම් කරන්නීය.

දිනක් මෙසේ ගෙන යන පැදුරු මිටිය ගඟට වැටී ඇත. වේගයෙන් ඔරුව පැදගෙන ගිය බණ්ඩා මාමා පිරිසව එගොඩට ඇරලවා යාර කීපයක් පමණ පාවී ගිය පැදුරු මිටිය රැගෙන නැවත ආ බව පවසන්නේ මහත් උජාරුවෙනි.

පසුව රටා දමා හොඳින් වියන ලද පැදුරක් එමලි නැන්දා ඔහුට තෑගි කල බව ද, අනතුරුව ඇතිවූ හිතවත්කම උඩ ඔහු ඇයව තම නිවසට කැඳවා ගෙන ආ බවද පවසන්නේ සතුටිනි. "එමලි කඩිසර ගෑනි," ඔහු නිතර කී දෙයකි.

මෙසේ සිතුවිලි දමක පැටලී සිටි මට බණ්ඩා මාමා දැකීමට තද ආශාවක් ඇතිවිය.

"දොලට ගිහින් නා ගෙන එන්නම්," කියූ මම බණ්ඩා මාමා බැලීමට යන බව පවසා එළියට බසිත්ම නංගී තුවායක් හා සබන් කැටයක් මා අත තැබුවාය.

මා යනවිට බණ්ඩා මාමා මිදුලේ තිබුන කපන ලද රබර් ගසක කොටයක් මත වාඩිවී බුලත් විටක් හපමින් සිටියේය. ඔහුගේ දෑසේ පෙනීම අඩුවී තිබුන බව පෙනුනේ එකවිටම මා හඳුනා ගත නොහැකිවූ බැවිණි.

මා තොරතුරු පැවසූ විගස ඔහුනැගිට මාගේ දෑත් අල්ලාගෙන, "අනේ මේ අපේ පොඩිමහත්තයා නේද? මහත්තයා දැන් කොලඹට ම වෙලා නේ," යැයි පැවසීය.

"නෑ මාමෙ නිවාඩුවට ගමේ එනවා," මම ගෙන ගිය පාර්සලය ඔහු අත තැබීමි. පිං දීමෙන් එය අතට ගත් ඔහු ගමේ තොරතුරු කියවන්නට විය.

"මහත්තයෝ, ගමට පාලමක් ලැබුනනේ. ඒක ලොකු දෙයක්. මමත් පහුගිය කාලෙ තුනටිය අමාරුවක් හැදිල ඉස්පිරිතාලෙ හිටිය. තාම හරියකට සනීපයක් නෑ. එමලි හදිසියේ ලෙඩවෙලා නැතිවුණා. මගෙ ජීවිතේ කොටසක් නැතිවුණා වගේ. පොඩි කෙලී සුමනාවතී තමා මගේ දුක සැප බලන්නේ. මටත් දැන් වැඩක් පලක් කරන්න හයියක් නෑ. කීයක්වත් හොයාගන්න මඟක් නැතිවුණා. ලොකු පුතා පාලම ලඟ කඩයක් පටන් ගත්තා. එයාට නම් හොඳයි."

"හැබෑට කෝ මාමෙ ඔරුව?"

ඔහු තුනටියට අත තබාගෙන සෙමින් සෙමින් ගේ පසුපසට ගමන්කළේය. ඔහුගේ දුර්වලව පැවති දෑත් හා දෙපා දුටු මට සිහියට ආවේ තොටියෙකු ලෙස ගත කල කාලයේ ඔහු තුල තිබූ ජවය හා එඩිතර බව මෙතරම් ඉක්මනින් පලා ගියේ කෙසේද යන්නයි. ගේ පිටුපසට ගිය ඔහු මඩුවක දමා ඇති ඔරුව පෙන්වා දිග සුසුමක් හෙළීය.

"මේක මට දරුවෙක් වගේ," ඔහු ඔරු කඳට අත තැබීය.

ඔරු කඳ දිරාපත් වෙමින් පැවති අතර තැනින් තැන විශාල සිදුරු කීපයක් ද දක්නට ලැබුණි. හබල ද, වේයන්ගේ වාසභූමියක්ව මඩුව අසල විය. බණ්ඩා මාමගේ ජීවිතයත් මෙසේම නොවේදැයි මට සිතුණි.

මා ආපසු හැරී යනතුරුම ඔහු ඔරුව දෙස දුක්මුසු ලීලාවෙන් බලා සිටිනු මම දුටුවෙමි.

**- ශ්‍රීමතී ගනේවත්ත**

[hectorjayawardhana@gmail.com]

## ඝඨල ප්‍රහේළිකාව - නොවැම්බර් 2024 විසඳුම

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 කු | ප් | 2 පි | | 3 ත | නි | 4 යා | | 5 පො | ල් | 6 ව | තු | 7 ර |
| මු | | න් | | ර | | ල | | රො | | හ | | න් |
| 8 දු | ර් | ව | ර් | ණ | | | 9 ඔ | න් | චි | ල් | ලා | ව |
| කු | | න් | | ය | | 10 ස | | දු | | වෙ | | න් |
| 11 සු | ර | ත | ලී | | 12 වි | ත | | ව | | 13 ළ | මා | |
| ම් | | | | 14 සා | | ත | | | | දා | | |
| | 15 ව | 16 ස | ව | ර් | ති | | 17 ග | 18 ම | න් | ම | ලු | |
| | | ර | | | | 19 ක | | ස් | | | | 20 ඉ |
| | 21 ව | ත් | ක | 22 ම | | 23 රු | දා | | 24 සැ | 25 ක | රි | න් |
| 26 අ | | නො | | ගු | | ව | | 27 ධ | | පු | | ධ |
| 28 ප | හ | න් | දැ | ල් | ල | | | 29 න | පු | රු | හී | න |
| හ | | සේ | | කැ | | 30 සි | | ප | | හා | | හ |
| 31 සු | ක් | කා | න | ම | | 32 වි | ත් | ති | | 33 මි | ගෙ | ල් |

# හීනයෙන් යථාර්ථයට



ඇගේ අත සිනිඳු යි
ඇය සුකෝමල යි
හා බැඳෙන ප්‍රේමය
සුන්දර යි මනෝරම්‍ය යි
යෞවනේ නිදි නැති රෑ
ඇරුණු දෑසට පෙනෙන
එක ම එක හීනය යි

තනිවෙමු ද අපි අපේ ලෝකේ
සොඳුරු නොම වේ ද සොඳුරිය?
ඒ ස්පර්ශ සත්‍යය
දිවා රෑ පේන හීනෙට වඩා

සැබෑවුණු හීනේ පෙරයම
පසුකරන් සනඳුරු රැයක්
ප්‍රේමාලෝකයෙන් අඳුර අඩ වුණු
කුටුම්භය කැරකේ
අටලෝ දම් සකේ
දුක සැප ද පෙරලේ
කාල යකු පෙරමගේ

අට ලෝ දම් සකේ
පෙරළිය ද දැන් හිතුමතේ
වැඩිය නවතින්නේ
දුක තියෙන පැත්තේ

ඇගේ අර සිනිඳු අත
දැන් රළු ය කටු ද ඇත
නිතර අත ඇති කටු
රැගෙන එයි නිදි යානට ද
මනෝරම්‍ය නෑ
දෑස් පිය වෙන යාන
ඇත්තට ම පේන හීන

**- චන්ද්‍රවංශ ඥාණසේකර**
cguoc.gnana@yahoo.co.uk

# කලාකරුවා යනු?



පොදුය හැඟීම් සහ සුංගාරය
බේද නොමැතිව කාට කාටත්
විඳිති එකිනෙකා රිසි සේ
එක එක අනුගතයෙ පිහිටා
උන් හිතන පතනා'වු අයුරින්
සංවරව හෝ අසංවර පරිදි ද

දුවති සමහරු කම් සැපම පස්සේ
සම්මතයේ ද වැට මායිම් පනිමින්
කරමින් තවෙකෙකුට අනර්ථය ද
බිඳිමින් සදාචාරය සහ විනය ද
සුංගාරයට අරුතක් ගලපා

තදකර, සිරකර සේම ගුලිකර
සඟවාගනිති සමහරුන්
මෝරනු නොදී සුංගාර දළු
යොමුවී පිනට මෙන් දහමට
යෙදෙමින් නිරන්තර ශීලයේ
වනපොත් වඩා බණපොත්

ලියමින් කවියක්, කතාවක්, ගීතයක්
ගයමින් ගීතයන් හෝ කවියක්,
අඳිමින් සිතුවමක් දී හැඩයක්
සතපාගනිති සුංගාර රස
සොඳුරු සබැඳියන් කොටහක්
නොදී මුදලට උන් ආත්මය
දකිමින් නිරයේ ද සොඳුරු බව...

උන් ය කලාකරුවෝ කුලකය.

- **රංජිත් කිරිඇල්ල** [ran.kiri60@gmail.com]



## සරතයේ පිපුණු මල



සරතයේ ගිණි වැදුණු පොළොවේ
අපේ සුවඳට මලක් පිපුණා
වැටී වැටී නැගිටිනා හීනෙට
පල දරන්නට මලක් පිපුණා

එමල බිඳ ගිණි ගසා නැසුමට
උයන්පල්ලන් රංචු ගැසුණා
වරෙන් රොද බැඳ එය රකින්නට
අපේ හීනෙට හෙටක් පෙනුණා

උයන් පල්ලන් රැගෙන ගිනි අවි
එකට අත් බැඳ ගනීවී
පිපුන මල පොඩි කරදමන්නට
උංගෙ මැර බල යොදා වී

හොරා කෑ රන් කාසි උඩ පැන
ලංසු දී මොර ගසා වී
උඹේ ළඟ රැඳි උංගෙ මොණරුන්
උඹේ සිත් බිඳ දමා වී

**- අසංක ඉරාජ් ලක්නාථ** [laknatha@laknatha.com]

## හුදකලා මහ ගෙදර



තබා ඇකයේ හැදූ දරුවන්
සොයා ගොස් ලෝකය ම
මහගෙදර බිත්ති අතරේ
තනිව වැලපේ මව්පියන්
හුදකලා වූ මහගෙදර

ගලා කිරි සුවඳ ගෙපැලේ
කෙළි කවට කම් ද පිරිලා
සිටිය හැටි තුරුලුව ඇකේ
සුසුම්ලයි සිහි වී පෙමින්

පියෙන් පිය තබා ඉහළට
යන කලට දරුවෝ සෙමින්
බලා රහසින් කඳුළු සැඟවූ
මව්පියන් අද කඳුල සමඟින්

**- අමිතා පද්මකුමාරි**
[amithapadamakumari@gmail.com]

## ඔබේ කවියේ මා

සිතක හැඟුමන් අහස් ගැබ පුරවා
වළාකැටියක කවි වැලක් අමුණා
බලා හිඳින්නම්

සුළං රැල්ලක පාවි පාවී
සිහිල් සීතල හිරිපොදක් සේ
ඔබේ කවියක නතර වෙන්නම්



මුදු වදනක් වෙන්නම්
කවියක,
නොලියූ රස වෙන්නම්

සුළං රැල්ලක පාවී පාවී
වළා කැටියක ඇමිණූ කවියක
සැඟවූ රස වෙන්නම්

**- ඉන්දිකා තිලකුමාර** [ithilakumara@yahoo.com]

# කවුද මම?



ඇති ද “මම” කියා, නැතිද “මම” කියා
ඇත පැණයක් නිරන්තර
සම්මතයේ “මම” ඇත
මුලා වූ සිත දනී නිරන්තර
එනමුදු යතාර්ථයෙදී කවුද “මම”?

ඇත වෙනස්වන රූපයක් “මම” නමින්
සමග සසලවන සුළඟක් වැනි සිතක්
ලබා දෙන්නට රූපයට ප්‍රාණයක්

වෙනස් වේ සිත නිබද
වෙනස් වේ රූපය ඒ සමග
ක්‍රියාවලියක් පමණක් ඇත “මම” තුළ
නුවණැති සිත දනී
මෙය නිරන්තර
යතාර්ථයේ “මම” පවතී
ක්‍රියාවලියක් තුළ නිරන්තර
“මම” ඇති ද නැත
“මම” නැති ද ඇත

වෙනස් වේ නම් නිරතුරු
සතුකළ හැකි ද මගේ රූපය මාහට
විමසයි නුවණැති සිත නිරතුරු
ප්‍රඥාව මෙය බව දනී පණ්ඩිත

- **කළණ දිසානායක** [kalanadsl@gmail.com]



# නැවතෙමු එක මොහොතක්?



මල් පිපෙන්නේ නැතිනම්, කොයිද මේ හැටි සිරියක්
හිම වැටෙන්නේ නැතිනම්, කොයිද මේ හැටි සිසිලක්
ඇහැ කොනින් බලනට බැරිනම්
කිම දකින්නේ හැඩයක්?
හැඩය අරුමැසි වෙනසක්!

සරු පසක් හිමි නැතිනම්, කිම හැදෙන්නේ පලවැල්
හිරු එළිය දැක නැතිනම්, කිම දිලෙන්නේ දල්ලක්
රැය විඳින්නට බැරිනම්
කිම දකින්නේ තරුමල්
රටාවකි ඒ වියමන්!

හැඩ මවන්නට බැරිනම්, හැඩවේද හඳ මෙතරම්?
තනි රකින්නට බැරිනම්, හිත බැදේවිද මෙතරම්
එසිත රඳනට බැරිනම්,
සතුට දෙනවද පහසක්
ලබැදි සුවයක හැඩයක්

ඉවසලා ඉන්නට බැරිනම්, විසිරේ ද හැගුමන් මෙතරම්?
කලබලය අඩු නැත්නම්, පෙනේවි ද සිරි මෙතරම්?
හති හලා දුවන මේ ලෝකෙන්
නැවතෙමු ද අනේ අපි පොඩ්ඩක්
නැවතිලා ඉමු ද එක මොහොතක්?

- **අනුරුද්ධ වැලිගමගේ** [anuruddhawe@yahoo.com]

# මා හිරු, මා සඳු



සිහිනයක් දෝ හදෙහි රැන්ඳූ
සිත්තමක් දෝ අහසේ දිස්වූ
සුමිහිරි ම රස මිහිර කැන්දූ
සුගැයුමක් දෝ සුසර නැංවූ

හොවා පපුතුර සෙනෙහෙ කැන්දූ
ඔසවා තරුවක වරුවක් ඉන්දූ
සැළමුතු පෙමකට මහ ඇඳුරින්දූ
සිරිමත් සිනි දස සිහ කෙසරින්ඳූ

- **ඉන්දිකා තිලකුමාර** [ithilakumara@yahoo.com]



# ජෙස්තරයගෙ කතන්දර

-විදූෂක

## ලෝ කට් බ්ලවුස් හෙවත් පෙන්නීම සහ හැංගීම



ඇත්තම කියන්නම්. මේ සටහන පළ කරන්න ඕනැයි කියල හිතුන වෙලේ ඉඳලම මගේ හිතේ වැඩ කළේ මේක ලියන්න ඕනැ කොහොමද කියන එකට වැඩිය, මේක එක්ක දාන පින්තූරය මොකක්ද කියන එකයි.

ඉන්ටර්නෙට් එකේ නං මේකට අවශ්‍ය පින්තූර ඕනැ පදං තියෙනව. ඒත් ඉතිං බහු ජන හිතාය, බහු ජන සුඛාය කියල හිතල ආටිෆිෂල් ඉන්ටලිජන්ස් ඇන්ජිමකින් රූසටහනක් ඇඳ ගත්තා.

දැං අද කතන්දරේ ට යමුකෝ.

පහුගිය දවස්වල ජනප්‍රිය වූ බණක් ආව මතකයි නේද අර කෂඩ කතා කියන කොළඹ ඉන්නා කහකඩයක් පොරවාගෙන ඉන්න එකෙකු ගේ? මං දැක්ක ඒක යූ ටියුබ් එකෙත් තියෙනවා.

ඒකෙ තිබුණ එක සොමි කැල්ලක් තමා අර කෙල්ලො අඳින ඇඳුම් ගැන තියෙන උඩත් ඒ.සී., යටත් ඒ.සී., සායෙ දෙපැත්තෙන්ම පලල එතන ඩබල් ඒ.සී. කියන එක.

ඇත්තම කියමු. තමන්ට කැමති ඇඳුම අඳින්න තමන්ට අයිතියක් තියෙන්න ඕනැ. මයි කාර්, මයි පැට්‍රොල්.

අපි කාගෙ කාගෙත් අකමැත්තක් නෑ, ඕනැ කෙල්ලෙක් ඕනැ ඇඳුමක් ඇඳන් ඕනැ තැනක ගියාට. හැබැයි, ඒ අපේ නංගි හරි, දුව හරි නං, ඒක වෙනනම විසඳගන්න ඕනැ කාරණාවක් නේද ලෝකල් තලේබාන්වරුනි?

ප්‍රශ්ණෙ මේකයි.

අපි හිතමු කෙල්ලෙක් ලෝ කට් බ්ලවුස් එකක් ඇඳන් යනව කියල තමන්ට ඕනැ විදියට. මේ තැනැත්ති හොඳට පුද්ගලික වත්කම් තියෙන කෙනෙක් නම්, ඔන්න උඩින් බලන කොට ළය මඩලේ සුන්දර දැක්මක් ලැබෙන එක වලක්වන්න බෑ. මූණ දිහා කෙලින් බලාගෙන කතාකරන කොට වුනත් අපේ ඇස් දෙක ක්ෂණයකට වත් ඒ පැත්තට දුවන එක වලක්වගන්න පුදුමාකාර වෙහෙසක් වෙන්න ඕනැ.

නමුත් ඇයි ඒ වගේ අහක බලන්න මහන්සි වෙන්නෙ? වත්කම් හෙළිවෙන බව නොදැනයැ ඇඳන් යන්නෙ?

ඉතිං මේ සටහනට අනුභූතිය සැපයූ කතන්දරේ මේකයි.

ඔන්න කලකට ඉස්සර තිබුණා පොඩි සාදයක්. එකම ෆීල්ඩ් එකේ වැඩ කරන අය එකට එකතු වෙන. අපි එක්ක එකට ඉගෙන ගත්තු ගොඩ දෙනෙකුත් එතැනට එන බව දන්න නිසා ඔන්න මාත් ගියා.

ආප්ප පිච්චෙන කං කෝක් එකක් බීබී හිටපු මං දැක්ක, අපිත් එක්ක එක කාලෙ ඉගෙන ගත්තු ගීතිකා යි, ශමීන්ද්‍රාණි යි කතා කර කර ඉන්නව. හුඟ කාලෙකින් නෙ මේ දෙන්නව දැක්කෙ. මාත් එතනට ගියා හලෝ කියන්න.

ඉතිං අපි විනාඩි කිහිපයක් ආගිය තොරතුරු කතා කර කර හිටිය.

ශමීන්ද්‍රාණි ඇඳල හිටියෙ කළු පාට සිල්ක් බ්ලවුස් එකක් පපුවෙ මැද හරියට විතර වෙනකං පලපු. මේ වගෙ ඇඳුමක් ඇඳන් ඉන්න කෙනෙකුගෙන් සාමාන්‍යයෙන් ලැබෙන දර්ශනය එතන තිබුන මං දැක්ක.

සමහර විට මං ඒ බව තුන් හතර පාරක් විතර දකින්න ඇති!

වෙනත් වචන වලින් කියනව නං, මං උවමනාවෙන් ඒ දිහා බැලුවෙ නෑ. අනිමිසලෝචනයක් දැම්මෙත් නෑ. ඒ එක්කම, මගෙ ඉදිරියෙ තියෙන දර්ශනයෙන් මගෙ ඇස් වෑයමකින් අයින් කරගන්නත් මං අමුතු මහන්සියක් ගත්තෙ නෑ.

විනාඩියක් දෙකක් යනකොට මෙන්න බොලේ ශමීන්ද්‍රාණි හිම්හිට අර සුන්දර දර්ශනය තමන්ගෙ අතින් කවර් කළා! එක අතකින් එයාගෙ මාලෙ අල්ලමින් කතා කරන්න පටන් ගත්ත.

ඒකෙ අවුලක් මට ආවෙ නෑ.

ඊලගට උනේ මෙන්න මේකයි. ශමීන්ද්‍රාණි අතින් තමන්ගෙ ක්ලිවේජ් එක වහගන්න හැටි දැකපු ඒ ලඟින් හිටිය ගීතිකා එක පාරටම කලබල වෙලා අතින් එයා ඇඳන් හිටපු බ්ලවුස් එකේ කොලර් එක වහ ගත්ත.

මට ඇතිවුනේ ලැජ්ජාවටත් වැඩිය කේන්තියක්. හේතුව මේකයි. ගීතිකා ඇඳල හිටියෙ බෙල්ල ලඟටම උඩටම බොත්තං දාපු බ්ලවුස් එකක්.

ඒ කොහොම උනත්, සමාවෙන්න මෙහෙම කියනවට, ඒ පලාතෙ ඇස් යන විදියෙ කිසිම දෙයක් තිබුනෙත් නෑ.

ඇත්තම කියනව නං සමහර විට ගීතිකා කවදාවත් ලෝ කට් බ්ලවුස් අඳින කෙනෙකුත් නොවෙන්න හේතුව ඒකයි මං හිතන්නෙ.

මට හිතෙන විදියට පස් පව් කියන ඒව පව් වෙන්නෙ, අපි ඒව කළාම වෙනත් අයට ඒකෙන් අයහපතක් වෙන නිසයි. පර පණ නැසීම, හොරකම, කාමයේ වරදවා හැසිරීම, බොරු කීම කියන පව් හතර ඉතා පැහැදිලියි. මත් පැන් බීම වුනත් බීල සිත විකල් වෙලා අනුන්ට කරදරයක් වෙන දෙයක් නෙ.

ඒකයි පව. රට රට පොඩි ෂොට් එකක් දාලා නිදාගන්න එකෙන් නං වැඩි පවක් නෑ වගේ. රට වයින් බීපු ජේ.ආර් කාරය මේ ආත්මෙන් ම නිවන් යන්න සෙට් වුනේ ඒ හින්දනෙ.

ඉතිං මගේ තර්කය මේකයි. තමුන් කරන දෙයකින් අනුන්ට කරදරයක් වෙනව නං ඒක පාප ක්‍රියාවක්.

අර සොමි බණ කහකඩ මනුස්සයා කිව්ව වගේ ඩබල් ඒ.සී. දාල යන යන එන කොට අහල පහල ඉන්න සීලාචාර කොල්ලන්ට වැර වෑයමෙන් තමන්ගෙ ඇස් හසුරුවන්න කරදර වෙන්න වෙන එකත් මේ ආකාරයට වර්ග කරන්න බැරිද?

**- විදූෂක**





සිසිල සඟරාවේ පළ වී ඇති ලිපිවල බුද්ධිමය අයිතිය මෙන්ම සහ ඒවායේ අන්තර්ගතය පිළිබඳ වගකීම ද ඒ ඒ ලේඛකයා සතුවේ. මෙහි පළ වී ඇති ලිපිවලින් සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ අදහස් නිරූපණය නොවෙන බව කරුණාවෙන් සලකන්න.

The intellectual property of the articles published in Sisila magazine remains with the respective writers. Writers are also responsible for the content of the articles published under their names. Please note that articles published in Sisila do not represent the views of the Writers Guild of Sinhalese Cultural Forum of NSW Inc.



ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදය වෙනුවෙන් ග්ලෙන්මෝර් පාර්ක්හි පදිංචි රසික හරිශ්චන්ද්‍ර සූරියආරච්චි විසින් සංස්කරණය කර 2024 දෙසැම්බර් මස පළමුවෙනි දින ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ බෙදා හරින ලදී.

Edited and distributed by Rasika Harischandra Suriyaarachchi of Glenmore Park, New South Wales, Australia, on behalf of the Writers Guild of the Sinhalese Cultural Forum of NSW Inc, Australia on 1 December 2024.

නිව් සවුත් වේල්ස් හි සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ ප්‍රකාශනයකි

Sisila electronic magazine is published and distributed by the Writers Guild of Sinhalese Cultural Forum of NSW, Australia.

sisila.sangarawa@gmail.com sisilamagazine.blogspot.com ISSN: 2653-2182